ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



විශ්වාසයේ වසර අළලා සොළොස්වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා විසින් නිකුත් කළ අනුශාසනා පත්‍රයෙන්....

**විශ්වාසයේ දොරටුව** 3 පිටුව

6 වන අසිපා අන්තර්ජාතික සමුළුවෙන් ඔබ්බට ...

කුඩා කිතුනු සංඝ ආසියාතික සමුළුව - 2012 පිළිබඳව කැරෙන විමසුමකි. 8-9 පිටුව



අයාලේ යන සමහර ජනවන්දනා ක්‍රමවේදයන් පිළිබඳව කැරෙන විවරණයක්

**දේශානුරූපීකරණය හා කිතුදහම** 12 පිටුව



2010 වසරේ හොඳම ආගමික පුවත්පත

# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජුනි 07

ක්‍රි.ව. 2012 ක් වූ ඔක්තෝබර් 14 ඉරිදා 147 වෙළුම 20 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 25.00 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදී.

## මාධ්‍ය හමුවේදී ප්‍රගතිශීලි ගිහි, පැවිදි හඬ රැව්දේ!

# "පුංචි රෝමය" බේරාගනිමු

### කාදිනල් හිමිපාණෝ මීගමුවේ නූතන තත්ත්වය අනාවරණය කරති

හෙන්රි ප්‍රියශාන්ත මෙන්ඩිස් විසිනි

**රජය විටෙක මීගමුව සංචාරක පුරයක් ලෙස සංවර්ධනය කළ යුතු බව කියනවා. තවත් විටෙක ආයෝජන ප්‍රවර්ධන කලාපයට අනුයුක්ත කරන බව කියනවා. මීගමුවට අදාළ ඉදිරි සැලසුම් කුමක්දැයි අප මූලිකව දැන සිටිය යුතුයි. අපේ අදහස්, යෝජනා බලපෑම් සංවිධාන කර ගත යුත්තේ ඒ අනුව යැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කරති.**



මීගමුවේ නූතන තත්ත්වය අනාවරණය කරමින් අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මීගමුව, තම්මිට කාදිනල් කුරේ මධ්‍යස්ථානයේ පැවති මාධ්‍ය හමුවේ දී උන්වහන්සේ මේ බැව් පළ කළහ.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ කාදිනල් හිමිපාණෝ මෙසේ ද පැවසූහ. ආර්ථිකයේ අමානුෂික සහ නිසරු දේ අප ප්‍රතික්ෂේප කළ යුතුයි. ජාත්‍යන්තර ණය දෙන සංවිධානවල උවමනාවන්ට යට වී රට වැසියා ණය උගුලක හා සදාචාර විරෝධී ක්‍රියාවන්ට පොළඹවන සැලසුම් කතෝලික සභාව ප්‍රතික්ෂේප කරනවා.

15 පිටුවට ▶

## අති ගාම්භීරව විශ්වාසයේ වසර ප්‍රකාශයට පත් කැරේ

ටෙරී නුගේරා සහ මංගල ජයවර්ධන විසිනි

විශ්වාසයේ වසර තුළ සැදැහැවතුන් සිය විශ්වාසය වඩ වඩාත් ශක්තිමත් කරගනිමින් ඊට සාක්ෂි දරන්නට පෙළ ගැසෙනු ඇතැයි කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ ප්‍රකාශ කළහ. ඉකුත් ඉරිදා කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේ දී විශ්වාසයේ වසර ප්‍රකාශයට පත් කිරීමේ මෙහෙයේ දී උන්වහන්සේ මේ බැව් පැවසූහ. අගරදගුරු වසමේ දෙව්මැඳුරුවලද එදින විශ්වාසයේ වසර ප්‍රකාශයට පත් කැරුණු අතර ඒ නිමිත්තෙන් විවිධ වැඩසටහන් මේ වසර පුරා ක්‍රියාත්මක කිරීමට නියමිතය.



ගාල්ල රදගුරු අති උතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන් ගාල්ල ආසන දෙව්මැඳුරේදී පදවියේ පියතුමන් සමඟ විශ්වාසයේ වසර ප්‍රකාශයට පත් කළ අයුරු.

මේ අතර දෙවි මහෝත්තමයාණන් වහන්සේ කෙරේ ඇති අව්‍යාජ භක්ති ආදරයෙන් යුතුව, අතීතයේ අපේ මුතුන් මිත්තන්ගෙන් අපට උරුම වූ සත්‍ය විශ්වාසයේ මුල් යුගය යළි ජීවමාන කරමින්, වර්තමානයේ එම විශ්වාසයේ නිම් වළලු පුළුල් කිරීමේ අදිටනින්, භක්ත්‍යාදරය උපදවාගත් සිතින් යුතුව විශ්වාසයේ වසර ප්‍රකාශයට පත් කරන්නේ යැයි ගාල්ල රදගුරු අති උතුම් රේමන් වික්‍රමසිංහ හිමිපාණන් ප්‍රකාශ කළහ.

ගාලුපුර ජපමාල රාජේශ්වරි ආසන දෙව්මැඳුරේ වාර්ෂික මංගල්‍යය හා සමගාමීව ගාල්ල පදවියේ විශ්වාසයේ වසර ඉකුත් ඉරිදා ප්‍රකාශයට පත් කැරිණ.

## සයවැනි අන්තර්ජාතික අසිපා කුඩා කිතුනු සංඝ සමුළුව ශ්‍රී ලංකාවේදී

විශේෂයෙන් ආසියාතික කතෝලික සභාව තුළ, එම රටවල් අතර මීසම් මට්ටමෙන් ක්‍රියාත්මකව පවතින අසිපා කුඩා කිතුනු සංඝ ක්‍රමවේදයට අනුව පැවැත්වෙන අසිපා අන්තර්ජාතික සමුළුව, සෑම වසර තුනකට වරක් ආසියාවේ එක් රටක් තුළදී පුළුල් කිතුනු දැක්මක් ද ඇතිව, ඉතා උත්කර්ෂවත් අයුරින් පවත්වන අතර, මෙවර එම උතුම් අවස්ථාව ශ්‍රී ලංකාවට හිමිව ඇති බව අසිපා කුඩා කිතුනු සංඝ පිළිබඳ ජාතික අධ්‍යක්ෂ ගරු එරික් සී. ප්‍රනාන්දු පියතුමා ප්‍රදීපයට පැවසීය.

එම සමුළුව මෙම වසරේ ඔක්තෝබර් මස 18 දින සිට 24 දින දක්වා නයිනමඩම "චින්තන" මධ්‍යස්ථානයේ දී පැවැත්වීමට සියලු කටයුතු මේවන විටත් සූදානම් වෙමින් පවතින බවත්, එය නියෝජනය කිරීම සඳහා විශේෂයෙන් ආසියාතික මෙන්ම යුරෝපීය ජාතික ගිහි, පැවිදි පූජකතුමන් සමඟ රදගුරු හා අගරදගුරුතුමන් 103 පමණ පැමිණීමට නියමිත බවත් එතුමා වැඩිදුරටත් සඳහන් කරයි.

15 පිටුවට ▶

## දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් 24 වන අනුස්මරණය ඔක්තෝබර් 29 දා

සී. ආර්. ඩික්සන් ඇන්ටනි විසිනි

දේව සේවක තෝමස් කාදිනල් කුරේ නි.ම.නි. හිමිපාණන් ස්වර්ගස්ථවීමේ 24 වන අනුස්මරණ දිව්‍ය පූජාව ඔක්තෝබර් 29 සඳුදා උදේ 9.30 ට රාගම, තේවත්ත ලංකා අප ස්වාමිදූගේ ජාතික බැසිලිකා සිද්ධස්ථානයේ පැවැත්වීමට විධිවිධාන යොදා ඇත.

15 පිටුවට ▶

## සිංහල සාහිත්‍යය පිළිබඳ අවධානය යොමු කරද්දී කතෝලික ලකුණ එහි නොමැකෙන සලකුණක්

### බුද්ධශාසන හා ආගමික කටයුතු වැඩබලන අමාත්‍ය ඇම්. කේ. ඒ. ඩී. ඇස්. ගුණවර්ධන මහතා පවසයි

සේයා සටහන කුමාර ජයසිංහ විසිනි

සිංහල සාහිත්‍යය පිළිබඳව අවධානය යොමු කරද්දී කතෝලික ලකුණ එහි නොමැකෙන ලෙස සටහන් වී ඇතැයි බුද්ධශාසන හා ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ඇම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතා පැවසීය.

ඒ මහතා මේ බැව් පළ කළේ පසුගියදා ජාතික පදනම් ආයතනයේ දී පැවැති ජාතික කිතුනු සාහිත්‍ය උලෙළේ දී ය. ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ සභාපති සහ කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.



එදින උත්සවයට සම්බන්ධ වූ බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝන් අමරතුංග, නියෝජ්‍ය අමාත්‍ය සරත් කුමාර ගුණරත්න හා බුද්ධශාසන හා ආගමික කටයුතු වැඩබලන අමාත්‍ය ඇම්. කේ. ඒ. ඩී. ඇස්. ගුණවර්ධන මහතා සේයාරුවෙහි වෙති.

මෙහිදී ගරු මොල්ලිගොඩ මෝසෙස් පෙරේරා පියතුමා, ගරු බෙන්සිරි පෙරේරා පියතුමා, ඩබ්. ඇස්. බැසිල් ප්‍රනාන්දු මහතා, එම්. ජෙස්ලින් ප්‍රනාන්දු මිය, ගරු ලක්ප්‍රිය ද සිල්වා දේවගැති තුමා, අයිවන් අල්විස් මහතා උපහාර සම්මාන වලින් පිදුම් ලැබූහ. මෙහි සියලු කටයුතු ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව හා එහි අධ්‍යක්ෂ ඒ. ආර්. ගුණවර්ධන මහතා විසින් සංවිධානය කර තිබිණි.

## අසිපා මහා රැළියට තේවත්ත සූදානම්

2012 ඔක්තෝබර් මස 24 බදාදා දින උදෑසන අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් තේවත්ත ලංකා අප ස්වාමිදූගේ ජාතික බැසිලිකාවේ දී සිදුකිරීමට නියමිත මහා රැළියට හා දිව්‍ය යාගයට සියල්ල සූදානම් බව අගරදගුරු පදවි අසිපා අධ්‍යක්ෂ ගරු ග්‍රෙගරි ජයන්ත පියතුමා දන්වා සිටී. මෙම අන්තර්ජාතික මහා හමුවට ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු පදවි භාර රාජගුරුප්‍රසාදින් වහන්සේ, ගිහි පැවිදි පූජා ප්‍රසාදින් වහන්සේලා අති විශාල පිරිසක් එදිනට සම්බන්ධ වීමට නියමිත බව තවදුරටත් පියතුමා සඳහන් කරයි.

## තුඩැල්ල ක්‍රිස්තු රාජ විදුහලට වසර 70 යි

ජා-ඇල, තුඩැල්ල ක්‍රිස්තු රාජ ජාතික පාසල 2013 වසරේදී සිය 70 වෙනි සංවත්සරය සමරයි. ඒ වෙනුවෙන් පාසල සහ ආදි ශිෂ්‍ය සංගමය මඟින් විද්‍යාලයේ සංවර්ධන කටයුතු ඇතුළුව විවිධ වැඩසටහන් සංවිධානය කිරීමට කටයුතු කරමින් සිටී. ආදි ශිෂ්‍ය සංගමය මඟින් එහි ප්‍රථම පියවර වශයෙන් කිතුරද මව්ගේ ආදි ශිෂ්‍යයින්ගේ තොරතුරු එක්රැස් කිරීමට තීරණය කර ඇත. (15 පිටුවට)

## කිතුනු ගීතිකා රචනා බාර ගැනේ

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් කිතුනු ගීතිකා රචනා බාර ගනී. ඔබ විසින් රචනා කරන ලද නව කිතුනු ගී ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංක සහිතව නොවැම්බර් 19 දාට පෙර ලේකම්, කිතුනු උපදේශක සභාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, කොළඹ 07 ලිපිනයට යොමු කරන්න.

## පාසලේ සහ දහම් පාසලේ බයිබල් සංගමයක්

අගරදගුරු පදවි බයිබල් අපෝස්තලික සේවාව සහ ඇක්වයිනස් විශ්ව විද්‍යාල ආයතනයේ ඉංග්‍රීසි දේව ධර්ම පීඨය ඒකාබද්ධව සංවිධානය කරන මෙම පුහුණු වැඩමුළුව සඳහා සියලුම පාසල් හා දහම් පාසල්වල ගුරු භවතුන්ට කාරුණිකව ඇරැයුම් කරමු. මෙහි පරමාර්ථය වනුයේ පාසලේ සහ දහම් පාසලේ බයිබල් සංගමයක් පිහිටුවා දරුවන් අතර ශු. බයිබලය එළදායී ලෙස අධ්‍යයනට අවස්ථාවක් නිර්මාණය කිරීමයි. (15 පිටුවට)

(ගරු ඇන්ටන් සමන් පියතුමා )

**"දේව වචනය, සිතුවිලි ද, අරමුණු ද, විමසන්නේ ය."** (හෙබ්‍රෙව් 4:12-13)

පදවියෙන් පදවියට



මඩකලපුව පුලියන්තිව් සා. මරියා කොන්පරන්සය සියවස් ජුබිලි සංවත්සරය දා දැනට ජීවතුන් අතර සිටින එහි ඉපැරණි වින්සෙන්තියානුවා වූ සී. ඊ. ජීවරත්නම් මහතාට හැට වසරක වින්සෙන්තියානු සේවාව සඳහා උපහාර පිරිනමනු ලැබිණ. එම අවස්ථාව ප්‍රදීප නෙතට හසුවූ අයුරු. වමේ සිට මඩකලපුව පදවි නියෝජිත එම්. ප්‍රනාන්දු මහතා ත්‍රීමල රදගුරු අතිඋතුම් කිංස්ලි ස්වාමිපිල්ලේ හිමි මඩකලපුව පදවි වින්සෙන්තියානු උපාධ්‍ය ගරු අන්නදාස් පියතුමාද වෙති.

තියබෝල්ඩ් සමරතුංග

## සුබාසිංසන



මන්නාරම රදගුරු අතිඋතුම් රායප්පු ජෝශප් හිමිපාණන්ගේ රදගුරුවර සංවත්සරය ඔක්තෝබර් 20 දාට යෙදේ. එතුමනට ප්‍රදීපය සුබාසිංසන පිරිනමයි.

# බලාපොරොත්තු සුන්වූ සිතට සරණය ලැබෙන මඟ කියයි

කැඩුණු බිඳුනු පරාජිත බලාපොරොත්තු සුන් වූ සැමට සරණය වන ප්‍රබල තෝතැන්න ශුද්ධ වූ ජුසේ මුනිඳුන්ගේ පාමුල බව අගරදගුරු පදවි සහයක රදගුරු අතිඋතුම් මැක්ස්වල් සිල්වා හිමි පසුගිය දා ප්‍රකාශ කළේ හැඳල කෙරවලපිටිය ජුසේ මුනි බැති නුවානයේ 500 වැන්න සමරමින් පැවති තුති දීමේ මෙහෙය අමතමිනි.

විශ්වාසය, බලාපොරොත්තුව, නිහතමානිකීකරුකම හා තම වගකීම් හරියාකාරව කැපවීමකින් යුතුව ඉටු කිරීමෙන් දේව ආදරය දිනාගත් ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ ජීවිතාදර්ශය තුළ දේව ආශිර්වාදයට හිමිකම් කීම නිසා සාන්තුවරයන් අතර දෙවිඳුන් ඉදිරියේ ප්‍රබලම මැදහත්කරු ලෙස එතුමන් පෙනී සිටින බව රදගුරු හිමි වැඩි දුරටත් පැවසීය.



මේ අවස්ථාවට මීසමේ සේවය කළ සියලු පියවරුන් සහභාගි වූ අතර කෙරවලපිටිය මීසම් සේවක ගරු රොෂාන් ප්‍රසාද් පියතුමන් ජනතාව සමගින් උත්සව කටයුතු සංවිධානය කොට තිබුණි. ගරු පියතුමන් පසුගියදා සහභාගිවූ වන්දනාගමනේදී ඉතාලියෙන් ගෙනෙන ලද ශුද්ධවූ ජුසේ මුනි ප්‍රතිමාවක් මීසමට පරිත්‍යාග කළ අතර එය ආසිරි ගන්වා ඉන් ජනතාව ආසිරි ගැන්වීම රදගුරු හිමිපාණන් අතින් සිදුකෙරුනි.

සටහන - සිසිල් පෙරේරා
සේයා - නිහාල් පින්තු

# දෙවිඳුන් කෙරෙහි පූර්ණ විශ්වාසය ඇතිකරගන්න

එදා කිතුනු ජනතාව තුළ තිබූ විශ්වසාය අද අපෙන් ඈත් වෙලා. පාරවල් ගානේ මිනී මරා ගන්නා යුගයක්, එකිනෙකා හඳුනන්නේ නැති සමාජයකයි අද අපි ජීවත් වෙන්නේ. අපේ විශ්වාසය දන්නෙම නැතිව ගිලිහිලා. මොන වැඩ කටයුතු කළත් දෙවිඳුන් කෙරෙහි පූර්ණ විශ්වාසය අපි ඇතිකර ගත යුතුයි. මේ නිසාම කිතුනු ජනතාවට විශ්වාසි වසරක් ලෙස මෙම වසර නම් කර තිබෙනවා. දිව්‍ය පූජාවට සහභාගි වී දේව වචනයට සවන් දීමෙන් හා තම පවුල තුළ එකමුතුකමෙන් ජීවත් වුවහොත් පමණක් අනිත් ජනතාවට ආදර්ශවත් කිතුනු පවුලක් වෙනු ඇතැයි මිල්ලව ජාතික කනිටු දෙව්සත්හලේ අධ්‍යක්ෂ ගරු නිහාල් ඕබ්‍රිස් පියතුමා පැවසීය.

පියතුමා මෙම අදහස් පළකළේ උඩුබද්දාව ශු. ජුවානා දාර්ක් මුනිවරියගේ දෙව් මැඳුරේ පැවැති වාර්ෂික මංගල දිව්‍ය පූජා යාගයේදීය. මීසම් සේවක ගරු බෘනෝ ගාමිණී පියතුමා සමඟ මීසම් ජනතාව මංගල්‍යය ඉතා සාර්ථක අන්දමින් පැවැත්විය.

මයිකල් කැනිසියුස්



වසර 15 කට පසුව සාන්ත සෙබස්තියන් මුනිතුමාගේ ජීවිත කතාව 2013 ජනවාරි මාසයේදී කඳාන සිද්ධස්ථාන භූමියේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත. ප්‍රවීන නාට්‍ය අධ්‍යක්ෂ එම්. ඩී. ඒ. හැරල් මහතා සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පෙරේරා පියතුමාගේ මඟපෙන්වීමෙන් ඊට යොමුවී සිටී. 1912 වසරේ නාඩගම් ශෛලියෙන් රඟදැක්වූ සෙබස්තියන් මුනි වාසප්පුව ඉන්පසුව 1918, 1943, 1968 සහ 1998 වර්ෂවල වේදිකාගත කර ඇත. දැවැන්ත වේදිකාවක නළු නිළියන් 150 ක් මෙහි රඟ පාන බැව් සම්බන්ධිකරන ලේකම් ස්ටීවන් හපුආරච්චි මහතා ප්‍රදීපයට පැවසීය. නාට්‍යයේ සාන්ත සෙබස්තියන් මුනි චරිතය රඟපෑමට ජෝර්ජ් දිනේෂ් මන්ත්‍රිගෙ තරුණයා තෝරා ගෙන ඇති අතර ඉකුත්දා සානත් සෙබස්තියන් නාට්‍ය සංදර්ශනයේ සියලුම නළු නිළියන් කඳාන සිද්ධස්ථාන පාලක ගරු නිහාල් අයිවන් පියතුමන් විසින් සමාරම්භක උත්සවයට පෙර ශු. සෙබස්තියන් මුනිතුමාගේ ප්‍රතිමාවෙන් ආසිරි ගැන්වූ අයුරු.

ඩබ්. එම්. ලෙස්ලි පෙරේරා

# ළමා ගැටලු පිළිබඳව ඇමතුම් සේවාවක්

දුන්ගාල්පිටිය දොන් බොස්කෝ ආයතනය මගින් ක්‍රියාත්මක කරන 'ළමා සරණ සේවයට' ළමුන්ගේ ප්‍රශ්න, දුර්වලතා හා ඔවුන්ගේ යම් යම් දක්ෂතා ජයග්‍රහණ දැනුම් දිය හැකිය. ඕනෑම ළමයෙක් සම්බන්ධව වැඩිහිටියන්ටද ඇමතීමට අවස්ථාව ඇති බවත්, ළමා සැමට උපදේශන සේවාවන් මගින් අත්වැලක් සැපයීමට සූදානම් බව දොන් බොස්කෝ ළමා සරණ සේවය පවසයි. වැඩි විස්තර 011-2332332 න් ලබාගත හැකිය. ලිපිනය නො. 66 දුන්ගාල්පිටිය තලාහේන මීගමුවයි.

බෙන්ජමින් කිරිහෙට්ටි



පසුගිය සුනාමියේදී පමුණුගම ඇලෙන්එගොඩ ප්‍රදේශයට සුනාමි රළ නැගී නැවතුන ස්ථානයේ ප්‍රදේශවාසිහු ශුද්ධවූ ජුසේ මුනි ප්‍රතිමාවක් තබා සිහිවටන පීඨකයක් තනා හැම වසරකම අනුස්මරණ දිව්‍ය යාගයක් පවත්වති. එය මෙවරද පැවතියේ බැතිමතුන් රාශියක් මැද පමුණුගම මීසම් සේවක ගරු ආනන්ද විතාන පියතුමා හා සහයක ගරු රසික ලෝරන්ස් පියතුමන් විසිනි.

සටහන - ජෝ. සංගපාලආරච්චි
සේයා - උපාලි කරුණානායක

# 150 වසරක ශුද්ධවූ පවුලේ නිකායේ කැපවූ සේවාව අගැයේ

කිතුනු අප වෙනුවෙන් ගමයි දෙව්මැඳුරයි කන්‍යාරාමයයි එකිනෙක ඒකාබද්ධව පවතින බවත් ඒ අතරින් අනෙකකට නොදෙවෙනි අන්දමේ සේවයක් කන්‍යාරාමයෙන් සිදුවන බවත් උස්වැටකෙයියාව මීසම් සේවක ගරු අයිවන් පීටර්ස් පියතුමා උස්වැටකෙයියාව ශුද්ධවූ පවුලේ කන්‍යාරාමයේදී පැවසීය.

ශුද්ධවූ පවුලේ නිකායේ පැවිදි සොයුරියන් වසර 150 ක් ශ්‍රී ලංකාව පුරාද, වසර 113 ක් උස්වැටකෙයියාව තුළද සිදු කරති අනුපමේය සේවයට තුති පිදීම සඳහා උස්වැටකෙයියාව ශු.ප.නි ගිහි සමාජිකයන්ගේ මූලිකත්වයෙන් සංවිධානය කරන ලද උත්සවයේ දේව මෙහෙයයේදී එසේ පළකළ ගරු පියතුමා ගම දෙව්මැඳුර පාසල හා සබැඳිව කන්‍යාරාමය විසින් සිදුකරනු ලබන සේවාවන් පැහැදිලි කර දුන්නේය.

ආරාධිත පැවදි සොයුරියන් පිළිග ැනීමෙන් හා පහන් වැටි 150ක් දල්වා ආලෝකවත් කිරීමෙන් අනතුරුව පැවති මෙම උත්සවයේදී උස්වැටකෙයියාව කන්‍යාරාමයේ සේවය කොට මෙලොවින් සමුගත් පැවදි සොහොයුරියන් සිහිපත් කිරීමත් නිකාය ආරම්භයේ සිට මේ දක්වා පැමිණි ගමන ගෙනහැරදැක්වීමත් සිදුවූ අතර ප්‍රදේශයේ දරුදැරියන්ගේ නර්තනයෙන් රසවත් වූ එහි අවසන උස්වැටකෙයියාව සිංහ සමාජය පැළ බෙදා දීමක්ද සිදු කළේය.

පස්කල් ජයමාන්න

# කතෝලික සරසවි සිසු වාර්ෂික දයා සේවා වැඩසටහන



සරසවි කතෝලික ශිෂ්‍ය ව්‍යාපාරයේ කොළඹ කලාපීය වාර්ෂික දයා සේවා වැඩසටහන බෝපිටිය ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 60 දෙනෙකුගේ පමණ එකමුතුවෙන් පැවැත්විණ. මෙහිදී ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසිකව සිටි ශිෂ්‍යාවන් 50 දෙනෙකු සඳහා අධ්‍යාපන සංවර්ධන වැඩසටහනක් පැවැත්වූ අතර එම ආයතනයේ ශාලාවක තීන්ත ආලේප කිරිමද සිදු විය. එසේම ශිෂ්‍යාවන්ට චිත්‍ර ඇඳීම සඳහා ද අවස්ථාව ලබාදුන් අතර එම චිත්‍ර අතුරින් තෝරා ගනු ලබන චිත්‍ර ඇතුළත් කරමින් නත්තල් සුබ පැතුම් පත් මුද්‍රණය කර අලෙවි කිරීම සඳහා මේ වන විට කටයුතු සම්පාදනය වෙමින් පවතී.



විසෙන්ති පාවුලා නවසීලන්ත නියෝජිත පීටර් කර්ට්නි මහතා හලාවත පදවි විසෙන්තියානු සමිති නිරීක්ෂණයට පැමිණි අවස්ථාවේදී, මට්ටාකොටුව සින්දාත්‍රි දේවමාතා දේවස්ථානයේදී දිළිඳු පවුල් කීපයකට ස්වයං රැකියා සඳහා එළු පැටවුන්, කුකුල් කොටු සහ මහන මැෂින් ප්‍රදානයක් සිදුකෙරිණි. එහිදී සලාපුර පදවි විසෙන්ති පාවුලා අධ්‍යක්ෂ ගරු කුවින්ටස් ප්‍රනාන්දු පියතුමා මට්ටාකොටුව මීසම් සේවක ගරු හයසින්ත් තිසේරා පියතුමා සහයක ගරු ඇලෙක්ස් නිලන්ත පියතුමා සහ පීටර් කර්ට්නි මහතාද වින්සෙන්තියානු ජාතික මණ්ඩල සහ පදවි මණ්ඩල නියෝජිත පිරිස්ද ත්‍යාගලාභීන් සමඟ සේයාරුවකට පෙනී සිටි අයුරු.

කේ. නිහාල් ප්‍රනාන්දු

## පවුල් දිවිය සුරකින අවිය ජපමාලයයි



පවුලේ සැම එකට එක්ව යදින ජපමාලය මගින්, දෙවිඳුන් මහිමයට පත් කිරීමට උපකාරී වන්නාසේම, අපගේ එදිනෙදා ජීවිතයේ ප්‍රශ්නයන්ට විසඳුම් මෙන්ම අවශ්‍යතාවයන් සපුරා ගැනීමටද හැකිවනු ඇත. අද අපගේ නිවෙස්වල පවුල් ජපමාලය උච්චාරණය බොහෝ සෙයින් පිරිහීමට ලක්වී ඇති බව පැහැදිලිව පෙනෙනවා. වෙනත් අවශ්‍යතාවයන්ට තැන දෙමින් පවුල් යැදුම අමතක කර තිබීම අතිශයෙන් කණගාටුදායකයයි පිළියන්දල 'සුබෝධි' ආයතනයේ සහය අධ්‍යක්ෂ ගරු චින්තක පෙරේරා පියතුමා පැවසීය.

එතුමා එසේ පැවසුවේ මග්ගොන මීසමේ මුංහේන සමාදානයේ රැජිණියගේ දෙව්මැඳුරේ වාර්ෂික මංගල දේව මෙහෙයේදීය. මග්ගොන මීසම් සේවක, ගරු ඉෂාන් ප්‍රමීන පියතුමන්ගේ මූලිකත්වයෙන්, මුංහේන මීසම් ජනතාව මෙමමංගල උලෙළ මහත් හරසරින් සිදුකරන ලදි.

ඩී. ඇන්සලම් ප්‍රනාන්දු

# ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2012 ඔක්තෝබර් 14 ඉරිදා


## ගැටුම් නිරාකරණයට අප දේශය අසමත්ද?

අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් හට එල්ල වූ මැර ප්‍රහාරයට විරෝධතාව දැක්වීම සඳහා ඉකුත් දිනවල විනිසුරුවරුන්, අධිකරණ සේවකයන් හා නීතිඥවරුන් අධිකරණ ක්‍රියාදාමයෙන් ඉවත්ව සිටි බව මාධ්‍ය හරහා නිකුත් වූ වාර්තා වලින් සනාථ වේ. තවත් අලුත් ගැටුමක් නිර්මාණය කරන්නට හොඳ තෝතැන්නක් බිහිවී ඇති සෙයකි. එලෙසම තුන් මසක් පුරා ඇදී ගිය විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ වර්ජනය ඒ සා විශාල කාල පරාසයක් කරා ඇදී ගියෙත් ගැටුම් නිරාකරණයකට වඩා ගැටුම් නිර්මාණයකටම අප දේශයේ ආයතන හා යාන්ත්‍රණ සැලසුම් වී ඇති නිසාද යන්නත් විමසීම වටී. ඒ පමණක් නොව දේශපාලන තලයේ විපක්ෂ කාර්ය භාරය ඉටුකරන දේශපාලන පක්ෂ අතරත් නිරන්තරයෙන්ම දැකිය හැකි වන්නේ ගැටුම් නිර්මාණය කරවීමේ පසුබිමක්මයි. පළාත් සභා, ප්‍රාදේශීය සභා, පාර්ලිමේන්තු හා ජනාධිපති ඡන්දයන්හිදී මුළු සමාජ තලයම වසා ගන්නේ ගැටුම් නිර්මාණය කිරීමේ පසුතලයක හැඩතල මත නිසා අද සෑම ඡන්දයක්ම ගැටුම් මවාලීමේ පරිසරයක් තුළ රැඳී පවතී. එම ගැටුම් නිරාකරණය කිරීමේ සමාජ පසුබිමක් නැතිනම් විචාරශීලි කතිකාවක් නොමැති තරම්ය. පෞද්ගලිකව හැම දෙනෙක්ම මෙහි ප්‍රගමණය හා ඇති කරවා ඇති අහිතකර බලපෑම ගැන තනි තනිව කථා කළත් පොදුවේ එක හඬකින් කථා කරන්නට නම් කිසිදු අයුරකින් පෙරට එන බවක් නොපෙනේ.

මුළු මහත් අධ්‍යාපන තලයටම අද සිදුව ඇත්තේ නිර්මාණශීලි පරිණත පරපුරක් බිහිකරනවාට වඩා ඉච්ඡා භංගත්වයට පත් මන්ද මානසික ඉදිරි පරපුරක් බිහිකරලීමේ කටයුතු සිදු කිරීමටයි. පසුගියදා දකුණු පළාතේ සිදුවු පාසල් සිදුවීම එයට හොඳම උදාහරණයයි. මෙහිදී සිදුවූයේ ආවේගාත්මකව හැසිරෙන ලක්ෂණ පොදුවේ දිස්කරවන යොවුන් දරුවන්ගේ ඒ දඩබ්බර ගති පැවතුම් සමනය කිරීමට කටයුතු කළ යුතු වැඩිහිටි දෙමාපිය පාර්ශ්වය එලෙස කටයුතු නොකර ඔවුනුත් ගැටුම් නිර්මාණය කරන්නට හරි හරියට කටයුතු කිරීමයි.

එක්කෝ අප දේශයේ බල පවත්වන ආගමික විශ්වාසයන් අතර පෝෂණය වන ආධ්‍යාත්මයේ ගැඹුරු රික්තයක් රැඳී පවතින බව පිළිගත යුතුයි. නැතිනම් අතීත ආවර්ජනයක යටගියාව තුළම ජීවත් වන මනස් තලයන් පමණක් ජීවත් කළ යුතුයි යන කොදෙව් මානසිකත්වයකට අප ජනයා පත් වී ඇති බව අවබෝධකර ගත යුතුයි. උසස් බුද්ධිමත් මනසක් ඇති කරවන සමාජ තලයකට අප දේශයේ ජනයා ගමන් කර ඇත්නම් ගැටුම් නිර්මාණය වූවත් එය නිරාකරණයට පරිබාහිර යාන්ත්‍රණ ශක්තියක් පසු පස දිව යා යුතු නොවේ. නමුත් අභාග්‍යයට කරුණක් වන්නේ තමන් පෝෂණය වන රැලට ආ නොවඩන පරිබාහිර පිරිසක් යම් මත වාදයක එල්බ ඇත්නම් තමන්ගේ ආධිපත්‍යය තුළ සියල්ල හිර කර දමා සුපිරි මානයකට යෑමට බලය ඇති අය කටයුතු කරන අයුරු නිරන්තරයෙන්ම අප සමාජයන් තුළින් ඉස්මතු වීමයි. මේ නිසා හරයාත්මක හා සාධාරණ හඬක් නැගීමේ අයිතිය ක්‍රමිකව අහෝසි වන බවක් දැනේ.

ප්‍රබලව තම මතවාදය ඉස්මතු කරලීමට මාධ්‍යය හසුරුවන්නන්ට එලෙස ඇතිවන පරිසරයන් තුළ ගැටුම් ඇතිකරවාලන්නට පහසු මාර්ගයන් උත්පාද වී ඇත. එම නිසාම පොදුවේ සිවිල් ජනයා උද්ඝෝෂණ හා වර්ජන තැනට තල්ලු වන සෙයක්ද පෙනේ. එය මර්ධනයට ගන්නා සෑම පටු ක්‍රියා මාර්ගයක්ම පොදුවේ ගැටුම් නිරාකරණයකට වඩා ගැටුම් නිර්මාණයකටම පසුතල සලසන නිසා අප දේශය ගැටුම් නිරාකරණය කර ගැනීමේ ශක්තිය අතින් හීන තත්ත්වයකට පත් වී ඇති බව පෙනේ. එහිදි අගතිගාමිව සිදුවන කරුණක් වන්නේ හඬ ඉස්මතු කරන පුද්ගල චරිත අමු අමුවේ ඝාතනය කිරීමයි. රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය හරහා මෙය නිරන්තරයෙන්ම සිදුවෙද්දී ආධ්‍යාත්මික බල ශක්තියක් නොමැති පුද්ගල චරිත නිරන්තරයෙන්ම ගැටුමක් නිර්මාණය කර ගැනීමට නිමිත්තක් සොයා ගනී. එම නිසා සිදුවන්නේ සත්‍ය තුළ හා සාධාරණීකරණය තුළ සිදුවන උද්ඝෝෂණ හා වර්ජන පවා හෑල්ලු වී යාමයි. අවසාන ප්‍රතිඵලය වන්නේ අප දේශය ගැටුම් නිරාකරණය කිරීමේදී අසමත් දේශයක් බව පුන පුනා පැවසීමයි. තවදුරටත් එය සිදු විය යුතුද?

**විශ්වාසයේ වසර**
**දහම් චින්තා 2**

# විශ්වාසයේ දොරටුව

### (අති උත්තම සොලොස්වන බෙනඩික් සසුන් පියගේ අපෝස්තලික සංදේශය)

05. යම් ආකාරයකින්, මාගේ පූර්වගාමිකයාණන් මෙම වර්ෂය 'පශ්චාත් කතිකාවත් සමයේ ප්‍රතිඵලයක් සහ අවශ්‍යතාවයක්'[8] ලෙස දැකීය. විශේෂයෙන්ම සත්‍ය විශ්වාසය ප්‍රකාශ කිරීම සහ එහි නිවැරදි අර්ථ නිරූපණය අරබයා කාලයේ බරපතළ දුෂ්කරතා පිළිබඳ පූර්ව අවබෝධයක් එතුමන් සතු විය. දෙවන වතිකාන කතිකාවතේ සමාරම්භය සිදු වී පනස්වන සාංවත්සරය සමරනු ලබන අවස්ථාවේ දී, විශ්වාසයේ වසර දියත් කිරීම, කතිකාවත් පියවරුන් විසින් දායාද කරන ලද ලේඛණ, භාග්‍යවන්ත දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන්ගේ වචන වලට අනුව 'ඒවායේ වටිනාකම හෝ බුද්ධිමත්කම හෝ කිසිදු ලෙසකින් නැතිවී නැති' බව තේරුම් ගැනීමට ජනතාවට සහාය වන අනඟි අවස්ථාවක් ලබා දෙන බව මට පෙනී යයි. ඒවා නිවැරදිව කියැවිය යුතුය. ඒවා සාන්ත සභාවේ සාම්ප්‍රදායය ඇතුලත ගුරුබලාධිකාරියේ වැදගත් සහ ප්‍රතිමාණික ලේඛණ ලෙස සිතට ගත යුතු අතර, ඒවා එසේ පුළුල් ලෙස දැනගත යුතුය. දහනම වන සියවස තුළ සාන්ත සභාව මත පිරිනැමුන ශ්‍රේෂ්ඨ වරප්‍රසාදය ලෙස සමුළුව හඳුන්වා දීමට මා වගකීමෙන් බැඳී සිටින බව වෙන කිසිදාකටත් වඩා අද මට හැඟී යයි: දැන් ආරම්භ වන ශත වර්ෂය තුළ අපගේ දිශානතිය ලබා ගන්නා ස්ථිර මාලිමාවක් එහි අපි දකිමු.[9] පේදුරු තුමන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස මා තේරී පත්වී මාස කිහිපයකින් පසුව සමුළුව පිළිබඳව පැවසූ දේ නැවත අවධාරණය කිරීමට මම කැමැත්තෙමි; 'නිවැරදි විවරණ මඟින් මඟ පෙන්වන ලදුව අප එය අර්ථකථනය කළේ නම් සහ ක්‍රියාත්මක කළේ නම්, නිරන්තරයෙන්ම අවශ්‍ය සාන්ත සභා නව්‍යකරණය සඳහා එය වර්ධනාත්මකව බලවත් විය හැකිව තිබිණි.'[10]

06. විශ්වාසිකයින්ගේ ජීවිත විසින් ප්‍රදානය කරනු ලබන සාක්ෂිය මඟින් ද සාන්ත සභාවේ නව්‍යකරණය ලඟාකරගත හැකිය: ලෝකය තුළ ඔවුන්ගේ පැවැත්ම විසින්ම, ජේසුස් ස්වාමින් වහන්සේ අපට ඉතිරි කර ගිය සත්‍යයේ වචනය ව්‍යාප්ත කිරීමට කිතුනුවන් කැඳවා තිබේ. Lumen



Gentium නමැති වේද සත්‍ය ව්‍යවස්ථාව තුළින් සමුළුවම මෙය ප්‍රකාශ කළේය: 'ක්‍රිස්තුන් වහන්සේ ධාර්මික, නිර්දෝෂ, නිර්මල' (හෙබ්‍රෙව් 7:26), පාපය නොදත් (2 කොරෙන්ති 5:21) නමුත් ජනතාවගේ පව් කමා කිරීමට පමණක් පැමිණි (හෙබ්‍රෙව් 2:17) තැනැත්වහන්සේ වන අතර, පවුකරුවන් ස්වකීය තුරුළට වැළඳගන්නා, එකම විට ශුද්ධවන්ත වූත්, නිරන්තරයෙන්ම පිරිසිදු වීම අවශ්‍ය වන්නාවූත් සාන්ත සභාව, අඛණ්ඩව පාපයට වන්දි ගෙවීමේ සහ නව්‍යකරණයේ මාර්ගය අනුගමනය කරන්නීය. සාන්ත සභාව සමිඳාණන් වහන්සේ වඩින තුරු උන්වහන්සේගේ කුරුසිය හා මරණය ප්‍රකාශ කරමින් (1 කොරෙන්ති 11:26) 'විදේශ රටක ආගන්තුකයකු විලස ලෝකයේ වධ හිංසා සහ දෙවියන් වහන්සේගේ අස්වැසිලි මැද ඉදිරියට ඇදෙන්නීය. නමුත් ඉවසිල්ලෙන් සහ ප්‍රේමයෙන් ඇතුළතින් සහ පිටතින් පැමිණෙන දුක් වේදනා සහ දුෂ්කරතා ජය ගැනීමට අවශ්‍ය ශක්තිය උත්ථාන වූ ස්වාමින් වහන්සේගේ බලය විසින් ඇයට ලබා දෙනු ලැබේ. එමඟින් ඇය, අවසානයේ දී පූර්ණ ආලෝකයෙන් යුතුව ප්‍රකාශයට පත් වන තුරු, ඇයගේ ස්වාමින් වහන්සේගේ අභිරහස අඳුරු සෙවනැලි සමඟින් වුව ද, විශ්වාසවන්තව ලෝකය තුළ අනාවරණය කරන්නීය'[11]

මෙම අදහසින් ගත් කල, විශ්වාසයේ වර්ෂය ලෝකයේ එකම ගැළවුම්කරුවාණන්වූ සමිඳාණන් වහන්සේ වෙත සත්‍ය වූ සහ නව්‍යකරණය වූ සිත් හැරීමකට කැඳවීමකි. උන්වහන්සේගේ මරණයේ අබිරහස තුළ අපට ගැලවීම ලබා දෙන්නාවූත්, පවුකමාව මාර්ගයෙන් (ක්‍රියා 5:31) ජීවිතයේ වෙනසකට අප කැඳවනු ලබන්නාවූත් ප්‍රේමය, එහි පූර්ණත්වයෙන් දෙවියන්වහන්සේ අනාවරණය කොට ඇත්තේය. ශු. පාවුලු තුමන්ට අනුව, මෙම ප්‍රේමය නව ජීවිතයක් කරා අප ගෙන යන්නේය. 'අපේ බව්තිස්ම ස්නාපනයෙන් අපිදු උන්වහන්සේගේ මරණයට සම්බන්ධ වී උන්වහන්සේ සමඟ වළලනු ලැබූයෙමු. එසේ කරනු ලැබුවේ පියාණන් වහන්සේගේ මහිමාන්විත ක්‍රියාවෙන් ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් උත්ථානය ලැබූ සේම අප ද නව ජීවන මගක ගමන් කරනු සඳහාය' (රෝම 6:4) විශ්වාසය මඟින් මෙම නව ජීවිතය, උත්ථානයේ විප්ලවීය නව යථාර්ථයට අනුව සමස්ත මානව පැවැත්ම හැඩ ගස්වන්නේය. මිනිසා ස්වකීය නිදහසේ සහයෝගය දක්වන ප්‍රමාණයට මේ ජීවිතය තුළ දී කිසිවිටෙක සම්පූර්ණයෙන්ම නිම නොවන ගමනක දී ඔහුගේ අදහස් සහ ආවේග ද, චිත්ත ස්වභාවය සහ කල් ක්‍රියාව ද සෙමින් පිරිසිදු සහ පරිවර්තනය කෙරේ. 'ප්‍රේමය කරණ කොට ගෙන ක්‍රියා කරන ඇදහිල්ල' (ගලාති 5:6) මිනිසාගේ සමස්ත ජීවිතය වෙනස් කරන අවබෝධයේ සහ ක්‍රියාවේ නව මිණුම් දණ්ඩක් බවට පත් වෙයි (රෝම 12:2, කොලොස්සි 3:9-10. එපීස 4:20-29, 2කොරෙන්ති 5:17).

07. "Caritas Christi Urget nos" (ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමය අප කෙරෙහි බොහෝ සෙයින් බලපායි) (2කොරෙන්ති 28:19): අපගේ හදවත් පුරවා, ධර්මදානය සඳහා අප පොළඹවනු ලබන්නේ ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමයයි. අතීතයේ දී මෙන් අද ද ලෝකයේ සියලු ජනතාව වෙත සුවිශේෂය ප්‍රකාශ කිරීම පිණිස (මතෙව් 28:19) උන්වහන්සේ ලෝකයේ මහා මාර්ග ඔස්සේ අප යවන සේක. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ උන්වහන්සේගේ ප්‍රේමය තුළින් සෑම පරපුරකම ජනතාව උන්වහන්සේ වෙත ආකර්ෂනය කර ගන්නා සේක: උන්වහන්සේ සදහටම අලුත් බලය පැවරීමක් මඟින් සුවිශේෂය ප්‍රකාශ කිරීම ඇය වෙත බාර දෙමින්. සෑම යුගයක දී ම සාන්ත සභාව කැඳවන සේක.

ඉදිරියට....

## කැමිලස්ගේ —— තිත්ත ඇත්ත



# ක්‍රිස්තු ධර්මයේ සැබෑ හරය දුක සහ වේදනාවයි

## කාදිනල් හිමිපාණෝ පල්ලන්සේන 125 ජයන්තියේදී පවසති

**ක්‍රිස්තු ධර්මයේ හරය දුක සහ වේදනාවයි. අපගේ ශක්තිය ශුද්ධ වූ කුරුසියයි. මා අනුගමනය කරන්නා කුරුසිය රැගෙන මා පසු පස එන්න කියා දෙවි සමිඳුන් දෙව්බව අතහැර මනුකය රැගෙන අප අතරට වැඩියේ දුකවේදනාව අප සමඟ බෙදාගන්නයි. දිළිඳු ගවහලක උත්පත්තිය ලබා කල්වාරි ගමනතෙක් උන්වහන්සේ දුක වේදනාව අප සැමට ක්‍රියාවෙන් ඔප්පු කළා යැයි පල්ලන්සේන වික්ෂෝප දේවමාතාවහන්සේගේ 125 ජයන්ති මංගල්‍යයේදී කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණෝ පැවසූහ.**



තවදුරටත් කථා කළ කාදිනල් හිමිපාණෝ දුක වේදනාව නැතිව ආදරයක් නැත. ආදරය තුළින් පරිත්‍යාගය ඉස්මතුවේ. ස්වාමියා තම බිරිඳටද, බිරිඳ හා ස්වාමියා අතරද දරුවන් දෙමව්පියන් අතරද විශේෂයෙන් මහලුවි සිටින වියපත් දෙමව්පියන්ගේ දුක් වේදනාවලට සංවේදී විය යුතුය. පරිත්‍යාගි විය යුතුය. මේ මගින් අපගේ කල්වාරි ගමනටද කොටස් කරුවන් විය හැකියි.

මංගල්‍යය කටයුතු සාර්ථක කරගැනීම සඳහා වෙහෙස මහන්සිය නොබලා සුවිශේෂී මෙහෙවරක් කළ මීසම් සේවක ගරු ජයන්ත නිමල් සහායක ගරු ගයාන් පියතුමන්ලා ඇතුලු මීසම් සංසය කටයුතු මැනවින් සංවිධානය කැර තිබිණ.

ඩබ්ලිව් හෙක්ටර් ප්‍රනාන්දු
මෙල්වින් ද කොස්තා

## ආදි සිසු සංවත්සරයට ක්‍රිකට් තරගාවලියක්

නුවරඑළිය ශාන්ත සේවියර් විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමය ආරම්භ කර වසර 65 ක් පිරීම නිමිත්තෙන් සය සාමාජික ක්‍රිකට් තරගාවලියක් නුවරඑළිය මහා නගර සභා ක්‍රීඩාංගනයේදී මහනුවර කටුගස්තොට සා. අන්තෝනි විද්‍යාලීය අදියුරු ගරු ටයිටස් රොඩ්රිගු සා.බෙ.නි පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙදින කණ්ඩායම් 30 ක් පමණ සහභාගි වූ අතර ජයග්‍රහක කණ්ඩායම් සඳහා ත්‍යාග හා සහතික පිරිනැමිණ. මෙම තරග ශාන්ත සේවියර් ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලදි.

ජේ. ඒ. බානබස්



බුරුල්ලපිටිය මීසමේ වාර්ෂික දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍ය ඉකුත් දා උඩුගම්පොල ශු. ප්‍රැන්සිස් අසීසි දෙව්මැදුරේදී ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත් වුණි. බුරුල්ලපිටිය මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද නි.ම.නි පියතුමාගේ හා උඩුගම්පොල සා. පීතර විදුහලේ විදුහල්පති ගරු චමින්ද වනිගසේන පියතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු ප්‍රදීප් කුමාර පියතුමා හා වෙන්නප්පුව නාසරෙත් දේශනා ගෘහයේ ගරු උදාර නි.ම.නි පියතුමාද, පොල්වත්ත දෙවි අරණේ ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු නි.ම.නි පියතුමා හා තෝමස් සහෝදර තුමාගේ මෙහෙය වීමෙන් පැවති මෙම අර්ථවත් දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයට උඩුගම්පොල ධර්මසේවා කමිටුවේ තරුණ සමිතියේ යුග්‍රා තරුණ හවුලේ හා දේවස්ථානයේ ගීතිකා කණ්ඩායමේ සහයෝගයද නොමඳව ලැබුණි.

චමිලි නදීෂානි පෙරේරා

## හලාවත පදවි සංක්‍රමණික සේවා කොමිසමේ සුහද හමුවක්

හලාවත පදවි සංක්‍රමණික සේවා කොමිසම මගින් සංවිධානය කරනු ලබන දේශන මාලාව සඳහා දායකත්වය සපයන සම්පත් දායකයෝ පසුගියදා සුහද හමුවකට එක්වූහ.

හලාවත රදගුරු අතිඋතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සුහද හමුවට සංක්‍රමණික සේවා කොමිසමේ අධ්‍යක්ෂ ගරු නිහාල් පයස් ප්‍රනාන්දු පියතුමා ද සහභාගි විය.

ටිරෝනි ප්‍රනාන්දු




හලාවත පදවි දිව්‍ය හෘදය මංගල්‍යයට සහභාගිවූ දිව්‍ය හෘදය සාමාජික පිරිස සහ මංගල්‍ය දිව්‍ය පූජා යාගය සිදුකළ ගිහිදූත සේවා අධ්‍යක්ෂ ගරු සාර්ටෝ නෝනිස් පියතුමා මංගල්‍ය දේශනය පැවැත්වූ අයුරු.

## ශ්‍රී කුරුසියේ බල මහිමයට පවුලේ ඉඩ හරිමු

සිරිගම්පල මීසමේ දිළිඳුන්ගේ කන්‍යාවගේ දෙව්මැඳුරට අයත් සියලු නිවෙස් ජේසුතුමන්ගේ දිව්‍ය හෘදයට කැප කිරීම ගරු ජනිත් සහෝදර තුමාගේ ඉමහත් කැපවීම සහ භක්තියෙන් යුතුව සිදු කෙරින.

මීසම් සේවක ගරු ඇලෙක්ස්වීරසූරිය පියතුමාගේ මඟපෙන්වීම මත ඒ සියලු පවුල් ඒකරාශි කරමින්, පවුලක වැදගත් චරිතවල අප නොසිතන, නොදකින අත්දැකීම්. එම චරිත පවුල තුළ දරන වටිනාකම, ඒ සැම දෙවිඳුන් අත්දකින ආකාරය යන කරුණු පැහැදිලි කරමින් අර්ථවත් භාවනාත්මක සැඳෑවක් ගරු සහෝදර තුමන්ගේ මූලිකත්වයෙන් සංවිධානය කොට තිබිණ.

ඉන් අනතුරුව එක් එක් පවුල ජේසුගේ ශ්‍රී කුරුසියට කැපකරමින් දිව්‍ය පූජා යාගයක්ද සිදුකෙරින. දෙව්මැඳුරේ සේවක මණ්ඩලයේ හා දහම් ගුරුවරුන්ගේ සහයෝගය මත මෙම සැඳෑ භාවනාව අර්ථවත්ව සංවිධාන කෙරිණ.

ඩබ්. ඉනිට් ලූර්දු ප්‍රනාන්දු

## බුළුපිටියේ වැඩසටහනක්

කුරුණෑගල රදගුරු වසමට අයත් බුළුපිටිය මීසමේ ජාතික ධර්මෝපදේශ ඉරුදිනට සමගාමීව විශේෂ වැඩසටහනක් බුළුපිටිය හා නාරම්මල දහම් පාසල්වල ගුරුවර ගුරුවරියන් විසින් සංවිධානය කරනු ලැබ තිබුණි.

එදින දිව්‍ය පූජා යාගය කුරුණෑගල අධ්‍යාපන හා ධර්මෝපදේශ පදවි අධ්‍යක්ෂ ගරු ප්ලැසිඩස් සුජීව ද සිල්වා පියතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. සැම මසක පළමු බ්‍රහස්පතින්දා දහම් ගුරුවර ගුරුවරියන් විසින් දිව්‍ය සත්ප්‍රසාද වන්දනා මෙහෙයක් පැවැත්වීමට තීරණය කර ගන්නා ලදී. බුළුපිටිය මීසම් සේවක ගරු ආනන්ද වීරකෝන් පියතුමාගේ මඟපෙන්වීම යටතේ සංවිධානය විය.

තිරෝෂා කාමෙල් තිරිමාන්න

## ගිහි දූතිකාවෝ පොරොන්දු අළුත් කරති

යහපත් එඬේරා ගිහි දූතික සංඝයේ සාමාජික සාමාජිකාවන්ගේ පොරොන්දු අලුත් කිරීමේ දේව මෙහෙය කළුතර කටුකුරුන්ද ශු. පිලිප්නේරි මුනි දෙව්මැඳුරේදී පවත්වනු ලැබීය.

කලමුල්ල මීසම් සේවක ගරු මොරිස් නාමල් පියතුමා දේව මෙහෙය පැවත්විය.

රංජිත් නෝනිස්



නවසීලන්තයේ ඔක්ලන්ඩ් හි සාන්ත වින්සන් ද පාවුලු සභාපති පීටර් කර්ට්නි මහතා පසුගියදා ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුනි. ඒ මහතා අගරදගුරු නිවසේදී ශ්‍රී ලංකා සා. වින්සන්ද පාවුලු සමති ජාතික විධායකගේ නියෝජිතයන් සමඟ අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ද බැහැදුටුවේය. ඡායාරූපයේ මැද කාදිනල් හිමිපාණන් දිස්වන අතර එතුමාට වම්පසින් පීටර් කර්ට්නි මහතාද දකුණු පසින් සා.වි.පා ජාතික උපාධ්‍ය ගරු ලියෝ පෙරේරා පියතුමන්ද සමඟින් ශ්‍රී ලංකා ජාතික විධායක නියෝජිතයන් ද වෙති.

තියබෝල්ඩ් සමරතුංග

## ස්වර්ණ ජයන්තිය සමරණ තලාදූව ශු. ජූඩ් දේවස්ථානය




1962 වර්ෂයේ පමණ පැමිණි ඇන්ඩෲ ජයමාන්න නමැති යුද හමුදාවේ උසස් නිළධාරි මහතකු මෙම දෙව්මැඳුරේ ආරම්භකයා ලෙස සැලකේ.

ජූඩ් මුනිතුමන් වෙත අචල විශ්වාස භක්තියෙන් පසුවූ ඒ මහතා නිවාඩු ඇති විට තම පවුලේ සියල්ලන් සමඟ ඉදිගොල්ල සිද්ධස්ථානයට යෑමට පුරුදුව සිටියේය. එහිදී මීසම් සේවක ගරු මාසලස් පියතුමා හා සුහද සාකච්ඡාවක එතුමා යෙදී සිටින අවස්ථාවක ජූඩ් මුනිඳුන්ගේ සිද්ධස්ථානයේ තිබෙන සුරුවම මිලදී ගත්තේ මීගමු කඩවීදියෙන් බව පියතුමා ප්‍රකාශ කර ඇත. ඇන්ඩෲ මහතාටත් එවැනි ප්‍රතිමාවක් මිලදී ගැනීමට ආශාවක් ඇතිවූයෙන් මාසලස් පියතුමා සමඟම ගොස් සුරුවමක් මිලදී ගෙන ඇත. ඉන්පසු එය තම බිම් කොටසක කුළුණක් තනා මාසලස් පියතුමා ලවාම ආසිරි ගන්වා එහි තැන්පත් කර ඇත. මෙහි ඉදිරි කාලයේදී දේවස්ථානයක් ගොඩනැගේවායි පියතුමා කළ පැතුම අද ස්ථාපිත වී ඇත. පසුව පියතුමන්ලා හා ගම්වාසීන්ගේ උනන්දුවෙන් මෙහි වාර්ෂික මංගල්‍යයන් ද පවත්වා ඇත.

මුලදී සියල්ල සිදුවූයේ ඉදිගොල්ල දේවස්ථානයේ පියතුමන්ලාගේ උපදෙස් මතය. පසුව මෙම ශාන්ත ජූඩ් බැතිය මීගමු මහවීදිය මීසම වෙත පැවරිණි.

1987 දී මෙම දේවස්ථානයේ රිදී ජුබිලිය පැවැත්විණි. 1994 වසරේදී ශාන්ත ජූඩ් පෙදෙසද ඒකාබද්ධ කර අලුත් මීසමක් පිහිටුවන ලදි. මෙම නව මීසම් භාරව පත්වූයේ ගරු නිහාල් අයිවන් පියතුමාය. මෙතුමා පළමු බ්‍රහස්පතින්දා ආරම්භ කළ රෝගීන්ගේ මෙහෙය නිසා දෙව්මැඳුරට පැමිණෙන බැතිමතුන්ගේ සංඛ්‍යාව වැඩිවිය.

වසර ගණනාවක් ගතවු නිසාත්, බැතිමතුන්ගේ ප්‍රමාණය වැඩිවීම නිසාත් බැතිමතුනට අව්වට වැස්සට ආවරණය සඳහා මුල් දෙව්මැඳුර ප්‍රමාණවත් නොවීය. මේ නිසා නව දෙව්මැඳුරක් ගොඩනැගීම අවශ්‍ය විය. මේ සඳහා අවශ්‍ය ඉඩම් අවට පදිංචි වූවන් විසින් පරිත්‍යාග කළ අතර වෙනත් අවශ්‍ය ඉඩම් ගම්මුන් විසින් මිලදී ගෙන පරිත්‍යාග කර තිබේ.

1996 වාර්ෂික මංගල්‍ය සමයේදී ඒ සඳහා ආරම්භය සිදුවිය. 1997 ඔක්තෝබර් 12 වන දින මංගල්‍ය පූජාවෙන් පසු නව දෙව්මැඳුරට මුල්ගල තැබීම කලාපීය අනුනායක අතිගරු ජෝ වික්‍රමසිංහ පියතුමා අතින් සිදුවිය. මෙම නව දෙව්මැඳුර 1999 මංගල්‍ය පැවැත්වීමට පෙර අවසන් විය. මීසම් සේවක ගරු ලින්ටන් ජෝශප් පියතුමාගේ මඟපෙන්වීම යටතේ දෙව්මැඳුරේ ස්වර්ණ ජයන්ති මංගල්‍යය ඔක්තෝබර් 13 හා 14 දිසාවල පැවැත්වේ.



හල්පේ මීසමේ සා. ප්‍රැන්සිස් සේවියෙර් මුනිඳුන්ගේ දේවස්ථානයට අයත් ආරෝග්‍ය මාතා කොට්ඨාශයේ කිතුනු ඒකක දුවක්, දහම් ගුරුවරියක් වශයෙන් ක්‍රියා කළ දහම් දූතිකාවක දිව්‍ය සංරක්ෂණයේ දියණියෝ නිකායේ පැවදි සොයුරියක ලෙස වේද භාර පොරොන්දු දීමෙන් පසු දෙවිඳුන්ට තුති පුදන්නට සිය ගමේ දේවස්ථානයට පෙරහරින් පැමිණි අයුරු. ඇය ගරු මේරි චාලිකා පැවදි සොයුරියයි.

සිසිල් ඩැනීසියස්

# ජපමාලයේ ඇසූ පිරූ තැන්



**පසුගිය සතියෙන්....**

එක ජපමාල පංතියක් පරමණ්ඩල ආරාධනා යැදුම හා කෙටි "නමෝ මරිය" යැදුම් 10 කින් සමන්විත විය. එම "නමෝ මරිය" යැදුමට තවත් කොටසක් එකතු විය. එය නම් එළිසබෙත් තුමිය විසින් දේවමෑණියන්ට පැවසූ ආශිර්වාදාත්මක වදන වූ "ස්ත්‍රීන් අතුරෙන් ආශිර්වාද ලද්දී ඔබවහන්සේ ය." යන වදන් පෙළයි.

වසර 1382 - 1460 වකවානුවේ දී කාතුසියන් නිකායේ පර්සියාවේ දොමිනික් නම් තාපස තුමා "නමෝ මරිය" යැදුම භාවනාශීලිව යැදීමේ පිළිවෙත හඳුන්වා දුනි. එතුමා එය හැඳින්වූයේ "ජේසු සමිඳුන්ගේ ජීවිත ජපමාලය" යනුවෙන් ය.

ටියර් නම් ග්‍රාමයේ ජර්මන් ජාතික තාපස තුමකු විසින් ශුද්ධ ලියවිලි පාඨයන් උපුටා ගනිමින් ජපමාලයේ සෑම නමෝ මරිය යැදුමකට පෙර භාවිතයට මුල පුරන ලදි. තවද 15 වන සියවසේ දී කාතුසියන් තාපස සහෝදරතුමකු විසින් ජපමාලය පංති 15 කට වෙන් කළ අතර දොමිනිකාන තවත් සහෝදරතුමකු ඒ සෑම ජපමාල පංතියකටම අභිරහස බැගින් යොදන ලදි. එම අභිරහස් සුවිශේෂයේ සඳහන් ජේසු සමිඳුන්ගේ ජීවිත කතාවට අදාළ වූ කරුණු ආශ්‍රිතව සැකසුනි. මෙම අභිරහස් භාවනා කිරීම තුළ නූගත් අයෙකුට පවා බයිබලයේ සඳහන් ජේසු සමිඳුන්ගේ කතාන්තරය දැනගත හැකි වන්නේ ය. මෙම අභිරහස් 5 බැගින් වෙන්කර සොම්නස් - දොම්නස් හා මෝක්ෂ නමින් අභිරහස් 3 කට වෙන් කරන ලදි. එම අභිරහස් සියල්ලෙන් ම පෙන්නුම් කරනු ලබන්නේ ජේසු සමිඳාණන්ගේ මාංශගත වීම, දුක්ප්‍රාප්තිය හා උත්ථානයයි. එමඟින් අභිරහස් පිළිබඳව උනන්දුවත් ජේසු සමිඳාණන් සමඟ මනසින් බද්ධවීමත්, උන්වහන්සේගේ ආශිර්වාදයත්, අභිරහස් කෙරෙහි අපගේ බලවත් විශ්වාසයත් පිළිබිඹු වේ.

15 වන සියවසේ දී විද්වත් ධර්මාචාර්යවරයකු වූ අලානුස් ඩිරූප් නම් දොමිනිකාන පූජාප්‍රසාදිතුමා විසින් ජපමාලය යදින්නන්ට රැකවරණය ආරක්ෂාව මෙන්ම එමඟින් ස්වර්ග රාජ්‍යයට හිමිකැරවීමේ මඟත් ලබා දෙන විවිධ වරප්‍රසාද වලින් සමන්විත වූ "ජපමාල පොරොන්දු 15" සම්පාදනය කළ අතර ජපමාල සංඝයන් බොහොමයක් ද ආරම්භ කරන ලද බව සඳහන් වේ.

වසර 1500 දී තුර්කියේ මුස්ලිම්වරු නැගෙනහිර යුරෝපයේ සිදුකරන ලද විනාශය හමුවේ ජපමාලය එහි ජනතාව අතර ප්‍රචලිත විය. 1453 දි කොන්ස්තන්තිනෝපල් නගරය මුස්ලිම්වරු අතට පත්විය. ඒ හේතුවෙන් හංගේරියාව සහ බෝල්කන් නගර ඔවුන් යටතට පත්වීම ආසන්න විය. ඉතාලියේ වෙරළබඩ ප්‍රදේශය හා මධ්‍යධරණී ප්‍රදේශයත් ඔවුන්ගේ ග්‍රහණයට පත්වීම ඒ අනුව අනිවාර්ය විය.

1571 දී පස්වන පියුස් සුදොතුම් පියා ස්පාඤ්ඤයේ දෙවන පිලිප් රජතුමාගේ සහෝදරයා වූ ඔස්ට්‍රියාවේ දොන් ජුවන් සෙන්පතියාගේ මෙහෙයවීම යටතේ බල ඇණියක් සංවිධානය කරන ලදි. මෙම කටයුතු සිදුවෙමින් පවතින අතර එම සටන ජයග්‍රහණයට දේවාසිරි වරම් ලක්දිවට දෙව් මව්ගේ මැදිහත්වීම පතා ජපමාල උච්චාරණය කරන ලෙස සුදතුම් පියා ජනතාවගෙන් ඉල්ලා සිටි සේක. එම අවස්ථාවේ මුස්ලිම් සේනාව, කිතුනු සේනාවට වඩා වැඩි බව පෙනෙන්නට තිබුණි. එනමුත් කිතු තුමන් කුරුස පත් ලාංඡනය සහිත නිල් පැහැති ධජය පෙරටු කරගත් ක්‍රිස්තියානි සේනාව නොබියව සටන් බිමට පිවිසියේ ය.

1571 ඔක්තෝබර් 07 වන දා ලෙවැන්ටෝ සටනේ දී ක්‍රිස්තියානි සේනාව ජයගත්තේ ය. ඉන් වසරකට පසු එනම් 1572 ඔක්තෝබර් 7 වන දා පස්වන පියුස් සුදොතුම් පියා විසින් ශුද්ධවූ ජපමාල මංගල්‍යය එදින පැවැත්වීම සඳහා ප්‍රකාශයට පත් කරන ලදි. එදින ජයග්‍රහණය සැමරීම පමණක් නොව ඒ ජයග්‍රහණය ලබා දුන් මහෝත්තම දෙවි සමිඳුන්ටත් ඒ සඳහා මැදිහත් වූ මරි මවුන්ටත් ස්තුති කිරීම වෙනුවෙන් එදින උපයෝගී කරගත්හ.

ඒ අතර සුදතුම් පියා විසින් ඔක්තෝබර් 07 වන දින "ජපමාලයේ අප ස්වාමිදුවගේ මංගල්‍යය" ලෙස කතෝලික ලිතට ඇතුලත් කරන ලදි. ඒ සමඟින් ජපමාල ධ්‍යානයේ දී අභිරහස් ත්‍රිත්වය නිල වශයෙන් භාවිතයට ගැනීම සම්මත වුණි. "යාච්ඤාව අන්ධයන්ගේ පුස්තකයයි. එමඟින් ආත්මයට පෙනීමත් මෙලොවේ උපරිම ප්‍රේමය අත්විඳින්නට සලස්වයි. එය සාමාන්‍ය ජනතාවගේ ද පුස්තකයකි. එමඟින් ඔවුනට අධ්‍යාපනය ලැබුනට වඩා වැඩි දැනුමක් හා ගැඹුරක් දැකීමට ඉඩ සලසයි. එය වයස්ගත වූවන්ගේ ද පුස්තකයකි. එමඟින් ඔවුනට ලොවේ අඳුරු ඡායාවන් දැසට හසු නොකර මතුවට අත්වන සුබ දසුන් දකිනට ඉඩ සලස්වන්නේය" යනුවෙන් පවසා ඇත්තේ අතිගරු ෆුල්ටන් ෂීන් අගරදගුරුතුමා ය.

**ජපමාලය භාවනාත්මක යැදුමකි. බැතිමතුන් හට සන්සුන් රිද්මයෙන් මානසික බැඳීමකින් සමිඳුන්ගේ ජීවිත අභිරහස් ගැන භාවනා කිරීමට උනන්දුවක් එමඟින් ලැබේ**

ජපමාලය කෙරෙහි භක්තියක් දැක්වූ භාග්‍යවත් පාද්‍රේ පියෝ තුමා ඒ ගැන මෙසේ කියා තිබේ. "දහම් පතපොත කියවීම තුළින් යමෙකුට දෙවියන් ගැන දැනගත හැකිය. නමුත් භාවනාශීලිව ජපමාලය උච්චාරණයෙන් ඔහුට දෙවියන් හඳුනාගත හැකිය. 19 වන සියවසේ දී ජපමාල ධ්‍යානය කතෝලිකයන් අතර ප්‍රචලිත වීමට බලපෑ ප්‍රධාන හේතුව "ජපමාල පාප්තුමා" ලෙස අන්වර්ථ නාමයෙන් හැඳින්වූ 13 වන ලියෝ සුදොතුම් පියාය. 1878 - 1903 යන එතුමාගේ ධූර කාලය තුළ ජපමාලය සම්බන්ධව පළ කළ කතෝලික සභා විශ්ව ලේඛන 12 සහ අපෝස්තලික සංදේශ 5 ඒ බව සනාථ කරයි. ඒ සමඟින් ඔක්තෝබර් මාසයේ සෑම දිනකම කතෝලිකයන් හට ජපමාලය උච්චාරණය කිරීමට ඇරියුම් කළේය. ඒ සමඟින් ඒ වකවානුව තුළ ශු. ජුසේ මුනිතුමන්ට යදින යැදුමද එකතු කිරීමට අනුමැතිය ලබා දුනි. තවද එතුමා විසින් දේව මාතා ප්‍රාර්ථනාව සඳහා "ජපමාල රාජේශ්වරිය" යන ප්‍රාර්ථනාවද ඇතුළත් කරන ලදි.

පාපොච්චාරණය අවසානයේ දී පියතුමා විසින් දඬුවමක් ලෙස සලකා ජපමාලයේ පංති කීපයක් හෝ සම්පූර්ණ ජපමාලය උච්චාරණය කරන ලෙස ඉල්ලා සිටියත් එය සැබවින්ම දඬුවමකට වඩා ක ළ පව් නැවත ස්මරණය කර සැබෑ පසුතැවීමක් ඇතිකර එමඟින් ආධ්‍යාත්මික වර්ධනයක් ලබාදීමයි සිදුවනුයේ.

සමහර කාලවලදී අන්‍යයන්ගේ පව් සඳහා වන්දියක් ලෙස ජපමාලය පොදුවේ පුදකළ අවස්ථා ද ඇත. එකල ප්‍රංශයේ චැම්බරි ග්‍රාමයේ කන්‍යාරාමයක සිටි පැවදි සොයුරියක වූ භාග්‍යවත් මේරි මාතා චාමබොන් තුමිය විසින් ලොවේ පව් උදෙසා ක්‍රිස්තුන් වහන්සේ වෙත වන්දි ගෙවීමේ ජපමාලයක් සැකසුවාය. එය දේව දයාවේ ජපමාලයට සමාන වූ සැකසුමකි.

දේව වන්දනා පර්ෂදයෙහි ප්‍රකාශනය මඟින් භාවනාව පිළිබඳ ගුණාංග අළලා මෙසේ පවසයි. ජපමාලය භාවනාත්මක යැදුමකි. බැතිමතුන් හට සන්සුන් රිද්මයෙන් මානසික බැඳීමකින් සමිඳුන්ගේ ජීවිත අභිරහස් ගැන භාවනා කිරීමට උනන්දුවක් එමඟින් ලැබේ. තවද එම පර්ෂදය මඟින් ආධ්‍යාත්මික ජීවිතයේ වර්ධනය කෙරෙහි ජපමාලයේ වැදගත්කම අවධාරණය කරයි. රොමානෝ ගාඩිනි ධර්මාචාර්යවරයා විසින් පවසන පරිදි කතෝලිකයන්ගේ අවධානය ජපමාලය වෙත යොමු වන්නේ මරිය තුමියගේ ජීවිතය තුළ ක්‍රිස්තුස් වහන්සේ උද්දීපනය වන බැවිනි. කතෝලිකයන් අතර මරිය බැතිය මරිය තුමිය මඟින් ක්‍රිස්තුන් වහන්සේ කරා යොමු කරවයි. ජපමාල භක්තිය වෙනුවෙන් පෙනී සිටි සාන්ත ලුවී ඩී මොන්ෆට් තුමාගේ ද දැඩි විශ්වාසය එයම විය. මෙම දැක්ම 13 වන ලියෝ සුදොතුම් පියා විසින් අනුමත කරමින් පැවසුවේ මරිය මව්ගේ ජීවිතය තුළින් ක්‍රිස්තුන් වහන්සේ කරා යන ගමනට ජපමාලය ප්‍රබල අත්වැලක් සපයන වගයි. කතෝලික ස්ප්‍රීතුව තුළ වැදගත් තැනක් ජපමාල ධ්‍යානය කෙරෙහි බලපා ඇත.

දොළොස්වන පියුස් සුදොතුම් පියා ඇතුළු අනුප්‍රාප්තිකයන් සෑම දෙනාම ලූර්දු මෑණියන් හා පාතිමා මෑණියන්ට ගෞරව දැක්වීම කෙරෙහි මහත් කාර්යභාරයක් සිදුකරන ලදි. එ සමඟින් ජපමාලය කෙරෙහි කතෝලික සභාවේ නව පිබිදීමක් ඇති විය. දෙවන ජුවාම් පාවුළු සුදොතුම් පියා "රොසේරියම් වර්ජිනිස් මරියේ" නමැති තම අපෝස්තලික සංදේශය ලියන ලද්දේ සා. ලුවි. ඩි. මොන්ෆට් තුමාගේ "පූර්ණ මරිය බැතිය" කෘතිය පදනම් කර ගනිමිනි. 2002 ඔක්තෝබර් 16 දින දෙවන ජුවාම් පාවුළු සුදොතුම් පියා විසින් 2003 වසර "ජපමාල වසර" ලෙස ප්‍රකාශයට පත් කරනලදි. සියවස් ගණනකට පසු පළමුවරට ජපමාලයට නවතාවයක් ලබා දෙමින් අභිරහස් 5 ක් සහිත "ආලෝක අභිරහස්" පංතිය හඳුන්වා දෙන ලදි. එය ජේසුස් ස්වාමිදරුවන්ගේ ජන ජීවිතය අළලා සැකසුනි. වත්මනේ ජපමාලයේ පරමණ්ඩලය හා ත්‍රිත්ව ස්තෝත්‍රය මඟින් බෙදා වෙන් වූ "නමෝ මරිය" යැදුම අඩංගු සමහර අවස්ථාවන්හිදී පාතිමා යැදුමත් සමඟ ජපමාල ධ්‍යානය භාවිත වේ. මෙසේ සභාව තුළ කාලයට අනුව වෙනස්වීම ජපමාලය "ජීවි යැදුමක්" බවට සපථ කරනු ලබයි.

2008 මැයි 03 වන දින දහසය වන බෙනඩික් සුදොතුම් පියා ජපමාලය නව වසන්තයක් කරා එළඹ ඇතැයි සනිටුහන් කරමින් "ජේසු සමිඳාණන් හා එතුමන්ගේ මව වන කන්‍යා මරියාවන්ට, තරුණ පරම්පරාව විසින් දක්වන ආදරයේ මහඟු ප්‍රේමයේ සංකේතය වන්නේ "ජපමාලය" යනුවෙන් පවසා ඇත. ඉතිහාසයේ ගැලවීම සඳහා හේතු වූ සෑම අවස්ථාවකම භාවනාත්මක ප්‍රවේශය ලබා දීමට ජපමාලය හේතුවක් වූ බව එතුමාගේ පිළිගැනීම විය. 20 වන සියවසේ දී සෑම ජපමාල පංතියක් අවසානයේ පාතිමා යැදුම භාවිතයට පත් වුණි.

ප්‍රංශ ජාතික ලුවී ඩි මොන්ෆට් පියතුමා විසින් රචිත "ජපමාලයේ රහස්" නම් කෘතියේ ජපමාලයේ බලය හා එහි වැදගත්කම බලවත් ලෙසින් පැහැදිලි කර තිබුණි. එමෙන්ම එහි ජපමාලය උච්චාරණය කිරීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි සහ යෝග්‍ය වූ පිළිවෙත හඳුන්වා දුනි. එනම් ජපමාලය කෙරෙහි පූර්ණ අවධානය, කැපවීම හා ගෞරවාන්විත බව රැකෙන පරිදි සෑම නමෝ මරිය යැදුමක් හා අනෙකුත් යැදුමන් උච්චාරණය කිරීමේ දී එහි වදන් අතර මද විරාමයකුත් යාච්ඤා අතර කෙටි විරාමයකුත් සහිතව සන්සුන්ව ඉටුකළ යුතු බවයි.

මෙලෙස ජපමාලයේ අන්තර්ගතය කලින් කලට වෙනස් වූවත් එහි මූලික පදනම එලෙසින්ම නිරන්තරව ආරක්ෂා විය. එමඟින් දේව මෑණියන් හා ඇගේ පුත් ජේසු සමිඳාණන්ගේ ජීවිතයන් පිළිබඳ දැනුවත් වීම හා භක්තිය අප දේව ජනතාව තුළ සදානුස්මරණය කිරීම සඳහා උපයෝගී විය. එම බැහැපත් චේතනාව ජපමාල ධ්‍යානය තුළ දී අප පවුල් තුළ සදාකල්හිම පවතීවා! -නිමි-

**සිරිල් පෙරේරා**
ඇතුගල්පුර නින්නාද සංසදය

---

**පසුගිය සතිය හා සබැඳේ....**



**සභා පියවරු** 47 කොටස

**මහාචාර්ය ඇන්ටන් මීමන විසිනි**

## අපෝස්තුළුවරු දොළොස් දෙනාගේ ඉගැන්වීම හෙවත් ඩිඩාකේ - 5

නමුත් මරණයේ මාර්ගය නම් මෙයයි. එය නපුරු සහ මුළුමනින්ම දෙවියන් වහන්සේට අපහාස කරවයි, මිනිමැරීම්, පරදාර සේවනය කිරීම්, කාම රාගයන්, කාමයේ වරදවා හැසිරීම්, සොරකම් කිරීම්, බොරු දෙවිවරු ඇදහීම්, යන්ත්‍ර මන්ත්‍ර කිරීම්, අනවින, සූනියම් කිරීම්, මංකොල්ල කෑම්, බොරු සාක්ෂි දීම්, කෛරාටිකකම්, දෙපිටකාට්ටු කම්, වංචාවන්, අහංකාරකම්, ද්වේෂය, හිතුවක්කාරකම, මානාධිකකම, පුරසාරම් දෙඩීම යනාදියයි.

යහපත් මිනිසුන්ට පීඩා කරන්නන්, සත්‍යයට වෛර කරන්නන්, බොරුවලට ආදරය කරන්නන්, ධර්මිෂ්ඨකමේ ප්‍රතිඵල පිළිබඳව අඥානව සිටින්නන්, යහපත් දේවල් වලට පක්ෂපාතිත්වය නොදක්වන්නන්, සාධාරණය නොතකා හරින්නන්, යහපත නොව නපුර ගැන අවදියෙන් සිටින්නන්, යනාදීන් මෘදු බවින් සහ ඉවසීමෙන් දුරස්ථව ජීවත් වේ. එවැන්නන් පුහු මාන්නයට ආදරය කරති. ධන ලාභය පසු පස හඹා යති. දුප්පතුන් සඳහා කිසිදු දයා කරුණාවකින් විරහිත වෙති. පීඩාවට පත්වූවන් උනදෙසා වැයවී කටයුතු නොකරති.

ඔවුන්ගේ මැවුම්කරුවාණන් අමතක කර දමති. ළමුන්ව මරා දමති. දෙවියන් වහන්සේගේ ස්වරූපය විනාශ කර දමති. අසරණයන් සඳහා කිසිදු උදව් උපකාරයක් නොකරති. දුකින් සිටින්නවුන්ව තවත් පීඩාවට පත් කරති. ධනවතුන්ව ආරක්ෂා කරති. ඉතා අසාධාරණ ලෙස දුප්පතුන්ව හෙළා දකිති. ඔවුන් මුළුමනින්ම දුෂ්ඨය. මාගේ දරුවෙනි, නුඹලාව මේ හැමදෙයකින්ම ගලවා ගනු ලැබේවා!

මෙම උගැන්වීමේ මාර්ගයෙන් කිසිම පුද්ගලයෙක් නුඹලාව වැරදි මාර්ගයට නොපෙළඹවීමට වග බලා ගත යුතුයි. එවැනි පුද්ගලයකුගේ උගැන්වීම් දේව විරෝධී උගැන්වීම් වේ.

ස්වාමීන් වහන්සේගේ සම්පූර්ණ වියගසම නුඹට දැරිය හැකි නම් නුඹ සර්ව සම්පූර්ණ වන්නේ ය. නුඹට එය එසේ නොකළ හැකි නම්, නුඹට කළ හැකි දේ පමණක් උපරිමයෙන්ම කරන්න.

ආහාර පාන සම්බන්ධයෙන් නුඹට හැකි සෑම දෙයක්ම භාවිතා කරන්න. නමුත් වෙනත් දෙවිවරුන්ට පුද කරන ලද ආහාර අනුභව කිරීමෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටින්න. එසේ කළහොත් එයින් අදහස් කෙරෙන්නේ ජීවත්ව නොසිටින දෙවිවරුන්ට වන්දනාමාන කිරීමයි.

බෞතිස්ම ස්නාපනය සම්බන්ධයෙන් උගැන්වීම මෙසේය. බෞතිස්ම ස්නාපනය කළ යුත්තේ මෙසේ ය. මේ සෑම දෙයක්ම සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ උගැන්වීම් ලබා දිය යුතුයි. ගලා යන ජලයක බෞතිස්ම ස්නාපනය කළ යුතුයි. "පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන් වහන්සේගේ ද නාමයෙන්" එය සිදු කළ යුතුයි. ගලා යන ජල ප්‍රවාහයක් නොමැති නම්, වෙනත් ජලයක එය කරන්න. සීතල ජලයක කළ නොහැකි නම්, උණුසුම් ජලයක එය කරන්න. මේ දෙකම නොමැති නම් "පියාණන්ගේ ද, පුත්‍රයාණන්ගේ ද, ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන්" කියා තුන් වරක් ජලය හිස මත වත් කරන්න.

**ලබන සතියට....**

ජන වන්දනාව

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්

## පළමු සතිය සෙනසුරාදා සැඳෑ යාම යැදුම

### 119 වැනි ගීය (වගන්ති 105 - 112)

මීට ඉහත අප සඳහන් කළ පරිදි 119 වැනි ගීය ප්‍රඥා ගී කාණ්ඩයට අයත් වන්නකි. සැඳෑ යාම යැදුම සඳහා තෝරාගන්නා ලද ව. 105 - 112 කොටස පුරාණ ගිවිසුමේ ජනතාවගේ ආධ්‍යාත්මිකත්වය පදනම වන ව්‍යවස්ථාව මත පදනම්ව ඇත.

**ලේඛන සැලැස්ම**

මේ ගී අනුබණ්ඩය 119 වැනි ගීයේ 14 වැනි කොටසට අයත් වන අතර එය ඇරඹෙන්නේ හෙබ්‍රෙව් හෝඩියේ 14 වැනි අක්ෂරය මුල් කරගෙනය. මෙහි අන්තර්ගතය තුළ “දෙවියන් වහන්සේගේ වචනය” (හෙබ්‍රෙව් බසින් “දබාර්”) යන සංකල්පය හා ඊට සමාන සංකල්ප රැසක් ද යොදා ඇති සැටි පෙනේ. තේමාව වශයෙන් ඉස්මතු වන්නේ “සමිඳුන්ගේ ව්‍යවස්ථාව එළිය වේ” යන අදහසය. ගීතිකා කතුවරයා මේ සැකැස්ම තුළින් දේව වචනය වෙත ඇති සිය අසීමිත හා හෘදයාංගම බැඳීම විදහා පාන්නේ ය.

**විග්‍රහය සහ අර්ථය**

පහනක්ය: ප්‍රඥා සාහිත්‍යය තුළ පහන සංකේතවත් කරන්නේ නිවැරදි ඉගැන්වීම් හා හික්මීම තුළින් හැඩ ගැසුනු හැසිරීම් රටාවකි. එය දැහැමි සැදැහැවතකුගේ දිවි මගේ සදාචාරයීය ගුණාංගවල බලපෑම මනාව පැහැදිලි කොට පෙන්වයි. (හිතෝප 6:23, ගීතා 18:28).

සතුටු පූජා පිළිගෙන : දෙවියන් වහන්සේගේ අසීමිත යහපත්කම හා දයා කරුණාව ඉදිරියේ දේව ජනතා ප්‍රතිචාරයේ වැදගත් පැතිකඩක් වන්නේ ස්තුති ප්‍රශංසාවයි. එයින් ඇදහිලිවන්තයාගේ යාගික ආකල්පය ද ඉස්මතු කොට දැක්වෙන්නේ ය (ගීතා 50:14, හෙබ්‍රෙව් 13: 15).

ඔබ උදෙසා දිවි පිදීමට : මුල් හෙබ්‍රෙව් පිටපතට, අනුව මෙය “මාගේ ප්‍රාණය මාගේ අත මත රැඳී ඇත” යනුවෙන් පරිවර්තනය කළ හැකිය. මෙය තුළින් ගීතිකා කතුවරයා මුහුණ දී සිටින අනතුරුදායක තත්ත්වයන්,

**ගීතාවලිය**



ශුද්ධ ලියැවිලි වසර

**(31)**

**ගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

එවැනි තත්ත්වයක සිටිමින් ඔවුහු දෙවි සමිඳාණන්ගේ වචනය හා ව්‍යවස්ථාව කෙරෙහි දක්වන කැපවීම ප්‍රබලව ධ්වනිත වේ (ජුදිත් ග්‍රන්ථයේ 12:2 හි සංදර්භය මීට සමාන්තරව දැකිය හැකිය.

උරුම කොට ගනිමි : ජීවිතයේ අනාගත සුරකි බව සැම මනුෂ්‍යයකුගේ හදවත ප්‍රාර්ථනාවකි. හෙබ්‍රෙව් බසින් යෙදෙන “නහල්” වදන උරුමය නැතහොත් “දායාදය” යන්න හඟවයි. එය දෙවි සමිඳාණන් වහන්සේ වෙතින් සැදැහැවතාගේ ඉරණම නොහොත් අනාගත ශුභ සිද්ධිය අරබයා දිව්‍ය සංරක්ෂණය යොමුවීමේ යථාර්ථයයි (ගීතා 16:5).

මරණය දක්වා : දෙවි සමිඳාණන්ගේ ව්‍යවස්ථාවට ඇති කැපවීම ගීතිකා කතුවරයා ඉදිරිපත් කරන්නේ දිවුරුම් දීමක් ලෙසය. ඉන් එහි වැදගත්කම මෙන්ම බැරෑරුම්කම ද හැඟවේ (ලෙවී 19:12, ජෙරමියා 4:2).

**යැදුම :**

මුළු විශ්වය මවා එය ප්‍රඥාවෙන් හසුරුවන දෙව්පියාණන් වහන්ස, ඔබවහන්සේගේ ව්‍යවස්ථාව අප ජීවන මඟට පහනක් වන්නේ ය. ඔබවහන්සේ නිරතුරුව අප දිවියට තිළිණ කරන එළියට හා ශක්තියට තුති පැසසුම් දෙමු. ජීවිතයේ විවිධ සිදුවීම් හා අභියෝග මැද ඔබවහන්සේගේ ශුද්ධවූ අභිමතය හඳුනාගෙන ජීවත්වීම සඳහා අපගේ මනස් පැහැදුව මැනව. අපගේ හදවත් සංවේදී කළ මැනව. එමගින් ජීවිතයේ සැබෑ පලදැරීමකට අපව යොමු කළ මැනව. ආමෙන්.

**ලබන සතියට**

---

**ගරු හෙන්රි සිල්වා පියතුමා** **55**




# පුරාණ ගිවිසුම තුළ දිවැසිවරු

පසුගිය සතිය හා සබැඳේ

### 6. දිවැසිවරුන්ගේ යුගාන්ත ධර්මය

අනාගතය සම්බන්ධ දේශන -

දිවැසිවරුන් අතර යුගාන්තවාදී ඉගැන්වීම් සිරස් තල තුනක් යටතේ අවබෝධ කර ගත හැකි වෙයි.

1. මතු දිනකදී දේව ජනතාව පුනරුත්ථානය කරනු ලැබීම.
2. ස්වාමින් වහන්සේගේ දවස
3. එළිදරව්වාදී දැක්ම ( ආකල්ප)

1. දේව ජනතාව පුනරුත්ථානය කරනු ලැබීම (එසකි. 36/24-30)

24 වන වගන්තිය

මෙම ප්‍රතිසංස්කරණයේ පළමු අදියර සමාජයීය මෙන්ම දේශපාලනික ද වෙයි. එබැවින්, විප්‍රවාසිගතවූ ජනතාව විසිරී සිටි ප්‍රදේශවල සිට ඔවුන්ගේ දේශයට යළි ගෙන එනු ලැබේ. මෙය, තමන්ගෙන් පැවත එන ජනතාව දේශය උරුම කර ගන්නා බවට ආදිපිතුරුවරුනට දෙන ලද පොරොන්දුවට එකඟව සිදුවන්නකි. (උත්. 15, 18-21 සහ 17, 8 )

25 වන වගන්තිය :

ප්‍රතිසංස්කරණයේ දෙවන අදියර වන මෙහි අන්තර්ගතය වන්නේ රූප වන්දනාවේ යෙදුනු සෙනඟ, තම පාපයන්ගෙන් පවිත්‍ර කරනු ලැබීමය. පවිත්‍ර කිරීමේ ආගමික පිළිවෙතක් පිළිබඳව මෙහි සඳහන් වෙයි. එබැවින් මේ සියල්ල අවධානය යොමු කරනුයේ පුද්ගලයාගේ සිත් හැරීම වෙතය. සිත් හැරීම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද යන්න මෙහිදී අවබෝධ කර ගැනීම වැදගත්ය. සාමාන්‍යයෙන් ඒ සඳහා භාවිත වන හෙබ්‍රෙව් වචනය, සම්පූර්ණයෙන් ආ පස-සට හැරීම යන අර්ථය දෙන “ෂුබ්” යන්නය. එනම් අයහපත් මාර්ගයෙන් ඉවත්ව නිවැරදි මාර්ගයට යළි පිවිසීමය. ග්‍රීක භාෂාවෙන් එය, මූලික ආකල්පමය වෙනසක් අදහස් කරන “මෙටනොයියා” නම් වෙයි (මනස්ථාපය).

26 වන වගන්තිය :

ප්‍රතිසංස්කරණයේ තෙවන අදියර වනුයේ, අනිවාර්යයෙන් සිදු විය යුතු දේව ජනතාවගේ ආධ්‍යාත්මික ගොඩ නැගීමයි. පුනරුදයයි. “මම අලුත් හදක් නුඹලාට දී අලුත් සිතක් නුඹලා තුළ මවා”, හෙබ්‍රෙව් චින්තනයට අනුව හදවත හඳුනා ගැනුනේ මිනිසකු තුළ වඩා උසස් වූ උත්තරීතරවූ සියලු ක්‍රියාකාරීත්වයන් හසුරුවන කේන්ද්‍රීය අවයවය ලෙසය.

එබැවින් දැඩි සිත (ගල් සිත) වෙනුවට අවනත සිතක් (මාංශයෙන් වූ සිතක්) ආදේශ කිරීම මෙහි දැක්වේ. අලුත් සිතක් යන්නෙන් අදහස් වන්නේ, නව ආකල්පයකි. නැතහොත් නව දැක්මකි. එලෙස මෙම වගන්තිය ඉඟි කරන්නේ පූර්ණ අභ්‍යන්තර පරිවර්තනයක් නැතහොත් ඇතුලාන්තය සම්පූර්ණයෙන් නවතාවයට පත්වීමක්ය.

27 වන වගන්තිය :

“මාගේ ආත්මානුභාවය නුඹලා තුළ නිදන් කොට”. දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය හැමවිට හඳුනා ගැනුනේ ඔවුන් වහන්සේගේ මැවීමේ හා ගැලවීමේ ක්‍රියාකාරීත්වය ලෙසය. එබැවින්, දේවාත්මානුභාවය, යම් අයකු තුළ පැවැතීම මගින් මූලික වෙනසක් ඔහු තුළ ඇති කරනු ලැබීය. එලෙස ආත්මානුභාවය දානය කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස, නීතියෙහි නිදන්ව ඇති දේව කැමැත්තට අවනත වීමේ ස්වභාවයක් පුද්ගලයකු තුළ ඇති වෙයි. ඔහු දේව කැමැත්තට හිස නමන, නීතිය පිළිපදින පනත් අනුසාර කරන පුද්ගලයකු බවට පත්වෙයි. ජෙරමියා 31, 33 සඳහන් වන පරිදි එය මිනිසා තුළ නීතිය ඇතුළාන්ත ගත කිරීම වෙයි. ඒ අනුව, දේව නීතියට කීකරු වීම ඇදහිලිවන්තයකු තුළ ස්වභාවිකව සිදුවන ක්‍රියාවලියක් බවට පත් වෙයි. මෙය මිනිසා තුළ දේවානුභාවය ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයකි.

28 වන වගන්තිය :

“ මා විසින් නුඹලාගේ පියවරුන්ට දෙන ලද දේශයෙහි නුඹලා වාසය කොට.” මෙයින් අදහස් වන්නේ ආදිපිතුරුවරුන්ට දෙන ලද පොරොන්දු පවා, ඉශ්රායෙල් ජනතාව තමන් ආධ්‍යාත්මික නවතාවයකට පත් කර ගැනීමෙන් තොරව ස්වයංක්‍රියව ක්‍රියාකාරී නොවන බවය. එලෙස, දේව පණත් අනුසාර කිරීම, දේශය උරුම කර ගැනීම සඳහා අවශ්‍ය කොන්දේසියක් බවට පත්වෙයි. “ මාගේම සෙනඟව සිටිනු ඇත. මම ද නුඹලාගේ දෙවියන් වහන්සේ වන්නෙමි.” මෙය, දෙවියන් වහන්සේ හා ඔවුන් වහන්සේගේ ජනතාව අතර පවතින සබඳතාවය ප්‍රකාශ කෙරෙන ගිවිසුම් ව්‍යවහාරයයි.

29 වන වගන්තිය :

“බහුලව ධාන්‍ය උපදවා දී ඒවා වැඩි කරන්නෙමි” මෙය ගිවිසුමට අදාළ ආශිර්වාද ක්‍රියාත්මක වීමකි. නිද. ද්වි.නි. 28 දීර්ඝායුෂ, නිරෝගී සුවය, දේශයේ සශ්‍රීකත්වය හා සෞභාග්‍යය ද මෙම ආශිර්වාදයන්හි ඇතුලත් වේ.

**ලබන සතියට....**

---




# “ඔබට එක අඩුපාඩුවක් ඇත”

## ඔක්තෝබර් 14 - සාමාන්‍ය සමයේ විසිඅටවන ඉරුදින

*මිනිසා තුළ වස්තුවට හා මිල මුදලට ඇත්තේ පුදුමාකාර ගිජුකමකි. ඒවා වෙත හඹා යන තරමට තව තවත් වස්තුව දෙවියන් කරගන්නා අය සිටිති. මිනිසාට වස්තුව සෙවීමේ සීමාවක් මෙලොවදී පෙනෙන්නේ නැත. ඔහුට මෙලෝ දිවිය අමරණීය දෙයක් බව මිරිඟුවක් සේ දිස්වන්නේ ය. වස්තුව මගින් මිනිස් සන්තානයේ ඇති පිපාසය නැති කරනු වෙනුවට තව තවත් පිපාසය වැඩි කරන්නේ ය. එපමණක් නොව මිනිසා තුළ අත්දකින තනිකම වැඩි කරන්නේ ය. මිල මුදල් මගින් තණ්හාව අසීමිත ලෙස වැඩි කරන්නේ ය. එවිට අසල්වැසියන් පමණක් නොව නෑ හිත මිතුරන් ද ඈත් වන්නේ ය. අවසානයට කිසිම දෙයක් හෝ කිසිම කෙනෙක් හෝ තමාගේ සහයට නොසිටින්නේ ය. මේ යථාර්ථය දන්නේ ජේසුස් වහන්සේ පමණි. ඒ නිසාය උන්වහන්සේ සියලු වහල්කම් වලින් මුදාගෙන උන්වහන්සේ සමඟ ගමන් කරන්නට ආරාධනා කරන්නේ*

**සදාතනික ජීවිතය උරුම කර ගැනීමට**

සදාතනික ජීවිතය ලැබීම හා පනත් පිළිපැදීම අතර ගැටලුවක් මෙහිදී ඉස්මතු කරන බව පෙනෙන්නට තිබේ. නීති රීති මිනිසාගේ යහපත සඳහාමය. මූලික වශයෙන් යා යුතු දැහැමි මඟ පෙන්නුම් කරන අතර ඉන් සෑහීමකට පත්වීම ප්‍රමාණවත් නොවේ. සදාතනික ජීවිතය සොයා ගැනීමට මිනිසා තුළ ඇති පිපාසය නැවත නැවත මතුවේ. මෙලොව ජීවිතය ඊට සූදානම් වන අතර මේ දෙක වෙන් කළ නොහැක. සදාතනික ජීවිතය යනු මිනිසා වෙත දෙනු ලබන තෑග්ගක් මෙන්ම වඩා මිනිසා තුළින්ම පැන නගින බලවත් ආශාවකි. වෙනත් වචන වලින් කිවහොත් මෙලොව වස්තුව කෙතරම් තිබුණද ඒවායින් මිනිසා තෘප්තිමත් කළ නොහැකිය.

**ඔබට එක අඩුපාඩුවක් ඇත. ඔබ සතු සියල්ල විකුණා දිළිඳුන්ට දෙන්න**

“ඔබට එක අඩුපාඩුවක් ඇත” යන්න අද මටත් ඔබටත් ජේසුස් වහන්සේ එල්ල කරනු ලබන ප්‍රශ්නයකි. ව්‍යවස්ථාවේ නීති රීති වලට අවනතව ක්‍රියා කළ ද ඔහු තුළ තිබූ ලොකු අඩුව දැක්කේ එම මිනිසා නොව ජේසුස් වහන්සේ ය. මෙලොව වස්තුව තුළ සිරවී තමාටම ආවේනික වූ දහමක් හදාගෙන තමා පමණක් නිවැරදියි යන සම්මතයේ එල්ලී ක්‍රියා කරන අයට මෙය ලොකු අභියෝගයකි.

**ස්වර්ගීය සම්පත් හා මෙලොව සම්පත්:**

ස්වර්ගීය සම්පත් හා මෙලොව සම්පත් අතර පරස්පර භාවය පෙන්නුම් කිරීමට ගත් උත්සාහයක් මෙම හමුවීම තුළ දකින්නට ඇත. පුරාණ ගිවිසුමට අනුව දේව ගරුබිය දක්වන්නාට වැඩි වැඩියෙන් වස්තු සම්පත් හිමිවන බවට පිළිගැනීමක් තිබුණි. (ද්විතිය නීති සංග්‍රහය 28:1-14; ජෝබ් :9-10; 42/10). මෙම මතය තුළ පිහිටා මෙම පුද්ගලයා කටයුතු කරන බව පෙනේ. ඔහු තුළ ඇති අඩුව දැනුන නමුත් එය පැහැදිලි ලෙස අවබෝධ කරගන්නට අපොහොසත් වූ බව පෙනෙන්නට තිබේ. දේව කැමැත්තට නතු වන්නාට වස්තුවත් තිබිය හැකි අතර වස්තුව ඇති සැම කෙනාම දේව කැමැත්තට නතු වී ඇති බවක් ඉඟි නොකෙරේ. මන්ද අධර්මිෂ්ඨ ලෙස උපයන දේ මිනිසුන් අයිතිකරගෙන ඇති අතර ඒවා වැඩිකල් නොපවතී. මෙම තැනැත්තා වස්තුවෙන් පොහොසත් වුවද දේව කැමැත්තට හිස නමන්නට කැමති නැත. එපමණක් නොව තමා සතු ධනයෙන් දුප්පතුන්ට උදව් කිරීමට අවශ්‍යතාවයක් ඔහු තුළ නැත. දුප්පතුන් අතර විසූ ජේසුස් වහන්සේ එම ජනතාවට සමාජයේ ඇති හැකි අයගෙන් සිදුවී තිබූ අසාධාරණකම් දැක්කා විය හැකියි. මෙලොව අපට ධන සම්පත් හිමිවන්නේ නැති බැරි අය හා බෙදා ගන්නට බව පිළිගන්නට සූදානම් නැත.

**දේව රාජ්‍යයට ඇතුළු වීම :**

මෙලොව රාජ්‍යය හා දේව රාජ්‍යය අතර පරස්පරභාවය කොතෙක්ද? මේ දෙකම එකවර අයිති කරගත හැකිද? ඔබ සතු සියලු දේ විකුණා දිළිඳුන්ට දෙන්න යන නියමයෙන් කුමක් අනාවරණය කෙරේද? මෙලොව වස්තුව ඇත්තේ එලොව වස්තුව උපයා ගන්නටයි. එසේ කිරීමට මෙලොව වස්තුව ත්‍යාජ කළ යුතුවේ. පිනට දිය යුතුවේ. හිස්විය යුතුවේ. දෙවිඳුන් මත පමණක් යැපිය යුතුවේ.

**පොහොසත් තරුණයා;**

ලූක් තුමාට අනුව ඔහු පාලකයෙකි (ආර්කොන්), මතෙව් තුමාට අනුව තරුණයෙකි (නොආනීස්කොස් ) මාක් තුමාට අනුව එක්තරා මිනිසෙකි (එයිස්). සමහර විද්වතුන්ට අනුව ධනය ඇති ඔහු ආගමික නායකයකු විය හැකිය. යහපත් බව ලබා ගන්නට මාර්ගය ඔහු බොහෝ දුරට දැන සිටියා විය හැකියි. මොහු බාහිරින් ලොකු ශ්‍රද්ධාවත් බවක් ජේසුස් වහන්සේට පෙන්වුවද අභ්‍යන්තරයෙන් උන්වහන්සේට සවන් දීමට සූදානම් නැත. ඔහුගේ අකමැත්තේ ගැඹුර පෙන්වීමට “මලානිකවී දොම්නසින් පිරී” යන ව්‍යවහාරය භාවිත කර ඇත. මෙහිදී දිව අවුත් දණින් වැටී, ජේසුස් වහන්සේ හමුවේ “ගුරු දේවයිනි” කියා අමතන්නට ඔහුව පෙළඹවූයේ කුමක් ද? සමහර විට ඔහු සකේවුස් මෙන් උන්වහන්සේ පැමිණෙන තෙක් බලා සිටි අයෙකු විය හැකිය.

**සිතන්න:**

1. භෞතික වශයෙන් මා ලබා ඇති දියුණුව පිටුපස මට උදව්කළ අය මම ගෞරවයෙන් සිහිපත් කරනවාද?
2. ධන සම්පත් පසුපස යාමට ඇති මගේ අධික ආශාව කොතෙක් දුරට මා පවුලෙන් අසල්වැසියාගෙන් හා දෙවිඳුන්ගෙන් ඈත් කර තිබේ ද? 3. මිල මුදලට ඇති අධික ආශාවෙන් මිදෙන්නට මම කොතෙක් දුරට ස්වාමින් වහන්සේට සවන් දෙන්න සූදානම් ද? මමත් උන්වහන්සේ හමුවීමට වැඩි ආශාවකින් පැමිණි පොහොසත් තරුණයා මෙන් මලානික වී දොම්නසින් පිරී ආපසු යන්න යනවාද?

**ගරු උපුල් සිල්වා පියතුමා**

# දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට විභාග කුමටද ?

**කතුතුමනි,**

මේ දිනවල ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම සිදුවේ. නොයෙක් ආකාරයේ පුහුණු වැඩසටහන්ද මේ සඳහා සිදුවේ. එහෙත් මේ සියලු පුහුණුවීම් අවසානයේදී එක් දෙයක් අනිවාර්යයෙන් සිදුවිය යුතුය. එනම් වයස සම්පූර්ණකර ඇති සියලු දරුවන් ක්‍රිස්තුන් වහන්සේගේ දිව්‍ය භෝජනයට කැඳවීම ලැබිය යුතුය. මෙම සටහන මා දක්වා සිටිනුයේ මෙවන විට එක්තරා කතෝලික පාසලක දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබන දරුවන් සඳහා විභාගයක් පවත්වා ඉන් අසමත්වන දරුවන්ට මෙම උතුම් දේව ප්‍රසාද නිධානය අහිමි කිරීමට කටයුතු යොදා ඇති නිසාය.

ක්‍රිස්තුන් වහන්සේ තම ශරීරය හා රුධිරය මුල්වරට බෙදා ගත්තේ සිය ගෝලයින් සමගය. එදින ගෝලයින් සඳහා විභාගයක් පැවැත්වූයේ නැත. එසේම දක්ෂයින් - අදක්ෂයින්, බුද්ධිමතුන් - නූගත්, ඇති අය - නැති අය කියා භේදයක් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ නැත. සිරකරුවන්, මන්ද බුද්ධිකයන්, මරණය අභියස සිටින රෝගීන්ට පවා මේ ආත්මික භෝජනය දානය කරන පියතුමන් අප දැක ඇත. එසේ තිබියදී විභාගයෙන් සමත්වන සිසුන්ට පමණක් පාසලින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා දෙන්නටත්, අසමත් වන සිසුන්ට මීසමෙන් එය ලබාගන්නා ලෙස කියන්නේ නම් එහි වරදක් තිබේ. පාසලේදී ලබන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගමේ පල්ලියෙන් ලබන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට වඩා උතුම් යන වැරැදි අවබෝධයක් ඉන් ලබාදීමය. එසේම විභාගය අසමත් වීම නිසා යම් දරුවකුට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා නොදී අනෙක් සහෝදර සිසුන්ට එම ප්‍රසාද නිධානය ලබාදීමෙන්, දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළ බෙදා ගැනීමේ උතුම් ගුණාංගය දරුවන්ගෙන් ඈත් කරයි. එය ක්‍රිස්තුස් වහන්සේට කරන්නාවූ ගෞරවයක් නොව නිග්‍රහයකි.

මේ නිසා දරුවන්ට යාච්ඤා කියාදීම, පුහුණු කිරීම. පාපොච්චාරණය කරවීම වැනි ක්‍රියාදාමයන්ට අමතරව තවත් යමක් එක් කිරීමේ අරමුණින් විභාග පැවැත්වීම නොහොබිනා බව අපගේ අදහසයි. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේට ගරු ගාම්භීරත්වයක් ලබාදීම, සිසුන්ගේ උනන්දුව වැඩි කිරීමට උපායක් ලෙස මෙම විභාගය පැවැත්වුවා දැයි නොවැටහේ. එහෙත් මෙයින් සිදුවී ඇත්තේ දරුවා තුළ මෙන්ම දෙමාපියන් තුළ අනවශ්‍ය බයක්, සැකයක්, ආතතියක් ඇතිවීම පමණි.

**රවීන්ද්‍ර හේරත්**
කොට්ටාව

# දළදා පෙරහර සිහිගන්වන, ජීවමාන සත්ප්‍රසාද පෙරහර

**කතුතුමනි,**

පසුගිය දිනයක සීදුව මීසමේ පවත්වන ලද දිව්‍ය සත්ප්‍රසාද මංගල උලෙළේදී ජීවමාන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඇතකු පිට වැඩ මවා (දළදා පෙරහර සිහිගන්වමින්) වීදි සංචාරය කළ කිතුනු පෙරහරක් ගැන (2012.9.30) දින ප්‍රදීපය මුල්පිටුවේ පලවුන සේයාරුව සමඟ වූ විස්තරය දැක අපි මහත්සේ කම්පාවට පත්වුනෙමු.

දෙවියන් වහන්සේ ලෝකය මවා, විවිධාකාර වනසතුන්ද ගව මහිෂ ආදි සතුන්ද පොළොවෙන් උපද්දවූ බව ශුද්ධවූ බයිබලයේ මැවිල්ල පිළිබඳ පළමු කථාවේ සඳහන්ව ඇත. ඉන් ඉක්බිති එදා මෙදා තුර මිහිපිට ජීවත්වූ මිනිසා විවිධ වූ ආගම් අදහමින් තම තමන්ගේ ආගම් අනුව චාරිත්‍රයන් සිදු කිරීමට ඇත්, අැස්, ගව ආදි සතුන් යොදා ගනිමින් උන් තමන්ගේම කරගත්හ. ඒ අනුව බොදු බැතිමතුන් ඔවුනගේ මුදුන් මල්කඩ වන දළදා වහන්සේ වීදි සංචාරය කිරීමට ඇතකු යොදා ගනිති. රැලි පිට රැලි ආවත්, රැල්ලට හසුනොවී, චිරාත් කාලයක සිට පැවතෙන ඔවුන්ගේ, සම්ප්‍රදායන් චාරිත්‍ර කිසිම දිනක වෙනස් නොකරනු ඇත. එහෙත් ඉහත සඳහන් මීසම තුළ ජීවමාන දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වෙනත් ආගමකින් (කොපි කරන ලද) දළදා පෙරහරට ඉතා සමීප ලෙසින් වීදි සංචාරය කරවූ දසුන දකින අප දෙඅත්ලෙන් මූණවසාගෙන හැඬිය යුතුය.

ඒ තරමට ඒ දසුන දේව අපහාසයක් ලෙස හඳුන්වමු. හේවිසි, ගැටබෙර, උඩපහත රට නැටුම් අපේ සංස්කෘතිය හා බැඳුනත් අවශ්‍ය තැන්හිදී ඒවාට මුල්තැන දීම වරදක් යයි නොකියමි.

එහෙත් ජීවමාන සමිඳුන් ජයෝත්සවයෙන් වැඩම කරවද්දී, අන්‍යාගමික වන්දනා ක්‍රම අනුකරණය කිරීම, සීදුව දෙව්මැඳුරේ, දිව්‍ය සත්ප්‍රසාද මංගල්ල පෙරහර සංවිධානය කළ කිතුනුවන්ටත්, අනතුරුව ඒ ආභාෂය ලැබ තවත් කිතුනු සංවිධානයක්, වෙනත් දහමකින් සොරා ගත් වන්දනාක්‍රමයන් එළිදක්වන්ට අදහස් කරනවානම්, ඉන් බැහැර වෙන ලෙසත් කරුණාවෙන් ඉල්ලමු.

**පී. වී. ඩී. ලූවී මයිකල්**
කපුවාගාර



# අනාගත ආයෝජනයකට පොත්පත් හුරුකරවමු

**කතුතුමනි,**

විශ්වයේ ආරම්භයත් සමග සෑම භෞතික සම්පතකටම ආවේනික වූ හඬ ශබ්දයක් හා රිද්මයක් උරුම විය. නමුදු මානවයාට මුලින් හඬක් නිකුත් කිරීමේ හැකියාවට අමතරව විශ්ව ශක්තිය මෙන් මනසින් විශ්ම ජනක දේ කරන්නට හැකි කමද හිමි විය. මුල්ම යුගයේ මානවයා ඔවුනොවුන් අතර සමූහිකත්වය හා ආරක්ෂිත භාවය රැකගෙන ජීවත් වීම සඳහා හඬ සංකේත සළකුණු ආදි අනුකරණයෙන් පමණක් කළ සංනිවේදන ආරම්භක ක්‍රියාවලියට අරුතක් ඇති වචන උච්චාරණය හා කථනයට හුරුවීමත් සමඟ අක්ෂරයටද මුල පුරන්නට මානව සම්භවය ශිෂ්ට සම්පන්න වීම දෙවියන්ගෙන් ලද භාස්කමක් ලෙස සැලකිය හැකිය.

අදවනවිට යුග ගණනාවක් ඉදිරියට පිම්මක් පැන තාක්ෂණ යුගයට පාතබා ඇත. මිනිස් බුද්ධිය මෙහෙයවා අන්තර්ජාලය ඔස්සේ අන්තරාදායක දේ පවා කිරීමේ අවදානම භාරගෙන සිටිති. ඉතාම කුඩා මෙවලමක් වූ යුගයේ ජනප්‍රිය දුරකථනය අද ඊට හොඳම නිදසුනය. විද්‍යුත් මාධ්‍ය මුද්‍රිත මාධ්‍යය අභිබවා විශ්මජනක විපර්යාසයන් කිරීමටද සමත්වී ඇත.

තාක්ෂණ දියුණුව හරහා අනාගත පරපුර වෙනුවෙන් සිතන්නට සුදුසුම කාලය වර්තමානයයි. විශ්ව ගම්මානයක් සඳහා ළමා මනසට ලෝකය පුපුරා යන දැනුම් සම්භාරයක්, මනසේ ධාරිතාව ප්‍රමාණවත් ඉඩකඩ පහසුව නොතකා පිරවීමෙන් පමණක් විශ්ව මිනිසකු කළ නොහැකියි. බුද්ධියේ කවුළුවෙන් එබී බලන්නට බුලත් හුරුල්ලක් අතැතිව දෙගුරුන් අභිමුව සිටින දරුවාගේ අනාගතය පැද යන එකම නියමුවා ගුරුවරයා බැවින් ගුරු කේන්ද්‍රියව ලබන විෂය දැනුමට පමණක් බද්ධ නොකර දරුවකු නිර්මාණශීලි සංකේත දැනුම, ගවේෂණාත්මක දැනුම ලබන්නට ක්‍රියාකාරකම් තුළින් ඔවුන්ගේ පසුබිම පුළුල් කර ගැනීමට නිදහස් අවකාශයක් ලබාදිය යුතුය. එසේ නම් පොත් පත් පරිශීලනය දැනුම ලබන්නට ජීවිතයට අත් පොත් තබන්නට සාහිත්‍ය මාසය මුල් කරගෙන කියවීමේ මාසයක් කර ගැනීම අනාගත ලොවට යහපතකි.

**මිකි ප්‍රනාන්දු**
නාවලපිටිය

# කයිමන් දොරකඩ අපේ උරුමය

**කතුතුමනි,**

කොළඹ ගැස්පහ හන්දියෙන් කොටුව දෙසට දිවෙන කෙලින් වීදිය ආරම්භක පෙදෙස පැරැන්නන් හඳුන්වන්නේ 'කයිමන් දොරකඩ' නමිනි. එහි වම් පසින් හතරවන හරස්වීදිය ආරම්භ වන ස්ථානයේ ස්ථාපිත කර ඇති අපදන්නා කාලයේ සිට වගකිව යුතු කිසිවකුගේ අවධානයට ලක් නොවෙමින් වැස්සට තෙමෙමින්, අව්වට වේලෙමින්, දිවා රෑ නිශාචර පක්ෂීන්ගේ 'වසුරින්' පිරියම් ලබමින්, පුස් හා මලකඩ වලින් දුර්වර්ණ ගැන්වෙමින් ඇති ඉපැරණි සීනුවක් සහිත ස්ථම්භය කෙරේ යම් අවධානයක් කිතුනුවන් වූ අපට යොමු කිරීමට කිසියම් අයිතියක් ඇතැයි අදිටනින් මෙසේ ලියන්නට සිත්වුණි.

දැනට මෙය අවට ප්‍රදේශයේ වෙළෙඳ ආධිපත්‍යය හිමිකර ගෙන ඇති අන් ලබ්ධික ද්‍රවිඩ යෝනක වාර්ගිකයන්ගේ සුළු හා මහා පරිමාණ වෙළෙඳ සැල් අතර අගැයීමකට හෝ ගැරහීමකටද ලක් නොවෙමින් තිබේ. ඒවායින් ආවරණය වෙමින් ද ඇති සේය, නොබෝ දිනක කිසිදු වටිනා කමක් නොමැති වස්තුවක් සේ කඩා බිඳ දමා එම ස්ථානයේ ඇති ආර්ථික වටිනාකම් අනුව වෙළෙඳ ව්‍යාපාරයකට යා වීමකට බොහෝ විට ඉඩ ඇතැයි සිතිය හැක්කේ වර්තමානයේ අගනුවර සිදුවන වෙනස් කම් දකින විටය.

එසේ එවැන්නක් සිදුවුවොත් එය කිතුනු අපට යම්කිසි අවමානයක් ලෙස සැලකිය යුතු වන්නේ අප විසින් එවැන්නක් සිදුවන තුරු ඒ ගැන නොසලකා හැරීම හේතුවෙන්මය. ඒ මෙයද! හෙළ කිතුනු උරුමයට හිමිකම් කියන ඉතිහාසයක් ඇති පුරා වස්තුවක් නිසාය. පෘතුගීසි සමයේ කෝට්ටේ රජකළ 07 වන බුවනෙක බා රජ මාලිගය අසල විදේශ පියවරුන්ගේ ඉල්ලීම මත දෙව්මැඳුරක් ඉදිවූ බවත් එය ඉදිවී තිබුනේ ඇතුල් කෝට්ටේ බවත් කිතු දහම වැළඳගත් 'දොන් ජුවන් ධර්මපාල' රජතුමාත් මෙම දෙව්මැඳුරේ ආගමික වතාවත් වලට පැමිණි බවත් එම දේවස්ථානයේ සවිකරනු ලදුව උදේ, දවල්, සවස හඬදුන් සීනුව (සණ්ඨාරය) මෙය බවත් කිතුනු ලියවිලිවල සඳහන්ය.

පසුකාලිනව පෘතුගීසින් පන්නා බලය අත්පත් කර ගත් ලන්දේසීන් කතෝලික පීඩනය ඇරඹි සමයේ පෙරකී දේවස්ථානයත් විනාශ කර දමන ලදී. අනතුරුව එම දේවස්ථානයේ වූ සීනුව ලන්දේසීන් විසින් කොළඹ පිටකොටුවට ගෙනවිත් මෙම ස්ථානයේ සවිකර ජනතාවට අනතුරු ඇඟවීම් සඳහා භාවිත කළ බවත් කියවේ.

මෙම සීනුවේ ලතින් භාෂාවෙන් 'නමෝ මරියේ' මුල් වචන කොටා ඇති බවත් සඳහන්ය. එසේනම් පෘතුගීසි සමයේ කිතුනුවන් අවදිකර ලන්දේසි සමයේ කොලොම් තොට සලිත කර එදා මෙදා තුළ නිහඬව දිරාපත් වෙන අපේ උරුමයක් වූ මේ අගනා පුරාවස්තුව කෙරේ අවධානය යොමු කිරීමට කිතුනු අපට හිමිකමක් තිබෙනවා නේද? යි ඇසිය යුතුමය.

**යූ. ඩී. ප්‍රැන්සිස් ඇන්ටනි**
එඬේරමුල්ල

# ඩෙංගු මැඩීම සඳහා කිතුනුවන්ට පැවරෙන වගකීම

**කතුතුමනි,**

මිනිස් ජීවිතය ඉතාම වටිනා එකක් බැවින් රජයේ හෝ මහජනයාගේ දෝෂයක් නිසා එය විනාශවන්නට හැරීම නොකළ යුතුය. මෙම තත්ත්වය ඩෙංගු මදුරුවා ව්‍යාප්ත වීම වැළැක්වීමට ගතයුතු පියවර සම්බන්ධයෙන් අදාළ කරගන්නේ එම මරණයන්ට දැනුවත්ව හෝ නොදැනුවත්ව කිතුනු අප වගකිව යුතු බැවින්ය. "සෑම මිනිසෙක්ම ඉතා වටිනා පුද්ගලයකු බවත් එම මිනිසාට ස්ත්‍රියට සමාන අයිතිවාසිකම් හිමිවිය යුතු බවත් ලොව වසන සියලුම සතුන්ට, මැවිලිවලට නිපදවීම් වලට වඩා උතුම් බවත් කිතුනු සමාජ ධර්මය අවධාරණයෙන් ප්‍රකාශ කර සිටි. (කතෝලික සමාජ දර්ශනය කමිටුව) මෙම අයිතිවාසිකම් පිළිබඳව xxiii වැනි ජුවාම් සසුනිසුරාණන් නිකුත් කළ පාඩෙම් ඉන්බර්රින් නොහොත් ලෝක සාමය නමැති සමාජීය විශ්ව ලේඛනයේ පැහැදිලිව සඳහන් කරයි.

සෑම මිනිසකුටම තම ජීවිතයටද, ශාරීරික සම්පූර්ණත්වයටද, ජීවිතය නියම ලෙස දියුණු කරගැනීමට අවශ්‍යවූ හා යෝග්‍යවූ උපකරණ වලටද අයිතිවාසිකමක් තිබෙන බව පෙනී යන්නේය. මූලික වශයෙන් මේවා නම් ආහාර පාන, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම්, විවේකය, වෛද්‍ය උපකාර හා සමාජ සේවා පහසුකම්ය. එහෙයින් රෝග පීඩාවන්හිදී ද වැන්දඹු තත්ත්වයට පත්වූ කල්හිද මහලු වියෙහිද මිනිසාට ඔහුගේ ආරක්ෂාවට අයිතියක් ඇත්තේය. (සමාජ දර්ශන 2012)

එකිනෙකාගේ ජීවිතය රැකගැනීමේ සුවිශාල වගකීමෙන් අපට බැහැර වීමට නොහැකිය. ප්‍රේමයේ පනතින් අවධාරණය කෙරෙන අසල්වැසි ප්‍රේමය දක්වන සෑම කිතුනුවකුටම පරිසරය පිළිබඳව තමන් සැළකිලිමත් වීම අත්‍යවශ්‍යයි. කැළිකසල බැහැර නොකිරීම හා මදුරුවන් බෝවීමට ඇති ඉඩකඩ අහුරා නොතැබීමෙන් තමන්ගේ ජීවිතයට මෙන්ම අසල්වැසියාගේ ජීවිතයටද හානිකරයි අසල්වැසියා ඩෙංගු ව්‍යසනයෙන් මිදීමට අවැසි පියවර අනුගමනය කළත් අනෙකාගේ දොසක් නිසා විනාශයක් විය හැකිය. මෙසේ සිදුවන මරණය නොදැනුවත් එකක් නොවන්නේ ඩෙංගු රෝග ඇතිවන තත්ත්වයන් වැළැක්වීමට හැම අංශයකින් දැනුම්වත් කිරීම සිදුවී ඇතිහෙයිනි. අසල්වැසියාට ප්‍රේම කරන බවට දෙව්මැඳුරේ පිළිණ දෙන දේව ප්‍රසාද නිධාන ලබාගන්නට කිතුනුවකුට පරිසරය රැකගැනීම සඳහාවූ තමාට පැවරෙන වගකීමෙන් බැහැර විය නොහැකිය. තවත් කෙනකුගේ ජීවිතය අවදානමකට ලක් කරන්නේ නම් ඔබගේ කිතුනුකමින් ඇති ඵලය කිම.

**ඇල්ප්‍රඩ් නෙල්සන්**
දඹුගම



කලා සංග්‍රහය

# පැරණි කිතුනු කලා කෘති ඇතුළු භාණ්ඩ රක්‍ෂණය කාලීන අවශ්‍යතාවයකි

මෑත ඇතිවූ නව ලිබරල් වාදි වෙළඳ පොළ අපගේ ආර්ථික රටාව පමණක් නොව සමාජ ආකල්පද වෙනස් කරමින් අපූර්ව ගෝලීය පදනමකට බඳුන්කර ඇත. එබැවින් වෙනත් ආගමිකයන්ට වඩා කිතුනු බැතිමතුන්ගේ උතුම් සාර ධර්ම මියැදී යන යුගයක අපි දිවිගෙවමු.

ඒ කෙමෙන් වියැළී යන කිතුනු සාරධර්ම. හර පද්ධතීන් රැක ගැනීමේ එක් පියවරක් ලෙස කිතුනු උරුමයන් සංරක්‍ෂණය කිරීමේ ව්‍යාපෘතියක් කාලීනව වැදගත්ම අවශ්‍යතාවයක් වෙයි. කිතුනු වටිනාකම් ඇති විවිධ භාණ්ඩ හා සේවා සමහර කිතුනු නිවෙස්වල තිබේ. සමහර පැරැන්නෝ ඒවා තම පණ මෙන් රැක ගත්හ. එහෙත් ඒවාට ඊලඟට උරුමකම් කියන වත්මන් තරුණ පරපුර පන්දුවට හා සිංදුවට ලොල් වඩමින් පරණ කිතුනු උරුම අත්පිස්නාවක් තරම් ලෙස අගය නොකරති. ඒ නිසා ඒ උතුම් කිතුනු උරුමයන්, පුරා වස්තු කාවුන්ට, වේයන්ට, මීයන්ට ගොදුරු නොවන්නට සලස්වා සුරක්‍ෂිත කිරීම සංරක්‍ෂණ මන්දිරයකින් අපේක්‍ෂා කෙරේ. කිතුනු වටිනාකම් සුසැදි පැරණි අපූර්ව භාණ්ඩ සමහරුන්ගේ නොදැනුවත්කම හා නොසැළකිල්ල මත නිවෙස්හි අගු පිල්වල දිරා පත්වෙයි. වත්මන් ප්ලාස්ටික් ලෝකය ඒ ජන හදවත් අගය කරයි. කිතුනු නිවෙස් වල පමණක් නොව දෙව්මැඳුරු ආශ්‍රිත ලැගුම් නිවෙස්වලද, සමහර කන්‍යාරාමයන්ද වත්මන් බාල භාණ්ඩ අගය කර පැරණි භාණ්ඩ කාලයාගේ වැලි තලාවට යට කර ඇත. ඒවා ඇති තැන් සොයා ලබාගෙන සංරක්‍ෂණය කිරීම පහසු කර්තව්‍යයක් නුවූවත් කළ යුතු වැදගත් යුග මෙහෙවරක් වෙයි.

මේ අතර පැරණි කිතුනු පත පොත සංරක්‍ෂණය කළ යුතු අපේ වැදගත් උරුමයකි. මෑත ඉතිහාසයේ අලගියවන්න, මුකවෙටි, ගරු ජාකෝබේ ගොන්සාල්වෙස් පියතුමා යන පඬිවරුන්ගේ කිතුනු පොත පත වත්මන් සමාජයට ලබා ගත හැකි සංරක්‍ෂණයක් පැවතියත් ඊට පෙර කිතුනු කෘති පිළිබඳ වැදගත් ලකුණක් කිතුනු සාහිත්‍ය සමාජය තුළ දක්නට නොලැබේ. ඊට පෙර කිතුනු පොත පත පළ වූයේ නැද්ද? පිළිතුර, ඉතා වැදගත් පොත පොත පළවූවාට කිසිම සැකයක් නැත. එහෙත් එදා අපේ කිතුනු සමාජය තුළ බෞද්ධ සැදැහැවතුන්ගේ පන්සල මෙන් විද්‍යාස්ථානයක් නුවූයෙන් ඒවා කාවන්ට, වේයන්ට ගොදුරු වන්නට ඇත. වැඩි ඇත ඉතිහාසයක කතා කුමටද?

හැටේ දශකයට පෙරතුබූ අපේ වටිනා විවිධ ආගමික පොත පත අද දක්නට නැත. නිදර්ශන කීපයකි මේ. එකල පාසල්හි භාවිත කළ සුළුපදේශය, ඥානෝපදේශය, ක්‍රිස්තු ධර්ම විවරණය, දෙවන පන්තියේ සිට භාවිත කළ කතෝලික කියවීම් පොත් පෙළ, පූජා සහයකයින්ගේ පූජා උදව් පොත, පැරණි ගීතිකා පොත අද නිවෙස් වලින්, හා කිතුනු සමාජයෙන් බැහැර වී ඇත. ඒවා වටිනා මිණිකැට වැනිය. ඒවා සමහර නිවෙස්වල, ආයතනවල තිබෙන්නට පුළුවන. ඒවා යළි මුද්‍රණය කර සංරක්‍ෂණය කිරීම මෙම ව්‍යාපෘතියෙන් අදහස් කරමි. ගරු ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමනට පසු ඒ මග තව එළි කළ කිතුනු ගිහි පැවදි පඬිවරුන් අපමණ වූහ. ඒ අතර අතිගරු ඩී. ජේ. ඇන්ටනි, හලාවත රදගුරුවූ අති උතුම් එඩ්මන් පීරිස්, ආචාර්ය දොන් පිටර් කොළඹ පළමු සිංහල අගරදගුරු අතිඋතුම් තෝමස් බෙන්ජමින් කුරේ ආදි ගරු පූජාප්‍රසාදි තුමන්ලා ආගම, සාහිත්‍ය, දේශපාලනය, ඉතිහාසය ආදි විවිධ ප්‍රස්තුතයන් පිළිබඳ අගනා ග්‍රන්ථ කරණයක නියළුණි. එහෙත් එතුමෝ සගසුව දිනූ ගමන් ඒවාද කිතුනු සමාජයෙන් වාෂ්පවීම ඛේදයකි. එතුමන්ලා බුද්ධිමතුන් වූහ. නියම බහුශ්‍රතයැන් වූහ. එතුමන්ලාගේ සෑම කෘතියක්ම සංරක්‍ෂණය කර අනාගත සමාජයේ දූ පුතුන්ට පමණක් නොව පුදැදුරන්ටද පරිශීලනයට තැන්පත් කිරීම මහත්වූ සමාජ සේවයක් වෙයි.

එතුමන්ලාට පෙර කිතුනු වටිනාකම් ඇති පොත පත ලියූ ගරු මනුවෙල් පියතුමා, එෆ්. එම්. ගුණතිලක වැනි ගරු පියවරුන්ගේ පොත්ද සංරක්‍ෂණයට යෝග්‍ය වෙයි. මෙසමයේ ප්‍රංශය වැනි විදේශයන්ගෙන් පැමිණි විදේශ ගරු පියවරු විවිධ වූ මාතෘකා සහිත ග්‍රන්ථ රචනය කළ බව සතිපතා ප්‍රදීපයට යටගිය තොරතුරු මතු කරන ඉසුඹු ලැබූ අගරදගුරු අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් කරන සඳහන් වලට අයත් මා හැඟි ග්‍රන්ථද අනාගත දැනුමට වැදගත් වෙයි. ඒවාද සංස්කරණ මන්දිරයක තැන්පත් විය යුතුය.

ඉහත කී ලෙස පැරණි ග්‍රන්ථ මෙන් පැරණි ගීතිකා හා ගීද (සිංදු) සංරක්‍ෂණය විය යුතු වැදගත්ම කිතුනු වටිනාකම් වෙයි. ඒවා ගැයූ ගායක ගායිකාවන්ගේ රූප, ඡායාරූප අනාගත පරපුරට වැදගත් සළකුනු වනු නොඅනුමානය. සුනිල් ශාන්ත, රුක්මණී දේවි ගැයූ ගී තවමත් සමාජය සාදරයෙන් පිළිගන්නා අතර ඒවා සදා අමරණීය වනු නො අනුමානය. එහෙත් මෝදර වොලි බැස්ටියන් සීදූවේ එම්. එස්. ප්‍රනාන්දු ආදීන්ගේ බයිලා ගී ඔවුන්ගේ අභාවයන් සමඟ වල පල්ලට යැවීම දුඃඛදායකය.

ඔවුන්ට පෙර 'ජෝපමාලේ මධු මාතා නමදිමු ජෝපමාලේ මධුමාතා ගීයද, අත්තු නිත්‍යා මොක්පුර ක්‍රීටේ කුසුමේනී නර්භෝනා ගීයද ගැයූ කෝපිවත්තේ විල්ප්‍රඩ් බෝපිටි ප්‍රදේශයේ සෙබස්තියන් මහතුන්ද නිති සැමරිය යුතු අතර ඒ ගීත කිතුනු උරුම ලෙස සංරක්‍ෂණය වීම අගයමි. මේ සමඟ පැරණි පූජා ඇඳුම්, විවිධ පූජා භාණ්ඩ සංරක්ෂණය තුළ ඒවා අමිළ කෞතුක භාණ්ඩ බවට පත්වනු නො අනුමානය. එසේම ලැගුම් නිවාස වල හා දෙව්මැඳුරු වල ඇති පැරණි කැටයම් සහිත ඇඳ, පුටු. සොපා ආදියද සුරුවම් කූඩු, දේශනා කූඩු ආදි දැවමය පැරණි උපකරණ කිතුනු උරුමයන් පමණක් නොව කිතුනු කලා කෘතිද වෙයි. මෙම අප්‍රාණික විවිධ භාණ්ඩ අතීත සෞභාග්‍යයේ උරුම වෙයි. අවුරුදු දහස් ගණනක ඉතිහාසයක් ඇති කිතුනු ඇදහිල්ල සරු කෙරුමට එදා ජීවය දුන් ඒ භාණ්ඩ සංරක්‍ෂණය කිරීම අනුචිත ක්‍රියාවක් නොවන බැවින් මේ කරුණු කෙරෙහි විමසිලිමත් වෙත්වායි කරුණා පෙරදැරිව අයදිමි.

**ඩී. එස්. පතිරණ**
**හපුගොඩ**



දළුපත සා. අන්තෝනි සිද්ධස්ථානයේ සා. අන්තෝනි මුනි ජීවිත කතාව සිතුවම් ගත කිරීමට ඇන්ටනි ප්‍රනාන්දු මහතා කටයුතු කළේය. විවාහ අධිකරණ නාහිමි අතිගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා එය ආසිරිගැන්වූ අතර සිද්ධස්ථාන පාලක ගරු ක්‍රිස්ටෝපර් ජුලියස්, සහයක ගරු සජිත් අරුණ පියතුමන් සමඟ චිත්‍ර ශිල්පියා ද මෙහි වෙති.

## ෆිලීෂන් අබයකෝන්ගේ සුබස 217

### එකාවන් එක්වන්

**යසසුර නිකාවන් - තිළිනෙන් දෙන එකාවන්**
**කල්ප සාකාවන් - ලොවට පෑ වැනි විසාකාවන් (කාව්‍යශේඛරය)**

මෙහි එකාවන් නම් නිරතුරු යනුයි. එකාවන් මෙන්ම එක්වන්ද නිරතුරු යන්නට අමතරව එක හා සමාන යන තේරුමද දෙයි. මීළඟ වැකියේ එක්වන් යනු එක සමාන අරුතිනි. වියරණ ඇදුරා හා වාග් විද්‍යාඥයා භාෂා විමර්ශනයෙහි යෙදෙන්නේ එක්වන් අරමුණකින් නොවේ. (ජේ. බී. දිසානායක - භාෂාවක භාවිතය හා විග්‍රහය)

දේශප්‍රේමී හා වෘත්තීය උද්ඝෝෂණවලදී 'එකාවන්ව හඬනගමු. එකාවන් ව නැගී සිටිමු යයි මුරගානු ඇසිය හැකිය. මින් බොහෝ අයට හිතෙන්නේ එක්වන් යනු කටවහරේ එකාවගේ ලෙසය. කාව්‍යශේඛරය වැනි සම්භාවිත කෘතියක එකා යන ග්‍රාම්‍ය වචනය ඇතුළුවිය නොහැකිය. කරමාල වර්ගයක් වන එකාවැළත් අතීත සාහිත්‍යයේ සඳහන්ය. තුන් තුනුරුවන් ලෙසත් සිව් සුවිසි සූතිස් ලෙසත් වෙනස් වේ. එකාවන් එකාවැළ වදන්වල පවතින්නේ කටවහරේ එකා නොව එක් සංඛ්‍යා ශබ්දයට උච්චාරණ ධර්මතා අනුව සිදුවූ පෙරළියක් යයි හැඟේ. තිසා වැව, රඹා වැව, දිගාමඬුල්ල, ගණනා (ගණනය) ප්‍රාර්ථනා (ප්‍රාර්ථනය) විමසන්න. එකාවන් එකාවනු ලෙසද විටක පොත පතේ පෙනේ. එකාවගේ යන අවියත් වහර එකාවගේ සටන් කළයුතුය ලෙස මිස එකාවන්ව සටන්කළයුතුය යයි භාවිතය අයෝග්‍යය.

මහා සනාන්ධකාරය හිරු උදාවූ කල එකපැහැර දුරුව ආලෝක වන්නේය. (උමංදාව) එක පැහැර හා එකහෙළා කටවහරේ එකපාරටම යන්නට සමානය. එකමත් එක කාලෙක/ රටක, එකත් එකට. එකට එක, එකලාසයක්, එක්කාසු ජනවහරේය. එකඟ, එකුන් (එක්+උන්=එකක් අඩු) එක එල්ලේ, එකලා, එක්නැළිසාය (සාගතය), එක්ටැම්ගේ වියත් වහරේය. එක්වම, එක්කම කෙරෙන් ඔක්කොම කට වචනය සැදිණැයි මතයකි.

එක එක මැණිකක - එක එක රූපෙක
එළියෙන් නැහැවුණු මලක් පිපේ
(රේඛාව - තේමා ගීතය)

## මහා සන්තියාගෝ මුනිතුමා

**කර්තෘ - ගරු මොරිස් ඇන්ඩර්සන් ප්‍රියකාන්ත පියතුමා**




ජේසුන් වහන්සේගේ ආදරය දිනූ ජාකොබ් අපෝස්තුළුවරයා මෙරට බැතිමතුන් දැන හඳුනන්නේ මහා සන්තියාගෝ මුනිඳුන් නමිනි. සුදු අශ්වයා පිට නැගී වීරෝදාර රණ විරුවකු ලෙස ප්‍රතිමාවලින්, ඡායාරූප සිතුවම් වලින් නිරූපණය කර ඇති මහා සන්තියාගේ මුනිතුමන් පිළිබඳවත්, එතුමන් නමින් ඉදිවූ සිද්ධස්ථාන පිළිබඳවත් දුර්ලභ ඡායාරූප හා සිත් ගන්නා සුළු සුමට හා සරල බස් වහරකින් මේ ග්‍රන්ථය සම්පාදනය කරන්නට කතුවර පියතුමා මහත් වෙහෙසක් ගෙන ඇත.

මේ කර්තව්‍යයේදී සුපුවත මගින් ජාකොබ් අපෝස්තුළු තුමන්ගේ මෙහෙවර අනාවරණය කර ඇති අන්දම ඉතා පරෙස්සමෙන් පරිශීලනය කරන කතුවරයා ඒ ඔස්සේ එතුමන්ගේ ජීවන සුවඳ පාඨකයා හා බෙදා හදා ගන්නට සමත්වෙයි. ක්‍රිස්තු වර්ෂ 44 දී පමණ දහම වෙනුවෙන් ප්‍රාණ පරිත්‍යාගි වූ එතුමන්ගේ සිරුර ඉන් වසර 800 කට පමණ පසුව සොයා ගැනීමේ අසිරිමත් අවස්ථාවද කතුවර පියතුමා අනාවරණය කරයි.

ස්පාඤ්ඤයේ කොම්පොස්ටෙලාහි කළ සංචාරයන් ඇසුරෙන් ලබාගත් තොරතුරු හා ඡායාරූපද මහා බැසිලිකාවක් වූ කොම්පොස්ටෙලා හි සිද්ධස්ථානය ගැන තොරතුරු ද - ශ්‍රී ලංකාවේ ඉදිකර ඇති මහා සන්තියාගු මුනිඳුන්ට කැපකර ඇති දේවස්ථාන ලැයිස්තුවක්ද සිය ග්‍රන්ථයේ ඇතුළත් කරන්නට කතුවර පියතුමා සමත් වී ඇත.

දර්ශනීය වර්ණ පින්තූර රැසකින් සංගෘහිතවූ මේ ග්‍රන්ථය මගින් ජාකොබ් අපොස්තුළුතුමා හෙවත් මහා සන්තියාගෝ මුනිඳුන් ගැන නූතන පරපුරට කියා දෙන්නට වෙහෙසවූ කතුවර පියතුමාට අපෙන් උණුසුම් සුබපැතුම්!

**මෛත්‍රී**

## මට ජේසුස් වහන්සේ හමුඋනා

**කර්තෘ - ඩබ්ලිව්. රොබට් පෙරේරා, මිළ - රු. 150/=**




ප්‍රවීන කිතුනු ලේඛක, ඩබ්ලිව් රොබට් පෙරේරා මහතා සංස්කරණය කරන ලද මේ කෘතියේ කිතුනු පුවත්පත් හා සඟරා වලට සපයන ලද දුර්ලභ තොරතුරු රැගත් ඓතිහාසික ලිපි, කෙටිකථා හා ගවේෂණාත්මක තොරතුරු ඇතුළත්වේ. මෙයට පෙරවදනක් එක්කරන කුරුණෑගල රදගුරු අතිඋතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා හිමිපාණන් මේ කෘතිය හඳුන්වා ඇත්තේ ආගමික මෙන්ම සමාජ සදාචාරාත්මක වටිනාකම් උද්දීපනය කරන්නක් වශයෙනි.

පදවි ජනසන්නිවේදන අධ්‍යක්‍ෂ ගරු ජෙරල්ඩ් වී. ප්‍රනාන්දු පියතුමාද, ලෞකිකකරණය පිටුපස හඹායන නූතන සමාජයට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙසූ දහමේ ගුණ සුවඳ මෙම කෘතිය තුළින් පිළිබිඹු වන බව පෙන්වාදී ඇත. පිටු 108 කින් සමන්විත යථොක්ත ග්‍රන්ථය 'එක හුස්මට' කියවා දැනුමක්, රසාස්වාදයක් එකවිට ලැබිය හැකිසේ පෙළගැස්වීම කතුවරයාගේ දක්ෂතාවයක් බව කිව හැකිය. විශ්‍රාමික පාඨශාලාචාර්ය වරයකු වන රොබට් පෙරේරා මහතා පදවි ජනසන්නිවේදන පර්ෂදයේද සාමාජිකයෙකි. දැනට අසූතුන්වන වියේ පසුවන එතුමාගේ ලේඛක දිවිය නිදුක්, නිරෝගි බවින් සපිරේවා යනු අපගේ පැතුමයි.

**ජසින්තා සපරමාදු**

## 177 සිරි ලක් බයිලා

ගරු තිලකසිරි ප්‍රනාන්දු පැ.තු.නි සොයුරු



| | |
|---|---|
| පිල් විදහා නටන මොනරු පස්ස එළියෙ | පේනවා |
| ලුල්ලු බුං ගහද්දි දැන් දණ්ඩින් උඩ | පනිනවා |
| තමන්ගෙ අමුඩෙ ම කැත කළ කෙනා කවුද ෙ | හායනවා |
| සුදු හුණු ගාගෙන තමන් ම රජෙක් කියල | හිතනවා |
| ඕන එකට එපා එකට කැත හිත රඟ ෙ | දනවා |
| ඉහළට යන අය කකුලෙන් ඇද බිම | වට්ටවනවා |
| රටට ආදරෙයි කියලා බොරු සද්දන් | දානවා |
| අන් අය පණ පිටින් අරන් භූමදාන | කරනවා |

**ගායනය : මොනරතැන්නෙ නිශාදි**



බස්නාහිර පළාත් සාහිත්‍ය උලෙළ පසුගියදා කොළඹ බස්නාහිර පළාත් සෞන්දර්ය සහ සංස්කෘතික හා කලා කටයුතු ඇමැති උපාලි කොඩිකාර මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහිදී විවෘත කෙටිකතා තරගයෙන් ප්‍රථම ස්ථානය දිනාගත් ප්‍රවීන කතෝලික ලේඛක කලාභූෂණ මොරිස් බොල්ලෑගල මහතා ඊට හිමි තිළිණ හා සහතික පත්‍රය ඇමැතිවරයා අතින් ලබාගත් අවස්ථාව.

**සී. ආර්. ඩික්සන් ඇන්ටනි**

බැසිල් ෆොන්සේකා විසිනි

# අප්‍රිකා මහද්වීපයේ ආගමික බහුතරය කිතුනුවෝ

අප්‍රිකා මහද්වීපයට අයත් රටවලැ කරුති සමීක්ෂණයක් අනුව එම රටවලැ පවත්නා ආගම් සංඛ්‍යාත්මක වශයෙන් සංසන්දනය කිරීමේදී කිතුනුවන්ගේ බහුතරයක් ඇති බැව් පසුගිය සතියේ හෙළි කරනු ලැබීය. එසේ හෙළි දක්වනු ලැබුවේ, මොරොක්කෝවේ එල් ජඩ්ඩා විශ්ව විද්‍යාලයේ පැවැති සම්මන්ත්‍රණයකදීය. රටවල් 18 ක කතිකයන් 70 දෙනෙක් සහභාගි වූ එම සම්මන්ත්‍රණය සංවිධානය කරනු ලැබුවේ ආගම් පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය විසිනි.

හෙළිදැක්වූ සමීක්ෂණ වාර්තාව අනුව, අප්‍රිකාන ජනතාවගෙන් 46% ක් කතෝලිකයෝය; ඉස්ලාම් භක්තිකයෝ 40% වෙති; ඉතිරි ජනකොටස් අප්‍රිකාවේ පාරම්පරික ආගම් වලට අයත් වෙති. තවද අප්‍රිකාන රටවල් අතුරෙන් රටවල් 31 ක බහුතරය කිතුනුවෝය; රටවල් 21 ක බහුතරය මුස්ලිම් භක්තිකයෝය; රටවල් 6 ක බහුතරය පාරම්පරික ආගම වලට අයත් වන්නෝ වෙති. වර්ෂ 1900 දී කරන ලද සමීක්ෂණයක් අනුව අප්‍රිකාවේ එදා සිටියේ කිතුනුවෝ මිලියන 10 කි. වර්ෂ 2012 දී අප්‍රිකාවේ වෙසෙන කිතුනුවන්ගේ සංඛ්‍යාව මිලියන 500 කි. ලේඛක මට්ටමින් ගත් කල වර්ෂ 1900 දී. අප්‍රිකාවේ සිටියේ ලොක් කිතුනු ජනතාවගෙන් සියයට දෙකකි. වර්ෂ 2012 දී එම සංඛ්‍යාව 20% දක්වා වැඩිවී ඇත. තවද අදාළ සමීක්ෂණ අනුව හෙළි දක්වනු ලැබ ඇත්තේ දසවසරක් ඇතුළතදී. යුරෝපයේ සහ ඇමෙරිකා දේශයේ කිතුනු සංඛ්‍යාවන් පරදවා, අප්‍රිකා මහද්වීපයේ කිතුනු සංඛ්‍යාවන් ලොවැ බහුතරය වන බවයි.

අප්‍රිකා මහද්වීපයේ කිතුනු වර්ධනය සඳහා II වැනි ජුවාම් පාවුළු පාප් තුමා විසින් දක්වනු ලැබුවේ ඉමහත් උනන්දුවකි. උන්වහන්සේගේ යැදුම හා පැතුම වූයේ ද කල් නොයා අප්‍රිකා මහද්වීපයේ ඇදැහිල්ලේ වර්ධනය ලොව මවිත කරන්නක් බවට පත්වන බවයි. XVI වැනි බෙනඩික්ට් සුදොතුම් පියාණන් විසින් ද අප්‍රිකා දේශයේ



කිතුනු ජනතාව කෙරෙහි දක්වනු ලබන්නේ අතිශය සමීප පිතෘක සෙනෙහසකි. එතුමෝ දෙවතාවක්ම අප්‍රිකාවට සපැමිණියෝය. අප්‍රිකා දේශයේ කිතුනු වර්ධනය අරාබි රටවල් විසින් කැරෙන කිතුනු පීඩනයන්ට ප්‍රධාන හේතුවක් වී ඇතැයි ද ආගම් පිළිබඳ විශේෂඥයෝ පෙන්වා දෙති. සිදුවෙමින් පවත්නා ආකාරයට මුළු ලොවැම කිතුනු වේ යයි යන බිය විශේෂයෙන් අරාබිකරයේ මුස්ලිම් වරුන් චංචලයට පත් කර ඇත.

# ලිබියා ඝාතනය ශුද්ධාසනය දැඩි ලෙස හෙලා දකී

සැප්තැම්බර් 11 වෙනිදා ලිබියාවේ ඇමෙරිකානු තානාපති ක්‍රිස්ටෝපර් ස්ටීවන්ස් ඇතුළු හතර දෙනෙක්. ත්‍රස්තයන් විසින් ඝාතනය කරනු ලැබීය. මෙම ඝාතනය දැඩි ලෙස හෙළා දකිමින් ශුද්ධාසනයේ මාධ්‍ය ප්‍රකාශක පෙඩ්රිකෝ ලොම්බාර්ඩි පියතුමා මෙලෙස පවසයි. 'කොයි යම් හෝ ත්‍රස්තයන්ගේ ඝාතනයන් කිසිදු හේතුවක් යටතේ වුවද සාධාරණීය කළ නොහැකියි. අප සැමගේ දුක් සංතාපය සහ අඛණ්ඩ යැදුම දුකට පත් සියළුදෙනා වෙනුවෙන් පුද දෙනු ලබන අතර, අප ජාත්‍යන්තර ප්‍රජාවගෙන් ආයාචනය කර සිටින්නේ ලිබියාව ඇතුළු සියලු රටවලැ සිදුවන අපරාධයන් නවතා සාමය උදාකරලීමේ කාර්යයට ප්‍රමුඛස්ථානය ලබාදෙන ලෙසටයි.

මෙම පහරදීමට ආසන්නතම හේතුව වශයෙන් ඇමෙරිකානු ජාතිකයකු විසින් මොහොමද් තුමා අගෞරවයට පත් කරමින් නිපදවා ඇති පහත් මට්ටමේ කෙටි චිත්‍ර පටයක් නූතන පරිඝණක මාධ්‍යයන් ඔස්සේ ලෝ පුරා විසුරුවා හැර තිබීම යැයි වාර්තා වේ. මෙවන් දුර්දාන්ත ක්‍රියාකාරකම් නිසා තව තවත් සාපරාධයන්ට අවකාශ සැළසෙනු ඇත. අපිදු මෙම දුර්දාන්ත ක්‍රියාව තරයේ හෙළා දකිමු.

මෙලෙස මෝදු වී ඇති ත්‍රස්ත ක්‍රියාවන් ජනතාවන් විසින් ඒ ඒ දේශයන් හි දියත් කර ඇතැයි ද වාර්තා වේ. උතුරු අප්‍රිකාව, මැදපෙරදිග, යේමනය, ඊජිප්තුව, ටියුනීසියාව, සූඩානය හා මොරොක්කෝව ආදි දේශයන් හීද විරෝධවාදි ක්‍රියාකාරකම් ආරම්භ කර ඇතැයි ද කතෝලික පුවත් වාර්තා කරයි. මෙම තත්ත්වයට සමගාමීව සුදොතුම් පියා ලෙබනන් දේශයට යැමට ද නියමිතයි. මැදපෙරදිග රටවලැ සාමය උදෙසා නිරන්තර යැදුමේ යෙදෙන්නැයි සුදොතුම් පියා සකල කතෝලික ජනතාවගෙන් ඉල්ලීමක් කරයි.

# සිරියානු කිතුනුවෝ ආත්මාරක්ෂාවට ආයුධ ගනිති



සිරියාව පුරා දිනපතා සිය දහස් ගණන් ජනයා සටන් වලින් මැරි වැටෙද්දී හොම්ස්, ඇලෙප්පෝ ආදි නගරවලැ වෙසෙන කිතුනුවන් කණ්ඩායම් ගැසී ආයුධ අතට ගෙන ඇතැයි දමස්කස්හි අපෝස්තලික තානාපති මාරියෝ ෂෙනාරි රදගුරුතුමා මහත් වේදනාවෙන් මාධ්‍යයට ප්‍රකාශ කළේය.

අවි නොදරනා ලෙසට කිතුනුවන්ගෙන් ඉල්ලා සිටිය නමුත්, ඔවුන් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ අවි දරා සිටීමට සිදුව ඇත්තේ, ආත්මාරක්ෂාව හේතුකොට ගෙන බවයි. රජය විසින් ඒ ඒ කණ්ඩායම් වල ආරක්ෂාව සඳහා විවිධ ජන කොටස් වලට ආයුධ ලබාදීමට පටන් ගෙන ඇත.

ඒ අනුව තමන්ටද අවි දරා සිටීමට සිදුව ඇතැයි කිතුනුවෝද අවධාරණය කරති. එහෙත් කොතෙක් අවි දරා සිටියත්, සතුරු උවදුරු කොයි මොහොතේ කඩා වැටේදෝ යන බිය හා සැක තුළ කිතුනුවන් මෙන්මැ අන් ජනයාද දිවි ගෙවනා බැව් කිතුනු පුවත් වාර්තා කරයි.

# ඉරිදා පූජාව අවසන් වෙද්දී බෝම්බ ප්‍රහාර

උතුරු නයිජීරියාවේ බවුචි මහ නගරයේ පිහිටි සාන්ත ජුවාම් තුමාගේ දෙව් මැදුරේ සැප්තැම්බර් මස 14 වෙනි ඉරිදා පැවැති දේව මෙහෙය අවසන් වී, කතෝලික පිරිස පිටතට පැමිණෙමින් සිටියෝය. බලාපොරොත්තු නොවූ ආකාරයට ආරක්ෂක බාධක පවා කඩාගෙන මෝටර් රථයක් දෙව් මැඳුරු බිමට කඩා පාත් විය. ජනතාව කෑමොර දෙමින් හිස් ලූ ලූ අත දුවන්නට පටන් ගත්හ. එහෙත්, එකෙනෙහිම මහා බෝම්බ හඬින් රථයක් පුපුරා ගොස් ඇදැහිළිවන්තයෝ තැනින් තැන ඇදවැටුනහ.

මරාගෙන මැරුනු ත්‍රස්තයා ද එතැනම කැබැලි ලෙසට පත් වී සිටියා. බෝම්බ ප්‍රහාරයෙන් හතර දෙනෙක් මරණයට පත්ව 50 කට අධික පිරිසක් මරණහානි ලදහ. සතියකට ඉහතදී ද එම ප්‍රදේශයේදීම තවත් බෝම්බයක් පුපුරුවා හැරීමෙන් 09 දෙනෙක් ඝාතනය කරන ලදහ. එම නිසාවෙන් ඉරුදිනැ දිව්‍ය යාගය පැවැතෙද්දී. පොලිස් රැකවරණය යොදවා තිබුණත් ඔවුන්ට ද එම විනාශය වළකාලිය නොහැකි වී. පොලිස් නිළධාරිහු ද තුවාල ලැබූහ. එම මරණහානියත් සමඟ විශාල පිරිස් එම දෙව් මැඳුරු පරිශ්‍රයට ගලා ආහ. නයිජීරියාවේ කිතුනු සංවිධානයේ සභාපති ලව් පෝක්පි පූජක වරයා ජනතාව අස්වසාලමින් පැවැසුවේ දේවාරක්ෂාව තුළ යැපෙමින් සාමකාමීව ක්‍රියා කරන ලෙසටයි.

ත්‍රස්තවාදී ක්‍රියාවන්ට ත්‍රස්ත වාදයෙන් පිළිතුරු දීම කිතුනුවන්ගේ මෙහෙවර නොවේ යයි එතුමෝ ප්‍රකාශ කළහ. 'ක්ෂමා කිරීම මිස වෛරය කිතුනු මෙහෙවර නොවේ යයි ද' එතුමා විසින් අවධාරණය කරනු ලැබීය. එතැනට ලඟාවූ ප්‍රාදේශීය බලධාරින් විසින් ද අවධාරණය කරනු ලැබුවේ, විශේෂයෙන් කිතුනු මධ්‍යස්ථාන වලට රැකවරණය වර්ධනය කැරෙනා බැවින් සාමකාමීව කටයුතු කළ යුතු බවයි. රැස්වූ කිතුනුවන් වේදනාවට පත් පවුල් කරා ඇදී ගියේ ඔවුන් හා සිය සහෝදරත්වය බෙදා හදා ගැනීම සඳහාය.

# සුදොතුම් පියා ලෙබනනයේ උදා කළ සාමය කඩා වැටේද?

පසුගිය දා, සුදොතුම් පියා ලෙබනනයට පැමිණීමත් සමඟ දේශපාලන හා ආගමික නායකයන් අතර පවත්නා නොසන්සුන්තාවයන් සමනය වී ඇති බැව් දක්නට ලැබිණි. උන්වහන්සේ විසින් පෙන්වා දුන් ජයග්‍රාහි මග සාමයේ පිළිවෙත බවට සැමදෙනා අනුගත වූ ආකාරය හුවා දක්වනු ලැබුවත් එතුමා දේශයෙන් නික්ම යාමත් සමඟම ඒ ඒ දේශපාලන පක්ෂයන් විසින් විරෝධතාවයන් ආරම්භ කොට ඇතැයි වාර්තා වේ. 'ෂයිඩ් හසාන් නස්රල්ලා' නමැති දේශපාලන පක්ෂයේ නායක හිස්බුල්ලා ජනතාව අමතමින් පවසා ඇත්තේ, මොහොමද් තුමාට එරෙහිව ඇමෙරිකාවේ නිපදවා ඇති චිත්‍රපටය හෙළා දකිමින් විරෝධතාවය පෑම සඳහා සියළු මුස්ලිම් ජනතාව පාරට බැසිය යුතු යයි කියාය.

උදා විය හැකි විනාශකාරි වාතාවරණය යටතේ, 'පලන්ග යේ පක්ෂයේ' නායක ආර්මිල් ගමායෙල් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ, ජනතාව උසි ගැන්වීමෙන් සිදුවන්නේ සුදොතුම් පියාණන් විසින් උදා කරන ලද සාම වාතාවරණය පහව ගොස් ආගමික



විරෝධතාවයන් යළිත් පණ ගැන්වෙන බවයි. 'එම වෛරක්කාරී නින්දිත චිත්‍රපටය කෙරෙහි ජනතා පෙළගැස්ම උග්‍ර කළහොත් එම තත්ත්වය පාලනය කළ නොහැකි වාතාවරණයකට පත්වීම වළකා ලන්නට බැරි වෙනවා.' ගමායෙල් එලෙසින් ද අවධාරණය කළේය. ඉස්ලාම් බැතිමතුන් හා කිතුනුවන් දහස් සංඛ්‍යාවක් හමුවේ සුදොතුම් පියාණන් විසින් ඉදිරිපත් කරනු ලැබූ සාමයේ හා සංහිඳියා පැවැත්ම පිළිබඳ ප්‍රකාශනය එලෙසින් හැල්ලුවට ලක්කොට කඩා බිඳ දැමීම රාජ්‍යතන්ත්‍රික හෝ ධර්මානුකූල හෝ නොවන බැව් දක්වා ඇත.

# පාකිස්තාන ජනපති දෙව් මැඳුර ගිනි තැබීම හෙළා දකී

පසුගිය පාකිස්තානයේ මර්දනා හී තවත් දෙව් මැඳුරක් ගිනි බත් කරනු ලැබීය. ඇමෙරිකා ජාතිකයකු විසින් 'යූ ටියුබ්' ඔස්සේ විසුරුවා හරින ලද මහමද් තුමා අගෞරවයට පාත්‍ර කැරුණු කෙටි චිත්‍රපටයට විරෝධය දක්වමින් ගිනි තබා ඇති දෙව් මැඳුර පිළිබඳව පාකිස්තානයේ ජනපති *අසීප් අලී ෂර්දාරි* සිය ශෝකය ප්‍රකාශ කරමින් එම දීන හීන ක්‍රියාව කළ තැනැත්තන් වහා නීතියට පමුණුවා දඬුවම් ලබා දෙන්නැයි බලධාරීන්ට නියෝග කළේය. 'අන්‍ය ආගමිකයන්ට තාඩන පීඩන කිරීම සහ ආගමික ස්ථාන විනාශ කිරීම ඉස්ලාම් දහමේ උගැන්වීම්වලට පටහැනි වෙනවා. පාකිස්තානයේ සුළුතර කිතුනුවන්ට කෙරෙන හිරිහැර නිසාවෙන් ලෝකය හමුවේ පාකිස්තානය අවමානයට ලක්වීම සිදුවෙනවා. එබැවින් මෙවන් ත්‍රස්ත ක්‍රියාවන් නවතාලීමට වහා කටයුතු කළ යුතුයි.' ජනපති වරයා එලෙසින් ද අවධාරණය කළේය.

දෙව් මැඳුර විනාශ කරනු ලැබීම හේතුවෙන් ඉමහත් සංතාපයට පත් දහස් සංඛ්‍යාත කිතුනුවෝ මර්දාන ප්‍රදේශයට



එක් රැස්ව රාත්‍රි කාලයේදී ඉටිපහන් රැගෙන මහ මග යමින් විරෝධතාවය දැක්වූහ. කිතුනු නායකයන් ද පා ගමනේ යෙදෙමින් බළධාරින්ගෙන් ඉල්ලා සිටියේ පාකිස්තානයේ දිගින් දිගට සිදුවන කිතුනු පීඩාවන් නවතා ආගමික නිදහස තහවුරු කරවීම සඳහා සක්‍රීය ක්‍රියාදාමයන් දියත් කරනා ලෙසටයි. එසේ නොකෙරෙන්නේ නම් සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් සුරැකෙන බවට සහතික කැරෙන පාකිස්තානයේ ජාතික ධජයේ ඇත්තාවූ සලකුණ ඉවත් කරගත යුතු යයි ද කිතුනුවෝ කෑ මොර දුන්හ. තවද දෙව් මැඳුර ගිනි තැබීමෙන් මිලියන හයක් පමණ අලාභයක් සිදුව ඇති බවද, දෙව් මැඳුර තුළ තුබූ ඓතිහාසික චිත්‍ර කලා භාණ්ඩයන් විනාශ කර ඇති බැව් ද හුවා දක්වන ලදී.

# බයිබල් පිටු බිම අතුරා පාගා දමති

පසුගිය සතියේ, ඊජිප්තුවේ කයිරෝ හිදි, ඇමෙරිකාවේ නිපද වූ මොහොමද් තුමාට එරෙහි චිත්‍රපටය හෙළා දැකීමේ මහා පෙළපාලියක් පැවැත්වූයේ ඇමෙරිකාන තානාපති කාර්යාල පරිසරයේය. එක් ඉස්ලාම් නායක වරයකුගේ අණ පරිදි ශුද්ධවූ බයිබල් ග්‍රන්ථයන් ඉරා බිම අතුරා, ඒ මත ගමන් කළෝය. දහස් සංඛ්‍යාත මුස්ලිම්වරු බයිබලයට අපහාස කරමින් ඒ ඒ තන්හිදි බයිබල් ගිනිබත් කළෝය. ඊලඟ අවස්ථාවේදී බයිබල් ග්‍රන්ථයන් බිම අතුරා මුත්‍රා කිරීමට අණ දෙන බැව් ද ඔහු විසින් ප්‍රකාශ කරන ලදී. එහෙත් එම දීන හීන ක්‍රියාදාමයන් අනුමත නොකරමින් කයිරෝ විශ්ව විද්‍යාලයේ මහාචාර්ය මුෂ්තාපා මරාජි මෙලෙස ප්‍රකාශ කළේය. 'ලෝකයේ සියළු කිතුනුවන්ට ගැළවීමේ මං සළසන බයිබලය එලෙසින් අගෞරවයට පත් කිරීම දීන හීන අමානුෂික ක්‍රියාවකි. ඇමෙරිකාන චිත්‍ර පටයෙන් මොහොමඩ් තුමාට කළ අගෞරවය ද බයිබලයට කළ අවමානය ද එකසේ හෙළා දැකිය යුතු යුතු වෙනවා.' තවද බයිබලය අගෞරවයට පාත්‍ර කිරීම සඳහා අණ දුන් අහමද් අබ්දුල්ලා නම් ඉස්ලාම් නායක වරයාට එරෙහිව දැනටමත් කොප්ටික් නීතිඥ වරුන් විසින් අධිකරණය වෙත චෝදනා ඉදිරිපත් කරනු ලැබ ඇතැයි ද වාර්තා වේ. එහෙත් ඉස්ලාම් විරෝධතාකරුවන් විසින් 'දතට දතක්' යන සංකල්පය ඔස්සේ කිතුනුවන් කෙරෙහි සිය විරෝධතාවයන් වේගවත් කොට ඇත. දැනට මුස්ලිම් රටවල් 20-25 තුළ කිතුනු පීඩන දැඩි ලෙස ක්‍රියාත්මක කරවා ඇති බැව් ද වාර්තා වේ.

සංවාද මණ්ඩපය

# බාලයන් හැඩගැස්වීමෙහිලා භාවිතයෙන් තොර දේශනයෙන් පලක් වේද?

**අපි බොහෝ විට දේශනා දීමට දැඩි ප්‍රියතාවයක් දක්වන්නෙමු. බාලයන් දේශනා වලට සාවධානව සවන් නොදෙන විට තරවටු කිරීමට, සිය බලය යොදා අණසක පතුරුවා බලෙන් හෝ දේශනාවලට නතු කර ගැනීමට දැඩි උත්සාහයක් දරන්නෙමු.** එහෙත් මෙහි අර්ථය කුමක් ද? යන්න පිළිබඳව මඳක් විමසා බලනු වටී. බාලයන් දේශනා වලට සවන් දීමට දැඩි පිළිකුලක් දක්වති. ප්‍රායෝගික ලෝකයේ පමණක් නොව, දේශනාවාදීන්ගේ ජීවිත තුළ දැකිය නොහැකි බොහෝ දේ දේශනා තුළ ගැබ්ව තිබීම නිසා දේශනා වලට සවන් දීමට දැඩි අප්‍රසාදයක් පල කරති.

බාලයන් කොයිතරම් දේශනා වලට සවන් දීමට දැඩි අකමැත්තක් අප්‍රසාදයක් පල කර සිටියත් දේශන ක්‍රමයෙන් බැහැර වීමට වැඩිහිටියන් කිසිසේත්ම සූදානමක් නැත. මන්ද දේශන ක්‍රමය තුළින් ඔවුහු ආත්ම තෘප්තියක් ලැබීමට හුරු පුරුදු වී ඇතිවා පමණක් නොව, දේශනා දීම ඉතා පහසු කාර්යයක් වන නිසාත්, දේශනා තුළින් හුදු ජනප්‍රියත්වයක් ගොඩනගා ගැනීමට උත්සාහ දරන නිසාත් දේශන ක්‍රමය තුළ මහත් පරිශ්‍රමයක් දරා ඒ තුළ ඔවුහු රැඳී සිටිති. එහෙත් දේශනා දීම තුළින් දරුවන්ව හැඩගැස්වීමෙහිලා දී ඇති දායකත්වය ඉතාම අල්ප බව අකැමැත්තෙන් වුවද පිළිගත යුතුව ඇත.

එසේ නම්, බාලයන් හැඩ ගැස්විය හැක්කේ කෙසේ ද යන පැනය මතු වේ.

දෙගුරුන් පමණක් නොව ගිහි - පැවිදි - පූජක යන සියලු දෙනා ගේම ජීවිතාදර්ශය ඉතාම වැදගත් වේ. දේශනා වලට වැඩි කාලයක් යොදවනවා වෙනුවට කෙටියෙන් දේශනා දීම කාලය වෙන් කර ජීවිත ආදර්ශය මෙන් ජීවිතය තුළින් සාක්ෂි දැරීමට වැඩි කාලයක් යෙදවීම ඉතා වැදගත් වේ.

අද සමාජයේ වැදගත්ම සාධකය බවට පත්ව ඇත්තේ මුදල් ය. සමාජයේ සෑම තරාතිරමකම පුද්ගලයින් රිසි සේ හැකි හැකි අයුරින් මුදල් ඉපැයීමේ සටනේ නියැලී සිටිති. මුදල් උපයාගෙන "උපරිම සැප", "උපරිම සතුට" ළඟා කර ගැනීමට යත්න දරති. මුදල් දකින කොට මුදල් ලැබෙන කොට මුව පුරා සිනාවෙති. අසීමිත කරුණාව දයාව පාති. සියලු වටිනාකම් ගොඩනැගී ඇත්තේ මුදල් මතය. කණ්ඩායමක් මුදල් සමග පොර බදිති. වලිකති. බදාගෙන රැස් කිරීමට මාන බලති. තවත් පිරිසක් මුදල් උපයා ගැනීමට මඟක් නොමැතිව නීති විරෝධි විනය විරෝධි වැඩවල යෙදෙති. දයාව, ප්‍රේමය මානව ගුණ ධර්ම සමාජ වටිනාකම් අගයන් වල් වැදී ඇත. මේවා පිළිබඳව සමහරකු අව සිහියෙන් දොඩවන්නා සේ දවසකට වරක් දෙවරක් මුමුණති. එහෙත් ජීවිත තුළින් මේවා නොදකින නිසා බාලයන්ට විකාරයකි.

සමහර දරුවන්ගේ කරදඬු ඉතා හොඳින් උස් මහත් වී ඇත. උදරය ද හොඳට වැඩී ඇත. එහෙත් මානසික චිත්තයෙහි වර්ධනය ආධ්‍යාත්මික වර්ධනය නිසි පරිදි සිදුවී නොමැති නිසා ඔවුන් රෝගීන් බවට පත්ව ඇත. අපයෝජන, අපචාර වලට, යොමු වී ඇත. මත් කුඩු, මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවී විනය විරෝධී සමාජ විරෝධී ක්‍රියාවන් වලට යොමු වී ඇත. එසේ නම් වරද කා අත ද? දේශනාවේ ද දරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රමවේදයේ ද? ජීවිත ආදර්ශය මෙන්ම දරුවන් සම්බන්ධයෙන් වැයවීම, කැපවීම, වගකීම, වගවීම ඉතා වැදගත් වේ. දේශනාවක් පමණක් දී දරුවන් තනිකර පලා යාම තුළින් අපේක්ෂිත අරමුණු කිසිසේත් ඉටු කර ගැනීමට හැකියාවක් නොලැබේ. ඔවුන්ට ප්‍රේමයෙන් යුතුව සලකනවාද? ඔවුන්ගේ ප්‍රශ්න ගැටලු සාකච්ඡා කිරීමේ වේදිකාවක් සාකච්ඡා මණ්ඩපයක් සකස් කර තිබේ ද? ඔවුන්ගේ දැනුම ආකල්ප කුසලතා වැඩි වර්ධනය කිරීමෙහිලා නිසි වැඩපිළිවෙලක් ක්‍රමවේදයක් අප විසින් සකස් කර තිබේ ද යන්න පිළිබඳව විමසුමට ලක් කළ යුතු වේ.



ස්වාමින් වහන්සේ අපට මෙසේ වදාරණ සේක. "ස්වර්ග යෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය මිස මට ස්වාමිනී, ස්වාමිනී කියන සියල්ලෝම ස්වර්ග රාජ්‍යයට ඇතුළු නොවන්නෝ ය. ඒ දවසේ දී බොහෝ දෙනෙක් ස්වාමිනී ස්වාමිනී අපි ඔබේ නාමයෙන් දිවැසි වැකි නොකීවෙමුද? ඔබේ නාමයෙන් යක්ෂයන් දුරු නොකළෙමුද? ඔබේ නාමයෙන් නොයෙක් නොයෙක් ප්‍රබල ක්‍රියා නොකළෙමුදැ"යි මට කියනු ඇත. එවිට මම කිසි කලක ඔබ නොහැඳින්නෙමි. දුදනෙනි, මා වෙතින් අහක්ව යන්නැයි ඔවුන්ට කියන්නෙමියි" කී සේක.

✍ **ජී. ඒ. නිමාලි ප්‍රනාන්දු**

# දේශානුරූපීකරණය හා කිතු දහම

මෙවැනි ලිපියක් ලිවීම සඳහා යොමුවූ ප්‍රධාන ආනුභූතිය වූයේ පසුගිය දිනෙක එක්තරා මීසමක දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයකදි දිව්‍ය සත්ප්‍රසාද රැළියේ අලියකු මත දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ රැගෙන යාමේ සංසිද්ධියක් ය. එම සංසිද්ධිය, මෙම ලිපිය මඟින් නිවැරදි යැයි ප්‍රකාශ කිරීම හෝ වැරදි යැයි නිගමනය කිරීම හෝ අරමුණු නොකරමි. "කිතු දහම දේශානුරූපීකරණය කිරීම" පිළිබඳව මූලික අදහස් මෙහි දක්වමි. ඒ අනුව දේශානුරූපීකරණය යනු කුමක්ද? එහි අවැසියාව, එහි වැදගත්කම හා එය කළ යුත්තේ කෙසේද? යන්න පිළිබඳ මූලික අදහස් කීපයක් මෙසේ ගොනු කරමි.

ඕනෑම ආගමක්, ධර්මයක්, මතවාදයක් හෝ න්‍යායක් කිසියම් සමාජයකට ප්‍රචාරය කිරීමේදී ඒ ඒ සමාජයන්ගේ ස්වභාවයන් පිළිබඳ ප්‍රථමව අවධානයක් යොමු කළ යුතු අතරම එම සමාජයේ සංස්කෘතික වටිනාකම් හා සංස්කෘතික අංගයන් පිළිබඳව මනා අවබෝධයක් තිබීම අත්‍යාවශ්‍යය. ඒ ඒ සමාජ මට්ටම් හා සංස්කෘතික ලක්ෂණ වලට උචිත ආකාරයෙන් ආගමක් හෝ ධර්මයක් හෝ න්‍යායක් ප්‍රචාරය කිරීමට සමත් වන්නේ නම් එය සදාකාලයටම එම සමාජයේ පවත්වාගත හැකි යථාර්ථයක් වනු නොඅනුමානය. එසේ නොවන කල එය කෙටි කාලයකින් මියැදී යන්නට මෙන්ම විවිධ ගැටුම්කාරී ස්වභාවයන් ද ඉස්මතු වන්නට පුළුවන. ක්‍රිස්තුන් වහන්සේ ද පලස්තීනයේ ඒ ඒ සමාජීය මට්ටම් අනුව එම සමාජයේ සංස්කෘතික ලක්ෂණ මත දේව රාජ්‍ය පිළිබඳ ප්‍රකාශ කළ බව ශු. ලියවිලි පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කරන විට අනාවරණය කරගත හැකිය. මේ පිළිබඳ තවදුරටත් අන්‍ය ජාතීන් වෙත සුභාරංචිය ප්‍රකාශ කළ ශු. පාවුළු තුමාගේ හසුන් මඟින් තවදුරටත් සනාථ කළ හැකිය.

ඒ අනුව කිතු දහම දේශානුරූපීකරණය කිරීම යනු ඒ ඒ සමාජයන්ට / දේශයන්ට ගැලපෙන ලෙස ඒ ඒ සංස්කෘතිකාංග වලට අනුසන්ධාන වන ආකාරයෙන් හා ඒවා විකෘති නොවන ලෙසත්, කිතු දහමේ මූලික දේවධාර්මික හරයන් වෙනස් නොවන ලෙසත් ඉතාමත් ප්‍රවේශම් සහිතව මුල් බැස ගැනීමට සැලැස්වීමයි.

බෞද්ධ ධර්මය, හින්දු ධර්මය සේම කිතු දහම ද ආසියාවෙන් / පෙරදිගින් සම්භවය වූ බව බොහෝ දෙනා නොදනිති. ඒ කිතු දහම පෙරදිගට පැමිණියේ මූලික වශයෙන්ම අපරදිග සංස්කෘතික ලක්ෂණ වලින් තිසා විය හැකිය. කෙසේ නමුත් ලක්දිවට කිතු දහම ප්‍රචාරය කිරීමේ දී වුවද වැඩි අවධානයක් යොමු වූයේ අපරදිග සංස්කෘතික ලක්ෂණ මත යැපීම බව පැහැදිලිය. ඒ අනුව ලතින් ජනවන්දනාත්මක පිළිවෙත් වලට මූලික තැන දීම නිසාම කිතු දහම ප්‍රචාරය කිරීමේ දී වුවද වැඩි අවධානයක් යොමු වූයේ අපරදිග සංස්කෘතික ලක්ෂණ මත යැපීම බව පැහැදිලිය. ඒ අනුව ලතින් ජනවන්දනාත්මක පිළිවෙත් වලට මූලික තැන දීම නිසාම කිතු දහම අපරදිග දහමක් ලෙස ප්‍රචාරය විය. කෙසේ නමුත් දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ (1962 - 1965) තීරණයන් සමඟ කිතු දහම දේශානුරූපීකරණය කිරීමේ අවශ්‍යතාවය මතු විය. ඒ අනුව දෙවන වතිකාන මන්ත්‍රණ සභාවෙන් ප්‍රකාශයට පත් වූ ජනවන්දනාව පිළිබඳ වේද සත්‍ය ව්‍යවස්ථාවේ (සක්‍රොසාන්තුම් කොන්චීලියුම්) අංක 37 - 40 දක්වා කරුණු දක්වයි. එයින් කරන ඉගැන්වීම් වන්නේ,

කිතුනු සභාව දැඩි මතධාරි නොවන අතර සභාව දේශීය සංස්කෘතීන්ට ගරු කරන අතරම ඒවා වඩා පෝෂණය කිරීමට ද ආරක්ෂා කිරීමට ද ඒවා වඩා අලංකාර කිරීමට ද උදව් කරන්නකි. සංස්කෘතිය තුළ මිත්‍යා මත, අසත්‍ය ඉගැන්වීම් වලින් තොර යම් දෙයක් ඇත්නම් ඒවා පිළිගැනීමට ද ඒවායේ වැදගත්කමක් හා වටිනාකමක් ඇත්නම් ඒවා කිතුනු විශ්වාසයට, පොදු යහපතට හා ශීලධර්මයට හානි නොවන ලෙස ජනවන්දනා පිළිවෙත්වලට අදාළ කරගැනීමට ද හැකි බව ඉදිරිපත් කරයි. මෙලෙස යම් ආකාරයකින් දේශීය සංස්කෘතියේ විශේෂ අංගයක් ජනවන්දනා පිළිවෙතක යොදාගැනීමේ දී (බරපතළ වෙනස්කම් සිදුකළ යුතුව තිබේ නම්) වුවද අනුගමනය කළ යුතු ක්‍රමවේදයක් ද ඇත. එනම්; ීගඣග 40°

පළමු පියවර : දේශීය රාජගුරු මණ්ඩලය වෙත දන්වා ඒ පිළිබඳ තීරණ ගැනීම සඳහා තාවකාලික අවසරයක් ලබා ගැනීම.

දෙවන පියවර : සීමිත පිරිසක් විසින් සීමිත කාල පරිච්ඡේදයක් තුළදී නිශ්චිත ස්ථානයක එය අත්හදා බැලිය යුතුය.

තෙවන පියවර : එම අත්හදා බැලීම පිළිබඳ නිරීක්ෂණ වාර්තා රාජගුරු මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර රදගුරු මණ්ඩලය විසින් එම වාර්තා ශුද්ධාසනයට ද ඉදිරිපත් කළ යුතුය.

හතරවන පියවර : එම නිරීක්ෂණ වාර්තා වල නිවැරදි කළ යුතු දෙයක් ඇත්නම් ඒවා ශුද්ධාසනය මඟින් දැනුම් දෙන අතර එම සංශෝධනය නිර්දේශ කරනු ලබයි.

පස්වන හා හයවන පියවර : ශු. සභාව මඟින් නිවැරදි කරන ලද පිළිවෙත අනුමත කිරීම හා එය ජනවන්දනා පිළිවෙත් වලදී ඕනෑම ප්‍රදේශයක සිදු කළ හැකිය.

ඉහත සඳහන් කරන ලද පියවර ඔස්සේ යමින් 1972 දී, දේශීය සංස්කෘතියේ විවාහ චාරිත්‍රයන් වලදී භාවිත කරන "පෝරුව" කිතුනු සභාවේ විවාහ උත්සව වලදී යම් යම් සීමාවන් සහිතව භාවිත කිරීම ආරම්භ කරනු ලැබීය. එසේම දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ මෙම තීරණයත් සමඟම කිතු දහම දේශානුරූපීකරණ ක්‍රියාවලියේ තව තවත් වෙනස්කම් බොහොමයක් දැකගත හැකිය. එනම්;

★ කිතුනුවන් මෙරට ඉදිකරන ලද දේවස්ථාන බොහෝමයක් යුරෝපීය සංස්කෘතික ලක්ෂණ දරා ඇත. රවුම් ආරුක්කු වලින් නිර්මාණය වී තිබෙන දේවස්ථාන බයිසන්තීනු කලාවට ද, ඉතා උස් වූ උල් වූ ආරුක්කු ගොතික් කලාවට ද, ත්‍රිකෝණාකාර ලෙස මුගොප්පුව ඇති දේවස්ථාන බැරොක් කලාවට ද, අයත් වේ. පසුව දේවස්ථාන ඉදිකිරීම දේශීය ගෘහ නිර්මාණ ශිල්පය අනුව සකස් වන්නට විය. තවද ඒවායේ සැරසිලි ක්‍රමයන්ට දේශීය සැරසිලි යොදා ඇත. ඉදිගොල්ල ඉදිකර ඇති ශු. ජූඩ් මුනිඳුන්ගේ නව දේවස්ථානය දේශීය ලක්ෂණ වලින් සමන්විත වේ. එයට ඇම්බැක්කේ දේවාලයේ ලී කැටයම්වල ආභාසය ද, දේව දූතයන් උඩරට නැට්ටුවන්ගේ ස්වරූපයෙන් ද, ඉර හඳ යනාදී සංකේතයන් ද යොදාගෙන තිබීමෙන් ගම්‍ය වන්නේ දේශීය හුරුවට කිතු දහම වඩාත් ළං වන්නට දරණ වෑයමකි.

★ දේවස්ථානයේ දේව වන්දනාවට ගැයෙන ගීතිකා වලදී බටහිර සංගීත භාණ්ඩ භාවිත කරන අතරම බොහෝ දේවස්ථානවල පෙරදිග දේශීය සංගීත භාණ්ඩ ද යොදා ගැනෙයි. ගැට බෙරය, දවුල, තාලම්පට, තම්මැට්ටම යනාදිය ඒ අතර සඳහන් කළ හැකිය.

★ දේශීය කලාව පැත්තෙන් ද කිතු දහම පෝෂණය වී ඇත. මල් පෙති මෝස්තර (නෙළුම්, අරලිය) ලියවැල් මෝස්තර, ලීයෙන් ද පිත්තල වලින් ද රිදී වලින්ද කරන ලද කැටයම් ද්‍රවිඩ හා සිංහල ස්වරූපයෙන් දේවස්ථානවල දැකිය හැකිය.

ඉහත දැක්වූයේ කිතු දහම දේශානුරූපීකරණයේලා අන්තර්ගත වී ඇති ලක්ෂණ කීපයක් පමණි. පසුගිය දිනෙක දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අලියෙකු මත පෙරහරේ රැගෙන යාමද එම දේශානුරූපීකරණයේ ලා පියවරක් වන්නට ඇතැයි කිව හැකිය.

කිතු දහම දේශානුරූපීකරණයේ වැදගත්කම නැතහොත් එයින් අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න විමසිය යුතු වෙමු. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට පෙර මෙරට කිතු දහම පිළිබඳ විශේෂ කැක්කුමක් දක්වනු ලැබූ පූජක සංඝයක් ලෙස ඔරතෝරියාන පූජක සංඝය දැක්විය හැකිය. ලන්දේසීන් කතෝලික විරෝධී ව්‍යාපාරයන් මෙරට දියත් කරමින් තිබූ අවධියක (17 සහ 18 වන සියවසේ) ජුසේ වාස් පියතුමා ප්‍රමුඛ ඔරතෝරියාන කිතුනු පූජක සංඝය මඟින් මෙරට මුල් බැස තිබූ කිතු දහම තවදුරටත් පෝෂණය කරමින් ශක්තිමත් කරන්නට විය. එම පූජක සංඝය විශේෂයෙන්ම මෙරට දේශීය සංස්කෘතියේ ඒ ඒ ලක්ෂණයන්ට උචිත ආකාරයේ සේවාවක් දියත් කළ බව එම යුගයේ ඉතිහාසය පිළිබඳ සෙවීමේදී පැහැදිලි වේ. මේ නිසාම ජුසේවාස් පියතුමාට, ජාකොමේ ගොන්සාල්වේස් පියතුමාට කිතුනු මෙන්ම නොකිතුනු ජනතාවගේ ප්‍රසාදයක් ද හිමිව තිබුණි. මෙම යුගයේ කතෝලිකයන්ට කොපමණ පීඩන වලට මුහුණ දීමට සිදුවූවත් කිතුනු විශ්වාසය අත් නොහැර සිටීමට තරම් ප්‍රබල ලෙස කිතු දහම ඔවුන්ගේ ජීවිත වලට කා වද්දවා තිබුණි.

උදා: "අපේ සියලු වස්තුව නැතිවී ගියත්, අපේ හිස් ගසා දමනු ලැබුවත්, අපේ ආගම අපි අත් නොහරින්නෙමු" (1744 පෙබරවාරි 05 දින පෙත්සම)

" කුමක් වූවත්, අපේ සත්‍ය රෝමානු කතෝලික ආගම කිසිදාක අත් නොහරින බව අපි දිවුරා ප්‍රකාශ කරමු." (1750 සැප්තැම්බර් 23 පෙත්සම) මෙලෙස කිතු දහම අත් නොහැර තම ජීවිත පවා පරිත්‍යාග කිරීමට තරම් එඩිතර වූයේ කිතු දහම දේශීය ජනතාව වෙත ප්‍රබල ලෙස ප්‍රකාශ කර තිබූ නිසාය. ඒ අනුව කිතු දහම දේශානුරූපීකරණයේ මුඛ්‍ය පරමාර්ථය විය යුත්තේ දේශීය කිතුනු ජනතාව විශ්වාසයෙන් ශක්තිමත් කිරීමයි. ඔවුන්ට දැනෙන හැඟෙන ලෙස කිතු දහම කා වැද්දීමය. සමීප කිරීමයි. ජීවිතයේම කොටසක් ලෙස ප්‍රකාශ කිරීමයි. කිතු දහම දේශානුරූපීකරණය කිරීම මෙම අරමුණින් ඔබ්බට යන්නේ නම් එහි ප්‍රතිඵලයක් ද නැත. කිතු දහම දේශානුරූපීකරණය නොකළ යුතු යැයි ඉන් ගම්‍ය නොවේ. කිතු දහම දේශානුරූපීකරණය කිරීම අවශ්‍ය වේ. එමඟින් දේශයේ, අන්‍ය ජාතීන් හා ආගම් සමඟ සුහදව කටයුතු කිරීමේ හැකියාවද දේශීය සාමය හා සමඟිය ගොඩනැංවීමේ පියවරක් ද වන්නේ ය. "දේශීය කිතුනු සභාවක්" ලෙස නැගී සිටීමේ අවශ්‍යතාවය මතු වෙමින් පවතී. එය සුභදායක වේ. එහෙත් ඉහත දක්වන ලද කරුණු විමසීමේ දී එය ක්ෂණිකව සිදු කළ හැකි දෙයක් නොව ඉතාමත් සුපරික්ෂාකාරිව දේශීය සංස්කෘතියේ වටිනාකම් විකෘති නොවන ආකාරයටත් කතෝලික සභාවේ විශ්වාසය හා දේවධර්මයන්ට පටහැනි නොවන ආකාරයටත් සිදුකළ යුතු වේ.

✍ **ඔස්මන් සුසන්ත**

භාග්‍යවත් ජුසේ වාස් දේවධර්ම නිකේතනය

☛ 15 පිටුවට

# "සභා මාතාව තුළ ආදරය වෙමි මම"

## මහා මෙරක් වූ කුඩා මල සහ මහා මෙහෙවර - 11



කිසිම දෙයක් නැවත බලාපොරොත්තු නොවී සේවය කිරීම, එනම් දෙවියන් වහන්සේ උදෙසා පමණක් සේවය කිරීම තේරීස් තුමිය අවබෝධකර ගත්තාය. මා විසින් මගේ තෑගි වන්තකම, අනුනගේ ප්‍රශංසා ලැබීම සඳහා පෙන්විය නොයුතුය. මා උදව් කරන විට ප්‍රති උපකාර සලකා එසේ කිරීමත් හරි නැත. මේ ගැන ජේසුස් වහන්සේගේ වාක්‍යය නම්, 'නුඹට ප්‍රතිඵල ලැබෙන්නේ යයි බලාපොරොත්තු වී, ණයට දුන්නොත් නුඹට මොන ප්‍රසාදයක් ද? ඒ මක්නිසාදයත් පව්කාරයොත්, තමුන් දෙන පමණට තමුන්ට ලැබෙන පිණිස පව්කාරයන්ට ණයට දෙති...... නමුත් නුඹ යහපත කරන විට මෙලෝ ප්‍රතිඵල නොතකා කරන්න. එකල නුඹගේ විපාකය මහත් වන්නේය' යනුයි.

සත්‍යයෙන්ම මෙසේ ජීවත්වීමෙන්, අපගේ මෝක්ෂ විපාකය මහත් වන්නේය. මේ ලෝකයේදීත් එසේ වන්නේය. මේ මාර්ගයෙහි ගමන් කිරීමට පළමුවෙනි අඩිය තැබීම පමණක් අමාරුවේ. දෙවනු ලබා ගැනීමේ බලාපොරොත්තුවක් නැතිව ණයට දීම දුෂ්කර බව පෙනේ. යමක් ගන්නටම දීම ඊට වඩා පහසුය. මක්නිසාදයත් එසේ යමක් දුන්නාම, ඒ දෙයට තවත් අයිතිවාසිකමක් තමාට ඉතිරි නොවන්නේය.

සෑම කැඳවීමක්ම සම්බන්ධීකරන සහ බැඳ තබන විශ්වීය පදනම සහ සදාකාලික ආකෘතිය ආදරය බව එතුමිය සොයා ගන්නා ලදි. එතුමිය තුළ ප්‍රේම කිරීම සඳහා වූ අති මහත් දැවැන්ත උවමනාව එතුමියට අනාවරණය වූයේ, ශුද්ධ වූ පාවුලු තුමන් විසින් කොරෙන්තිවරුන්ට යවන ලද ලිපියේ ආදරය පිළිබඳ කොටස එතුමිය විසින් මෙනෙහි කිරීමේදීය.

අපෝස්තුළුතුමා කියන ලෙස ප්‍රේමය නොමැතිව ඉතා උසස් දීමනා පවා කිසිත් නැත. දෙවියන් වහන්සේ වෙත පැමිණීමට ඉතා සත්‍ය මාර්ගය නම් ප්‍රේම ධර්මය වන්නේය. අන්තිමේදි මගේ සමාදානය මට ලැබුණේය. මගේ කැඳවීම ප්‍රේම කිරීම බව මට සම්බ විය.

සියලුම දේව කැඳවීම් ප්‍රේමයෙන් යුක්ත බවත්, සෑම කාලයේද, සෑම ස්ථානයේද ප්‍රේමය තිබෙන බවත් මෙම ප්‍රේමය සදාකාලික බවත් මම තේරුම් ගතිමි. ඉක්බිති ප්‍රීති ප්‍රමෝදයකින් පිරී 'මගේ ජේසුනි, මගේ ප්‍රේමයෙනි, මගේ කැඳවීම දැන් මට දැනගන්නට ලැබුණේය. මගේ කැඳවීම නම් ප්‍රේම කිරීමය. ශුද්ධ වූ සභාවේ තුරුල්ලෙහි මගේ ස්ථානය මට සම්භවී තිබේ. එම ස්ථානය මට දුන්නේ මගේ දෙවියනි, ඔබවහන්සේය. අප මෑණියන් වූ ශුද්ධවූ සභාවේ වාසය කරමින් මම ප්‍රේම කරන්නෙමි.

මිහිරි වූ සහ ප්‍රීතිදායක වු ප්‍රේමය හැර අන් කිසි මංගල්‍ය භෝජනයක් දීමට මට ඇත්තේ නැත. ප්‍රීති වෙන්නන් සහ ප්‍රීති වුණාවූ ශුද්ධ වූ පාවුලු තුමන් අනුගමනය කිරීමට මම කැමැත්තෙමි. එතුමන් හඬන්නන් සමඟ හැඬූ සේක. ඉදින් මා දෙන්නාවූ ප්‍රේමයේ මංගල්‍ය භෝජන වලද සමහර විට කඳුළු මිශ්‍ර විය යුතුයි. එහෙත් කන්‍යා සහෝදරියන්ගේ කඳුළු සිනාවට හරවන්ට මම නිතර උත්සාහ දරමි. මක්නිසාදයත් ප්‍රීතියෙන් දෙන්නාට ස්වාමින් වහන්සේ ප්‍රේම කරන නිසාය.

එතුමිය තමන් සැබැවින්ම අයිති වන ස්ථානය එතුමිය විසින් සොයා ගන්නා ලදි. එතුමිය තමන්ගේ සැබෑ වාසස්ථානය සොයා ගැනීමට හේතුව, එතුමිය තමාගෙත් දෙවියන් වහන්සේගෙත් නිවෙස තුළ වාසය කිරීමට පටන් ගැනීමයි. එතුමියට මනුෂ්‍ය මට්ටමේ තේරුම් ගැනීමෙන් ඔබ්බට යන ඇතුලාන්ත සාමයක් හිමි විය. එයට හේතුව වූයේ එතුමිය තුළ එතුමිය කෙරෙහිම තිබූ සැක සංකාවන් සම්පූර්ණයෙන්ම දුරුවී යාමයි.

එතුමියගේ සැබෑ කැඳවීම ප්‍රේම කිරීම බව වැටහීමට පෙර, එතුමිය තුළ දෙවියන් වහන්සේ සමඟ තිබූ සම්බන්ධතාවය පිළිබඳව හීන මානයක් පැවතුණි. එනම් එතුමිය ඇත්තෙන්ම දෙවියන් වහන්සේට ප්‍රසන්න වන ලෙස ජීවත් වෙනවාද? එතුමිය දෛනිකව කරන සුළු පරිමාණයේ ක්‍රියාකාරකම් වලින් දෙවියන් වහන්සේ සෑහීමකට පත් වෙනවාද? එතුමිය විසින් සමස්ත ලෝකයම විශ්මයට පත් කරවන මහා පරිමාණයේ ක්‍රියාවන් කළ යුතුද? යන්නයි.

එතුමියගේ මරණයට මාස කිහිපයකට පෙර දකින ලද සිහිනයක මෙවැනි ප්‍රශ්නයන් සහ සැකසංකාවන් ඉස්මතු විය. එම සිහිනය තුළ ශාන්ත තෙරේසා තුමිය භාග්‍යවත් ජේසු තුමාගේ ඈන් (Blessed Anne of Jesus) තුමියගෙන් අසනලද ප්‍රශ්නය නම්, 'මව්තුමියනි, මා විසින් ඉටුකර ඇති සුළු ක්‍රියාවන් සහ චේතනාවන්ට අමතරව දෙවියන් වහන්සේ තවත් බොහෝ දේවල් ඉල්ලා සිටින්නේ නැද්ද කියා මට තවදුරටත් කිව මැනව? උන්වහන්සේ මා සමඟ සෑහීමකට පත් වී ඇද්ද?' යන්නය. එයට භාග්‍යවත් ඈන් තුමියගේ පිළිතුර වූයේ; 'උන්වහන්සේ සෑහීමකට පත් වී ඇත, බොහෝසෙයින් සෑහීමකට පත්වී ඇත' යන්නයි.

එතුමිය නින්දෙන් පිබිදුනු විට එතුමිය ඉතා ගැඹුරු සාමයක් අත්දකින ලදී. එමෙන්ම කාලයත් සමඟ එතුමිය මෙම වරප්‍රසාදය ගැන තව තවත් අවදිවීමට පටන් ගත්තේය. එතුමියගේ සැබෑ කැඳවීම කුමක්ද යන්න අවසානයේදී හඳුනා ගන්නා ලද්දේය.

අපගේ ජීවිතයන් සමඟ දෙවියන් වහන්සේ තෘප්තියට පත් වී ඇද්ද යන්න ගැන අප තුළ පවතින හීනමානය දුරුකර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් අප අපට තව තවත් ළං වේ. දෙවියන්වහන්සේ අප සමඟ සෑහීමකට පත් වී ඇති බව විශ්වාස කළ යුතු වේ. ඒ ගැන තෙරිස් තුමිය සවිස්තරාත්මකව ලියා ඇත.

'මාගේ අමෘතබර ජේසුනි, මම ඔබවහන්සේට ප්‍රේම කරමි. අපගේ මාතාව වූ ශුද්ධ වූ සභාවටද ප්‍රේම කරමි. පිරිසිදු ප්‍රේමයකින් කරන ඉතා සුළු ක්‍රියාවක් පවා, ඒ ප්‍රේමය නොමැතිව කරන මහත් වැඩ රාශියකට වඩා මෙම සභා මාතාවන්ට ප්‍රයෝජන වෙන බව මම විශ්වාස කරමි. නමුත් මගේ හෘදයෙහි පිරිසිදු ප්‍රේමයක් තිබේද? මගේ මේ මහත් ආශා මෝඩකම හේතුකොට උපදින ආශා විය නොහැකිද? අහෝ! මගේ ප්‍රේමය පිරිසිදු නොවේ නම්, මගේ ආශා මෝඩකමින් නික්මෙන ආශා නම් මට සත්‍යය පෙන්වා දුන මැනව. මා සත්‍යය සොයමින් ඉන්නා බව ඔබ දන්නා සේක. මගේ ආශා අඥාන වු නිර්භීතකමකින් හටගන්නේ වී නම් ඒවා නැති කර දැමුව මැනවි. මක්නිසාදයත් මෙම ආශාවන් මට මහත් දුෂ්කර ප්‍රාණ පරිත්‍යාග වේදනාවක් හා සමාන හෙයිනි. මගේ ආත්මය ආශාවන්නාවූ උසස් ප්‍රදේශවලට යම් දිනෙක පැමිණෙන්ට මට නොලැබේ නම් මෙම පරිත්‍යාග ජීවිතය, මේ අනුවණ කම (ඔබවහන්සේ ප්‍රාතිහාර්යකින්, පොළොවෙහි ඉන්න මගේ බලාපොරොත්තුව අහක් කළොත් විනා) සදාකාල භාග්‍යයකට වඩා මිහිරි දෙයක් කොට විඳගන්නෙමියි ප්‍රකාශ කරමි. ජේසුනි! මගේ අමෘතබර ජේසුනි! ඔබවහන්සේගේ ප්‍රේමයට ඇති ආශාව පමණක් මෙපමණ ප්‍රීති සංතෝෂයක් දෙන්නේ නම් සදාකාලයටම එය භුක්ති විඳින කල කෙසේ වේද?

මාගේ දෙවියනි, ඔබවහන්සේ මා වෙත ඇති ප්‍රේමය මම මෙපමණ දුරට තේරුම් ගෙන සිටිමි. මගේ එකම කටයුත්තත් ඔබවහන්සේට ප්‍රේම කිරීම වේ. නමුත් ස්වාමිනි, මට මෙය කිහිපවරක් මතක නැතිවී ගොස් තිබෙන බව ඔබවහන්සේ දන්නා සේක. මම ඔබවහන්සේ කෙරෙන් ඉවත්ව යාමෙන් මගේ කුඩා අත් හැඳි පොළොවේ මඩවලින් පෙඟී වේදනාවෙන් කුඩා ගේ කුරුල්ලාමෙන් අඬමි. ඔබවහන්සේට එය ඇසෙන්නේය. එවිට, ඔබ වහන්සේ ලෝකයට ආවේ, 'ධර්මිෂ්ඨයන්ට නොව පව්කාරයින්ට අඬගැසීමට, ඔබ ඔබගේ අනන්ත කරුණාබර කමින් සිහිකරන සේක.

මගේ ප්‍රේමවන්තයාණනි, මෙසේ ඔබවහන්සේ ඉදිරියේ මගේ ලුහුඬු ජීවන කාලය ගෙවී යන්නේය. මගේ ප්‍රේමය පෙන්වීමට, මල් විසිරීමට වඩා වෙන මාර්ගයන් මට නැත්තේය. මේ පුෂ්පයන් විසිරීම වනාහි ඔබවහන්සේ වෙත ප්‍රේමයෙන්, බැලීම සහ කතා කිරිම යනාදිය වන්නේය. ඔබ වෙත ප්‍රේමයෙන්ම, වේදනා උසුලන්ටත්, ප්‍රීති සන්තෝෂ භුක්ති විඳින්ටත් කැමැත්තෙමි. මේ මල් සියල්ලම ඔබහන්සේටය. මා විසින් නෙලා ගන්නා සියල්ලම, එකක්වත් නැර ඔබවහන්සේටමය. තවද කටු අතරෙන් රෝසමල් නෙලාග න්නට තිබුණත් මම එසේ කරනාතර ගී කියමින් සිටිමි. මෙම කටු තියුණු සහ දික්වන පමණට මගේ ගායනාව වඩ වඩා මිහිරි වන්නේය.



මහාචාර්ය **ඇන්ටන් මීමන**

# මානව ජීවිතය අධ්‍යාත්මික චාරිකාවකි - 3

## නිහඬතාවය - 3

**මට මටම ලබාදිය නොහැකි දෙයක් මට අනෙක් අයගෙන්ද ලැබෙන්නේ නැත. මට අනෙක් අයගෙන් ලැබෙන්නේ මම මටම ලබාදෙන දේවල් පමණි. මම අන්‍යයන්ට ලබා නොදෙන සෑම දෙයක්ම මට සදාකාලිකවම අහිමි වේ. අවසානයේදී මට ඉතිරිවන්නේ මම අන්‍යයන්ට ලබා දුන් දෙය පමණි.**

අන්‍යයන්ට මම දෙන ප්‍රමාණය වැඩි වන තරමට මට ලැබෙන ප්‍රමාණයද වැඩි වේ. මේ සෑම අධ්‍යාත්මික සත්‍යයක්ම නිශ්චලතාවය තුළ ජීවිතය ගැන ගැඹුරට මෙනෙහි කිරීමේදී අපට අවබෝධ වන කරුණුය. සත්‍යය ගවේෂණය කළ හැක්කේ නිසංසලතාවය තුළට තව තවත් සමීප වීමේ ප්‍රතිඵලයක් වශයෙනි.

නිසලතාවය අගය කරන, එය තම දෛනික ජීවිතයේ ප්‍රගුන කරන ජාතිය ශ්‍රේෂ්ඨ ජාතියකි. ඝෝෂාකාරීත්වයට ප්‍රමුඛතාවය දෙන්නා සත්‍යයෙන් පලා යන්නෙකි. එවැනි පුද්ගලයන් මහා ඝෝෂාවක් ඇති කර සත්‍යය යටපත් කිරීමට උත්සාහ කරයි.

ඝෝෂාකාරී පුද්ගලයන් හිංසාකාරී පුද්ගලයන්ය, කලහාකාරී පුද්ගලයන්ය. ඝෝෂාව ඇතුලාන්ත හිස් භාවයේ දෝංකාරයයි. ඇතුලාන්ත හිස් භාවයෙන් පැන නඟින ඝෝෂාවද හිස් ඝෝෂාවකි. නිසලතාවයට මුහුණ දිය නොහැකි පුද්ගලයා ඉතා භයානක පුද්ගලයෙකි. එවැනි පුද්ගලයෙක් තමන්ගෙන්ම පලා යමින් සිටින්නෙකි. තමන්ගේ ජීවිත යථාර්ථයෙන් පලා යමින් සිටින්නා අන්‍යයන්ට අනිවාර්යයෙන්ම බරක් බවට පත් වේ.

තමන්ගේ ජීවිතයේ යථාර්ථයන් බාර ගන්නේ නැතිව, ඒවාට ඉතා නිහතමානිව මුහුණ දෙන්නේ නැතිව, අන්‍යයන්ට ආශිර්වාදයක් බවට පත්විය නොහැකිය. අන්‍යයන්ට ආශිර්වාදයක් වීමට පෙර තමා තමාටම ආශිර්වාදයක් බවට පත් විය යුතුයි. අන්‍යයන්ට සැබෑ ලෙසම උදව් උපකාර කළ හැක්කේ තමාව නිසියාකාරව රැක බලා ගන්නා පුද්ගලයකුට පමණි.

අන්‍යයන්ට ගැඹුරින්ම, අවංකවම සහ නිහතමානිව ආදරය කළ හැක්කේ තමන්ට ආදරය කරන පුද්ගලයකුට පමණි. අන්‍යයන්ගේ මිතුරෙක් වීමට පෙර තමා තමාගේ හොඳම මිතුරා බවට පත්විය යුතුයි. එවිට මම දෙවියන් වහන්සේගේ කල්‍යාණ මිතුරෙක් බවට පත් වේ. දෙවියන් වහන්සේගේ මිතුරෙක් අන්‍යයන්ගේද සැබෑ මිතුරෙක් බවට පත්වේ.

ඇතුලාන්ත නිසලතාවය ඉබේ හට ගන්නා දෙයක් නොවේ. ඒ සඳහා ඉතා උවමනාවෙන්, උනන්දුවෙන් සහ උද්‍යෝගයෙන් ප්‍රයත්න දැරිය යුතු වේ, වෙහෙස මහන්සි විය යුතු වේ. අවසානයේදී නිසලතාවය දෙවියන් වහන්සේගෙන් අපට ලැබෙන තෑග්ගක් බව ඇත්තය. නිසලතාවය දේව වරප්‍රසාදයකි. නමුත් ඒ සඳහා මේ ලෝකය තුළ අප විසින් ඇති කරති ගෙන ඇති අනවශ්‍ය, අහිතරක සහ අයහපත් ඇලීම් ගැලීම්, ආශාවන් සහ අභිප්‍රායන් වලින් අවංකවම මිදීමට ප්‍රයත්න දැරීමට උත්සාහ දැරීම අත්‍යවශ්‍ය වේ.

ඝෝෂාකාරිත්වයෙන්, ඕපා දූප සෙවීමෙන්, අනුන් සමඟ තරග කිරීමෙන් නිසලතාවයට ප්‍රමුඛත්වය දිය හැකිය. මිනිසුන්ට වංචා කරන, බොරු කරන, අපහාස උපහාස කරන, පීඩා කරන, මිනිසුන්ව විනිශ්චය කරන, හාස්‍යයට ලක් කරන, විහිළු තහලුවට ලක් කරන, සැහැල්ලුවට ලක් කරන, සූරා කෑමට ලක් කරන සහ පහත් කොට සළකන ස්ථාන වලට යෑමෙන්ද වැලකීම අත්‍යවශ්‍යය.

එමෙන්ම රේඩියෝ, රූපවාහිනි යන්ත්‍ර වලින් සහ සංගීත සන්දර්ශන වලින් නිකුත් වන අධික ඝෝෂාකාරිත්වයෙන් ඈත්වීමද අත්‍යවශ්‍යය. ගැඹුරු අධ්‍යාත්මික ජීවිතයක් වැඩිදියුණු කර ගැනීමට මේවා බාධකයන්ය. මෙවැනි ඝෝෂාවන්ට ඇබ්බැහි වූවන් අතර ගැඹුරු අධ්‍යාත්මික වටිනාකම් සහිත ශාන්තුවර චරිත දැක ගත නොහැකිය.

එය එසේ වන්නේ ඒවාට ඇබ්බැහි වූ පුද්ගලයන්ගේ වරදක් නිසාම නොව, ඝෝෂාව විසින් සුළු වශයෙන් හෝ පවතින ඇතුලාන්ත නිසලතාවය සම්පූර්ණයෙන්ම විනාශ කර දමන නිසයි. ඇතුලාන්ත නිශ්චලතාවය බිඳුනු පුද්ගලයා අතරමං වූ පුද්ගලයෙකි, අනාථ වූ පුද්ගලයෙකි, අසරණ පුද්ගලයෙකි. අවාසනාවන්ත පුද්ගලයෙකි.

සාමාන්‍ය පෘථග්ජනයින් කරන කියන දේවල් ඇඩි ලෙස විනිශ්චයකට භාජනය කිරීමක් මෙයින් අදහස් නොකෙරෙයි. නමුත් මෙයින් අදහස් කරන්නේ අධ්‍යාත්මික ජීවිතයක් ගත කිරීමට බාධාකාරි වන ඕනෑම දෙයකින් මිදීමට, නිදහස් වීමට ධෛර්යමත් කිරීමකි.

දෙවියන් වහන්සේ තුළ දෛනිකව තෘප්තිමත් ජීවිතයක් ගත කිරිමට රූපවාහිණි යන්ත්‍රය බාධාවක් නම් අප එයින් අනිවාර්යයෙන්ම නිදහස් විය යුතුවේ. ඒ සඳහා ඇති බාධාව රේඩියෝව නම්, එයින් නිදහස් වීම අත්‍යාවශ්‍ය වේ. ඊට ඇති ප්‍රධාන බාධාව ක්‍රිකට් ක්‍රීඩාව නම්, එයින් අප ඈත් විය යුතු වේ. ඒ සඳහා දුම්බීම, මත් පැන්, මත් ද්‍රව්‍ය, ලිංගික හැඟීම්වලට වහල් වීම යනාදිය බාධාවන් වේ නම් ඒ සෑම දෙයකින්ම නිදහස් විය යුතු වේ.

දෙවියන් වහන්සේට ළංවීමට බාධා කරන සෑම දෙයක්ම උන්වහන්සේගේ සතුරෙකි.

ඉදිරි කලාපයට... »

දැල්වෙන පහන්

# සමිඳු සේවයට කැපවූ ගරු ෆ්‍රැන්සිස් සේනානායක සහ ගරු ඉග්නේෂස් සේනානායක පියතුමෝ

ජේසු සමිඳු සේවයට ඇපවූ කැපවූ අපේ පැවැදි පූජක පුතුන් හඹා යන ගමනේදී මේ අයියා මලෝ දෙපළ මෙදා අපට මුණ ගැසුනේ බඩල්ගම ග්‍රාමයෙන්. බඩල්ගම මීසමට අයත් ගොඩිගමුව ශාන්ත බෙනඩික් මුනින්ද්‍රයාණන්ගෙ දේවස්ථානය නම් හරි ප්‍රසිද්ධයි. සැන්බෙනඩික් බොරලික්කමත් යක්කු අහලගම් හතකට එන්නැති එසේ මෙසේ එකක්ද? අහල ඇතිනෙ.

මේ සුවාමි පවුලෙ දරුවො තුන්දෙනයි. තුන්දෙනාම සරොම්. එක චීත්තයක්වත් නැහැ. ඉතින් වැඩිමලා ලොක්කයියා ගිය මාර්ගය ආදර්ශයට ගත්ත බඩපිස්සාත් සුවාමි ලෝගුවම තෝරාගත්තා. දැන් මේ පියතුමන්ලා දෙනමම නම් දරාපු ඇයො. මද්දුමයට ඉතිරිවෙලා තිබුණෙ ආශිර්වාදකාර බන්ධනය නමැති දේව ප්‍රසාද නිධානය විතරයි. ඉතින් තුන්වැන්නා ඒ මගට බැස්සා.

සේනානායක මුදලිගේ ලාවුස් අප්පුහාමි කිව්වාම බඩල්ගම, ගොඩිගමුව, මඩම්පැල්ල වාගෙ ගම්වල නම්දරාපු චරිතයක්. උන්නැහැගෙ බිරිඳ, දෝන තෙරේසා මදුරාවල රෙද්ද හැට්ටෙ ඇඳපු චාම් කාන්තාවක්. මේ දෙපළ තමයි අය්යා මලෝ සුවාමිලා දෙන්නාගෙ දෙමාපියන්. දේවාශිර්වාදයෙන් පිරිච්ච ආදර්ශවත් පවුලක්. පවුල් දාහකට එක දේව කැඳවීමක් වත් නැති මේ කාලෙ එකම පවුලෙන් සුවාමිලා දෙන්නෙක්ම බිහිවුනාම ඒ ගැන නොලියා පුළුවන්ද?



ගරු ෆ්‍රැන්සිස් පියතුමා

ගරු ඉග්නේෂස් පියතුමා

නමසිය පනස් ගණන් වල අගභාගෙදි කලිසන් කොටයක් ඇඳගෙන එදා ගල්ලැල්ලයි ගල් කුරයි අරන් ගොඩිගමුව රෝමානු කතෝලික පාසලේ අකුරු කළ ප්‍රැන්සිස් නික්ලස් කොළු පැටියා කොළඹ අගරදගුරු පදවියෙ භාණ්ඩාගාරික ධූරයත් සමඟ සභාවේ විවාහ අධිකරණ නාහිමි ධූරයත් යන ක්ෂේත්‍ර දෙකේම අද පදවි ප්‍රාප්තවෙයි කියලා හිතුවෙ කව්ද? ඒ දෙකම වෙලා දැන් අවසානයි. දුක්මහන්සියෙන් ඉගෙන ගෙන ඉක්මන් පියවර තබමින් ඉහළට ගිය මේ උගත් වියත් පියතුමා රෝමයේ උර්බානියානා සරසවියෙන් ශාසන නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබාගෙන 1989 වෙත්දි මවුබිමට ආවා.

ගොඩිගමුව, මඩම්පැල්ල හා මීගමුව සා. මරියා යන පාසල් විදුහල් වල මූලික අධ්‍යාපනය ලබා ඇනුම් සම්භාරයක් පොදි බැඳගෙන පූජාප්‍රසාදි තුමකු වීමේ එකම අරමුණින් තරුණ ප්‍රැන්සිස් බොරැල්ල සා. ඇලෝසියුස් දෙව්සත්හලට ඇතුළුවුණේ 1969 දී. හපුතලේ හාවඩන්හි සා. එමාඩ් දෙව්සත්හලට ඇතුළුවී වසර දෙකක කාලයක් එහි රැඳුණු තරුණ ප්‍රැන්සිස් නික්ලස් ඊළඟට පා තැබුවේ අම්පිටියේ ජාතික දෙව්සත්හලටයි. දේව ධර්මය දර්ශනවාදය වැනි ගැඹුරු විෂයයන් අධ්‍යයනය කරද්දී ලද විවේකයේදී තරුණ පූජක සිසුවාගේ හිත ගියේ වසර 50 ක ස්වර්ණ ජයන්තිය නිමවා තවත් වසර හතක් පෙරට ඇදීගිය දෙව්සත්හලේම පිහිටි ගොන්සාල්වෙස් සිංහල ආයතනය වෙතයි.

එකම පාට පිහාටු ඇති කුරුල්ලන් එකටම සැරිසරන්නාක් වාගේ සිංහල සාහිත්‍යයට සංස්කෘතියට සහජ ඇල්මක් දැක්වූ පූජක හෙළ දරුවන්ගේ තෝතැන්න වූයේද ගොසිආව බව අමුතුවෙන් කිව යුතු නැහැ. ගොසිආව වසරක් වසරක් පාසා බිහිකරන අපේ පූජක පුතුන් අතින් එළිදක්වන ගීත, ගීතිකා, තනු, නාට්‍ය, පොත පත කෙතරම් අගේද?

1980 ජූලි 5 වැනි දින කොටහේන සා. ලුසියා ආසන දෙව් මැඳුරේදී පූජකවරම් ලද පූජක තේවාචාරිතුමා එදා සිට ගරු ප්‍රන්සිස් නික්ලස් සේනානායක පියතුමා බවට පත්වුණා. මුලින්ම මීගමු මහවීදිය මීසමේ සහයක බවට පත්වීම ලද සේනානායක පියතුමා ඉනික්බිතිව වාද්දුව, පිටිපන හා කළුතර දහම් සෙවන දෙවසත්හලෙහි අධ්‍යක්ෂ වශයෙන්ද සේවය කොට තිබෙනවා. මෙතුමා කෝන්ගොඩමුල්ල සා. අන්තෝනි දේවස්ථානය භාරව සිටි වසරක කාලයද අප අමතක නොකළ යුතුයි.

ගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක පියතුමා අපේ පාඨකයන් හඳුනන්නේ කතෝලික පුවත්පත් සඟරා වලින් විවාහ ගැටලු තරුණ ප්‍රශ්න විසඳන කෘතහස්ත




ලේඛකයකු හා ජංගම ශබ්ද කෝෂයක් හැටියටයි කීවොත් මා වැරදි නැහැ.

සේනානායක පවුලෙ ඊළඟ පූජක පුත්‍රරත්නය තමයි, ඉග්නේෂස් සේනානායක ගරු පියනම. අයිය මලෝ දෙන්නාම මූලික අධ්‍යාපනය ලබාගෙන තියෙන්නෙ මඩම්පැල්ල ගොඩිගමුව පාසල් වලින්.

සමිඳු මිදි උයනේ පැවදි සේවකයකු හැටියට බලාපොරොත්තු තියාගෙන තරුණ ඉග්නේෂස් ගාලු පදවියට අයත් කලේගාන සා. සේවියර් දෙව්සත්හලට ඇතුළු වී තිබෙන්නේ, 1977 දී. 1986 දී අතිඋතුම් එඩ්මන්ඩ් ප්‍රනාන්දු රදගුරු තුමන් අතින් මෙතුමා පූජක අභිෂේකය ලබාගත්තා. නවක පියතුමා කොළඹට කිරි ගමට කැකිරි ජනප්‍රිය කියමනට තිත තබමින් තම පූජක සේවාව සඳහා තෝරා ගත්තේ හද්ද පිටිසර ශීතලෙන් ගැහෙන බදුලු පදවියයි. දැනට වසර 19 ක් තිස්සෙ බදුල්ල පදවිය තුළ බිබිලෙ ශුද්ධවූ පවුලේ මීසම. බණ්ඩාරවෙල ධර්මෝපදේශ මධ්‍යස්ථානය, හපුතලේ හාවඩන්, බදුල්ල උස්කොඩ් ආයතනය වැනි ස්ථාන කීපයක කළ උපදේශනය නිසාම වැඩිපුර අධ්‍යාපනය සඳහා මෙතුමා වසරක කාලයක් පිලිපීනයේ මැනිලාහි ජේසු නිකායික සරසවියට ඇතුළුවූවා.

මැනිලාවෙන් ලබාගත් ඇනුම් සම්භාරයත් සමඟ සිරිලකට පාතැබූ ඉග්නේෂස් පියතුමා බණ්ඩාරවෙල දෙහිඅත්තකණ්ඩිය, ලත් පඳුර වැනි දුෂ්කර පළාත්වල අදටත් කරන දහම් වගාව සුළුපටු නොවෙයි. සේනානායක පවුලේ මේ අයියා මලෝ පියවරු දෙදෙනාටම අපි දෝත එක්කර ඉතසිතින් 'ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා සුවාමිලා'යි කියමු.

**මොරිස් බොල්ලෑගල**

## ධර්මදූත ළමා සමාජය බිහිවී වසර 25 ක රිදී ජයන්ති සැමරුම වෙනුවෙන් පිදෙන තිළිණයක්

# සමරා බැතින් ලද ආසිරි, පෙරටම යමු, පුංචි අපි ධර්මදූතයෝ !

අද පවතින අයුරින් ශ්‍රී ලංකාවේ ධර්මදූත ළමා සමාජ බිහිවී වසර 25 ක් ගෙවෙන ජයන්ති සැමරුමට සූදානම් වෙද්දි ප්‍රථමයෙන්ම දෙවි සමිඳුන්ට අපි සැම මෙසේ කියමු.

තුති පුදමි ඔබට සමිඳේ
මුළු හදවතින් මගේ
මගේ මියේ බස් ඔබ ඒ ඇසුවෝ
සුරදූවන් හමුවේ
පුදමි ඔබට තුති ගී//

'ළදරුවන් මා වෙතට එන්න ඉඩහරින්න. ඔවුන් නොවලක්වන්න. දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳු අය සන්තක හෙයිනි.' (මාර්කු 10:14). වැඩිහිටියන්ට මෙසේ අනුශාසනා කරමින්, කුඩා දරුවන් තුරුල් කරගෙන, ඔවුන් පිට අත් තබා, ඔවුන්ව ආශිර්වාද කළ ජේසුස් ස්වාමින් වහන්සේ, කුඩා දරුවන්ගේ උතුම්කමත්, එතුමාණෝ ඔවුනට ප්‍රේමකරන බවත්, අපට පෙන්වන සේක. එසේ කියමින් අපිදු කුඩා දරුවන් අගේ කළ යුතු බවත්, ඔවුන් ආරක්ෂා කරමින් ඔවුන් සැම එතුමන්ටම කිට්ටු කළ යුතු බවත්, කියා දෙන සේක. මේ සමිඳු ආරාධනයට අවනත වෙමින් තමා, ශ්‍රී ලංකාවේ අද පවතින ආකාරයට ධර්මදූත ළමා සමාජයට මුලපිරුණේ.

මෙහි ආරම්භය අපට දැකිය හැක්කේ අනුරාධපුර පදවියේ හිඟුරක්ගොඩ මීසමේදීය. එදා ධර්මදූතාධාර සංගම් පදවි අධ්‍යක්ෂ ගිල්බට් පෙරේරා පියතුමා, ශ්‍රී ලංකාවේ ප්‍රථමයෙන් මේ සංගමය වෙනුවෙන් සජීවක සජීවිකාවන් කණ්ඩායමක් පුරුදු පුහුණු කිරීම සඳහා එවකට ජාතික අධ්‍යක්ෂව සිටි ගරු මැල්කම් රංජිත් පියතුමාට - (අද මැල්කම් කාදිනල් රංජිත් කොළම අගරදගුරු හිමිපාණන්ට) ආරාධනා කළේය. එතුමන් සමඟ එතුමාගේ ලේකම් තුමිය ලෙස ක්‍රියාකළ ගරු බෙනඩික්ට් සොහොයුරියද මේ සමුළුවට සහභාගි විය. ඒ සඳහා අනුරාධපුර පදවියෙන් තරුණ තරුණියෝ 16 දෙනෙක් රැස්කර සිටියහ. මේ සජීවිකාවන්ගේ



පුහුණුවත් සමඟ ශ්‍රී ලංකාවේ අද පවතින ආකාරයට ධර්මදූත ළමා සමාජයට මුල පිරුණේය. ඒ ක්‍රි.ව. 1987 සැප්තැම්බර් මස 11, 12, 13 යන සති අන්තයේදීය. මෙහිදී අපි. අද අප අතර නැති ගරු ගිල්බට් පෙරේරා පියතුමාවද, ගරු බෙනඩික්ට් පැවිදි සොහොයුරියවද ස්තුති පූර්වකව බැතියෙන් සිහිකරමු.

මෙලෙසින් ආරම්භ වුණු ධර්මදූත ළමා සමාජය ක්‍රි.ව. 1990 වසර වන විට එදා ස්ථාපිතව තිබූ ශ්‍රී ලංකාවේ පදවි සියල්ලටම පැතිරී ගියේය. අද මුළු ලංකාවේම, සැම පදවියකම, සැම දිසාවකම, සැම මීසමකම හා සැම දේවස්ථානයකම, ජේසු සමිඳුන්ගේ ආරාධනය ලද ධර්මදූත ළමා සමාජ ක්‍රියාත්මක වෙමින් පවතී. මෙහි මූලික අරමුණු මතක් කරන්නේ නම්: ජේසුව අඳුනාගැනීම, ජේසුව ජීවත්වීම හා ජේසුව අන් අයට අඳුන්වා දීම යනුයි.

මේ අයුරින් ආරම්භ වී ක්‍රියාත්මක වන ධර්මදූත ළමා සමාජය, ඉදිරියටත් සමිඳුන්ට ප්‍රිය ප්‍රසන්න වෙන අයුරින්ම එළදායි ලෙස වර්ධනය වේවා යනු මගේ ඒකායන පැතුමයි. ඒ සඳහා දෙමව්පිය, වැඩිහිටි හැමෝගේ ම උනන්දුව හා සහයෝගය වැඩි වැඩියෙන් දිගටම ලැබේවා!

ධර්මදූත ළමා සමාජ ජාතික අධ්‍යක්ෂ
**ගරු රෙජිනෝල්ඩ් සපරමාදු පියතුමා**

**" සමරා බැතින් ලද ආසිරි, පෙරටම යමු පුංචි අපි ධර්මදූතයෝ "**

**හෙළ බිමේ ධර්මදූත ළමා සමාජ බිහිවී වසර 25ක් ගෙවන රිදී ජයන්තිය සැමරුම 2012-11-03 සහ 04 හිඟුරක්ගොඩදී**

මෙදින ඔබත් අප හා යැදුමින් එක්වන්න.
25 වසරක් පුරා දහම් කෙත අස්වැද්දූ සජීවකයෙනි, සජීවිකාවනි, පුංචි ධර්මදූතයිනි, දූතිකාවෙනි
**ඔබට අපේ උපහාරය !**

25 වන සංවත්සරය
1987 - 2012
25 th Anniversary
25வது வருட நிறைவு



වැඩසටහන් විස්තරය

2012.11.03
සවස 3.00ට ලියාපදිංචිය සිදුවන අතර දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව සහ ජපමාල උච්චාරණය සිදුකෙරේ. සන්ධ්‍යාවේදී විවෘත සංවාද මණ්ඩපය සහ රාත්‍රියේදී ගිනිමැල සංදර්ශනයක් පැවැත්වේ.

2012.11.04
උදෑසන ආරාධිත අමුත්තන් පිළිගැනීමෙන් පසු අති පිදීමේ දිව්‍ය පූජාව පැවැත්වේ. ඉන් අනතුරුව උත්සව සභාව උදෑසන 11.00 සිට පැවැත්වේ.

ඒ ඒ පදවිවල සජීවක පුහුණු පැවති කාල වකවානු හා ධර්මදූත ළමා සමාජ ආරම්භය



# ශ්‍රී ලංකාවේ ධර්මදූත ළමා සමාජයේ 25 ජයන්ති සංවත්සරය සැමරීම

1843 වසරේදී චාල්ස් ද ෆොබැන් ජැන්සන් රදගුරුතුමා ආරම්භ කළ ධර්මදූත ළමා සමාජයට දීර්ඝ ඉතිහාසයක් ඇත. මෙම සංගමය ආරම්භ කළේ කතෝලික දරුවන්ට ජේසුව දැනගන්නත්, ජේසුගේ ඉගැන්වීම් අනුව ජීවත්වන්න සහ ඔවුනගේ විශ්වාසය කුඩා කල සිට තර කිරීමටත්ය.

මෙම පසුබිම හා දර්ශනය තුළ හිටපු ශුද්ධාසනීය සංගම් හි ජාතික අධ්‍යක්ෂ ගරු මැල්කම් කාදිනල් රංජිත් පියතුමා (අද මැල්කම් කාදිනල් අගරදගුරුහිමි) කොළඹ පදවියේ ශුද්ධාසනීය සංගම්හි පදවි අධ්‍යක්ෂ ගරු ෆ්‍රැන්සිස් ප්‍රනාන්දු පියතුමාද, මෙම ලිපිය ලියන බදුල්ල පදවියේ ශුද්ධාසනීය සංගම්හි පදවි අධ්‍යක්ෂ ගරු මාර්ෂල් රාජනායගම් පියතුමාද 1987 දී තායිලන්තයේ බැංකොක් නුවරට අන්තර් ජාතික රැස්වීමකට ගියෝය.

ගරු මැල්කම් රංජිත් පියතුමාගේ දර්ශනය හා නව දැක්ම අනුව ආසියාවේ පමණක් නොව අනෙක් රටවලටත් ළමුන්ගේ විශ්වාසය වැඩිකිරීමටත් ඒ විශ්වාසය තුළ ජීවත් වීමටත් එය බෙදාගැනීමටත් සැමටම පුළුවන් වුණා.

තායිලන්තයේ සිට නැවත පැමිණි ජාතික අධ්‍යක්ෂ පියතුමා සහ මම හැම පදවියකම සිංහල හා දෙමළෙන් වැඩසටහන් කර වැඩමුළු හා සම්මන්ත්‍රණ පවත්වා සජීවක සජීවිකාවන් පුහුණු කර හැම මීසමකම ඒ ඒ පදවිවල අවශ්‍යතාවයන් අනුව ඒකක මෙහෙයවූවා.

දැන් මෙම ධර්මදූත ළමා සමාජය පදවි 11 ටම පැතිරී ඇත්තේ රදගුරුවරුන්ගේද පදවි අධ්‍යක්ෂවරුන්ගේද උනන්දුව හා උත්සහය මතය. මෙම ධර්මදූත ළමා සමාජය මගින් ශු. සභාවේ පදවි පූජකත්වයට හා පැවදි සොයුරියන් වීමට කැඳවීම් රාශියක් ලැබී තිබේ. මට හරි සතුටුයි ගරු මැල්කම් රංජිත් පියතුමාගේ උනන්දුවෙන් හැම පදවියකටම ගොස් තරුණ තරුණියන් හා ළමුන්ව උනන්දු කරවා දැනුවත් වැඩසටහන් පවත්වා මෙමෙ ළමා සමාජය ශ්‍රී ලංකාවේ ශක්තිමත් සමාජයක් බවට පත් කර තිබෙන නිසා.

ධර්මදූත ළමා සමාජයේ ආරම්භයේ පටන් මම අවුරුදු 20 කට වඩා අනෙක් පදවි අධ්‍යක්ෂවරුන් සමඟ වැඩකර අවුරුදු 25 කින් එහි ප්‍රතිඵල දකින්නට ලැබීම පිළිබඳව මට හරිම ආඩම්බරයි. මෙම ධර්මදූත ළමා සමාජය ශ්‍රී ලංකාවේ වැඩිවර්ධනය වී දෙවියන් වහන්සේගේ මඟ පෙන්වීම ලැබ අපේ දරුවන් එදිනෙදා ජීවිතයේ ජේසුව අත්දැකීමේදීත් ඒ තුළ වැඩිවර්ධනය වීමේදීත්, ජේසුව පතුරුවාලීමේදීත් ඇතිවන බාධා සහ අමාරුකම් ජයගෙන ඉදිරියට යන සැටි අපට පෙනේ.

අපගේ ස්වාමින් වහන්සේ පැවසූ වදන් නිතරම අපේ සිත් තුළ රැව්දේ. එනම්, 'බාලයන්ට මා වෙතට එන්න ඉඩහරින්න. දේව රාජ්‍යය මෙබඳු අය සන්තකය.'

**අති උතුම් මාර්ෂල් රාජනායගම් පියතුමා**

**පුංචි රෝමය ... 1 පිටුවෙන්**

මෙහිදී විවාහ අධිකරණ කලාපීය නාහිමි අතිගරු ප්‍රැන්සිස් නික්ලස් සේනානායක, පිටිපන සහයක ගරු චමින්ද, වැල්ලවීදිය මීසම් සේවක ගරු ටෙරන්ස් බෝදියාබදු පියතුමන් ඇතුළු කීපදෙනෙක් කතා කළහ. විශ්වාසයේ වසරට සමගාමීව කතෝලික ජනසන්නිවේදන අධ්‍යක්ෂ ගරු බෙනඩික් ජෝශප් පියතුමා මාධ්‍ය හමුව සංවිධානය කැර තිබිණ.

**සයවැනි අන්තර්ජාතික ... 1 පිටුවෙන්**

2012 ඔක්තෝබර් මස 18 බ්‍රහස්පතින්දා දින සවස හලාවත රදගුරු පදවියට අයත් නයිනමඩම මීසමේ වික්ෂෝප දේවමාතා දෙව්මැඳුරේදී එම සමුළුවේ සමාරම්භක උත්සවය සහ දිව්‍ය යාගය, ශ්‍රී ලංකාව නියෝජනය කරන වතිකාන අපෝස්තලික තානාපති අති උතුම් ජෝශප් ස්පිටෙරි අගරදගුරු හිමිපාණන්ගේ මූලිකත්වයෙන් පැවැත්වීමට නියමිතව ඇති අතර, සමුළුවේ අවසාන රැළිය සහ දිව්‍ය යාගය 2012 ඔක්තෝබර් මස 24 වෙනි බදාදා උදෑසන කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් රංජිත් කාදිනල් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් තේවත්ත ලංකා අප ස්වාමිදුවගේ ජාතික බැසිලිකාවේ දී සිදු කිරීමට නියමිතය.

**තුඩැල්ල ක්‍රිස්තුරාජ... 1 පිටුවෙන්**

එබැවින් කිතුරදමව්ගෙන් අකුරු කියවූ ගරු පියතුමන්, සහෝදරතුමන් ඇතුළු වෘත්තිකයන් සහ අනිකුත් සියලුම ආදි ශිෂ්‍යයින්ගේ විස්තර ලබාගැනීමට බලාපොරොත්තු වේ. දෙස් විදෙස්හි සිටින ඔබගේ තොරතුරු විද්‍යාලයේ විදුහල්පති ගරු පියතුමන්ට 0112233030 හෝ ආදි ශිෂ්‍ය සංගමයේ ගරු ලේකම් එම්. ග්‍රේෂන් පීරිස් මහතාට 0714297321 දුරකථන අංකයන්ට අමතා ලබා දිය හැකිය. එමෙන්ම ආදි ශිෂ්‍ය සංගමයේ විද්‍යුත් තැපැල වන christkingcollegetudella psa@gmail.com හෝ මුහුණුපොත Ckc past students මඟින්ද ලබා දිය හැකිය.

**දේව සේවක .. 1 පිටුවෙන්**

කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙම දිව්‍ය යාගයට විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් හා අති උතුම් නික්ලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් ද, අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු හා අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණන් ද, කලාපීය නාහිමිවරුන් ද පූජක පැවදි සංඝයද සහභාගි වෙති.

මෙදින තේවත්ත බැසිලිකා සිද්ධස්ථානයට පැමිණ දිව්‍ය යාගයට සහභාගි වන ලෙස දේව සේවක තෝමස් කාදිනල් කුරේ හිමිපාණන් ශුද්ධවරයට එසැවීමේ කමිටුව සැදැහැවතුන්ට ඇරියුම් කෙරේ.

**පාසලේ සහ .. 1 පිටුවෙන්**

මෙම වැඩමුළුව 2012 ඔක්තෝබර් මස 20 දා පෙ.ව. 9.00 සිට පෙ.ව. 11 දක්වා දේවධර්ම පීඨය, බොරැල්ල ඇක්වයිනස් විශ්ව විද්‍යාලයීය ආයතනයේ ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ මාධ්‍යයන්ගෙන් ගරු මේරි සඳානි පැවදි සොහොයුරිය (අ.කා)- සිංහල, ෆ්‍රැන්සිස්කා රාජයෝජිනි (දෙමළ) සහ රොසෑන් ඒවරි (ඉංග්‍රීසි) දේශකයන්ගේ මෙහෙයවීමෙන් පැවැත්වේ.



බලගල සදාසරණ දෙව්මැඳුරු දහම් පාසල් ගොඩනැගිලි අරමුදලට ආධාර පිණිස හැඳල බලගල දීපාලෝක සුභ සාධක සංගමය මගින් පුරා තෙදිනක් මුළුල්ලේ අලෙවි සැලක් පවත්වන ලදී. මෙහි දැක්වෙන්නේ ගරු කමල් නිශාන්ත සහෝදර තුමා බලගල අශෝකාරාමාධිපති පූජ්‍ය බටගල්ලේ පඤ්ඤකිත්ති හිමියන් සමග තුන්වන දිනයේදී පොල් තෙල් පහන් දල්වා අලෙවි සැල විවෘත කළ අවස්ථාවයි. **(නිමල් පෙරේරා)**




පසුගියදා පල්ලන්සේන වික්ෂෝප දේවමාතා වහන්සේගේ දෙව්මැඳුරේ 125 වෙනි ජුබිලි මංගල්‍යය නිමිත්තෙන් මීසමේ තරුණකැල දෙව්මැඳුර ඉදිරිපිට ඉදිරිපත් කළ අලංකාර පොල් තොරණයි මේ.

**(සේයා - සිතුම් නිලුමින්ද, සටහන - ඩබ්. හෙක්ටර් ප්‍රනාන්දු)**

**දේශානුරූපීකරණය ... 12 පිටුවෙන්**

මේ අනුව මෙම ලිපියට පාදක වූ මූලික ආනුභූතිය වන අලියා පිට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ගෙන යාමේ සංසිද්ධිය කිතු දහම දේශානුරූපීකරණය කිරීමේ පරමාර්ථයෙන් සිදුකළා විය හැකිය. එහෙත් දේශීය කිතුනු ජනතාව ඒ පිළිබඳ අප්‍රසාදයක් හෝ දේශීය කිතුනු ජනතාවගේ විශ්වාසය හීනකරවීමට පෙළඹවීමක් සිදුවූවා නම් එම දේශානුරූපීකරණයේ පරමාර්ථය පරාජය වී තිබේ. තවත් අතකින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ යනු ජීවමාන ජේසුස් වහන්සේම ය. කිතුනුවන් අපගේ ගැලවුම්කරුවාණන් වන ජේසුස් වහන්සේ දිව්‍ය සත්ප්‍රසාදය තුළ ජීවමානව වැඩසිටින බව අපි විශ්වාස කරමු. අදහන්නෙමු. එහෙත් මේ බව බොහෝ අන්‍යාගමිකයෝ නොදන්නවා විය හැකිය. එසේම ඒ බව තිරිසනාද නොදනියි. මේ නිසා අන්‍යාගමිකයන්ට ද ඉන් වැරදි වැටහීමක් ඇතිකරලීමට පෙළඹීමක් ඇතිවිය හැකිය. ජීවමානව දිව්‍ය සත්ප්‍රසාදයේ වැඩසිටින ජේසුස් වහන්සේට අප උත්කෘෂ්ඨ වන්දනාවත් ගෞරවයත් පුදන්නෙමු. එම උත්කෘෂ්ඨ වන්දනාවට හා ගෞරවයට හානිකර දේ වලින් වැළකී සිටීමට අප පියවර ගත යුතු වන්නේ නොවේ ද?

මේ සියලු කරුණු කාරණා විමසීමේ දී මෙම සංසිද්ධිය සුදුසුද නැද්ද යන්න තීරණය කිරීම පාඨක ඔබට භාර කරමු. ඒ පිළිබඳ පාඨක ඔබගේ අදහස් විවිධ විය හැකිය. දේශානුරූපීකරණය කිරීමේ අරමුණින් සිදු කළ මෙම ක්‍රියාව සම්බන්ධයෙන් ඇතැමෙක් පක්ෂපාති විය හැකිය. තවත් සමහරෙක් එයට විපක්ෂ විය හැකිය. එහෙත් මේ ලිපිය එම සංසිද්ධිය පක්ෂ යැයි හෝ විපක්ෂ යැයි හෝ ගම්‍ය කරගැනීමට තරම් ප්‍රමාණවත් නොවේ. එසේ වුවද ජනවන්දනාත්මක වශයෙන් හෝ වේවා වෙනයම් භක්ති අභ්‍යාස මඟින් හෝ කලා ශිල්ප ගෘහ නිර්මාණ ශිල්ප මඟින් හෝ වේවා කිතු දහම දේශානුරූපීකරණය කිරීමට යාමේ දී ඒ පිළිබඳ දූරදර්ශී දැක්මකින් හා පුළුල් අවබෝධයකින්ද නිසි පිළිවෙලකට හා නිසි ක්‍රමවේදයන්ටද අනුකූලව සිදුවන්නේ නම් වඩාත් යෝග්‍ය වන්නා සේම ඉන් මතුවිය හැකි අනවබෝධයන් හා ගැටලු ද අවම කරගත හැකිවනු ඇත.



**කිඹුලාපිටිය මීසමේ ආඩිඅම්බලම ශු. ජපමාල මාතා දේවස්ථානයෙන් බිහිවූ පූජක පුතකු වූ ගරු රොෂාන් ජනප්‍රිය වාස් නි.ම.නි. පුතුන්ගේ කුළුඳුල් දිව්‍ය පූජා යාගය පසුගියදා එම දෙව්මැඳුරේ දී පැවැත්විණි.**

එම දෙව්පුද මෙහෙයට පැමිණි නවක පියතුමන් එම පියතුමා පදිංචි දෙව්මැඳුරට අයත් පස්වන කොට්ඨාශයේ නායක එස්. එම්. ඇනස්ලි මහතා මල්මාලාවක් දමා පිළිගත් අයුරු සේයාරුවෙන් දිස්වේ. එම කොට්ඨාශ නායිකාව සමඟ කිඹුලාපිටිය මීසම් සහයක ගරු ෆීලික්ස් ශාන්ත පියතුමාද මෙහි වෙති. **(සේයා - ටී සුනිල් ප්‍රනාන්දු)**



පමුණුගම බෝපිටිය මංසන්දියට හැටන් නැෂනල් බැංකු ශාඛාවක් විවෘත විය. එහිදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි ජයන්ත පෙරේරා මහතා පහන් දැල්වීම මෙහි දැක්වේ. ගරු කෙනඩි පෙරේරා පියතුමා සහ නියෝජ්‍ය ඇමති නියෝමාල් පෙරේරා මහතා මෙහි වෙති. **(සේයා - බෙන්ජමින් කරිහෙට්ටි)**

## පමුණුගම බෝපිටිය ලොයොලා විදුහලේ නව ගොඩනැගිල්ලට මුල්ගල තැබේ



පමුණුගම බෝපිටිය ලොයොලා විද්‍යාලයේ අභිනවයෙන් තනන උසස් පෙළ පංති දෙමහල් ගොඩනැගිල්ලට මුල් ගල තැබීම කොළඹ අගරදගුරු පදවියේ විශ්‍රාමික අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් අතින් සිදුවිය.

මෙම මහෝත්සවයට සමගාමීව විද්‍යාලීය සමස්ත ගොඩනැගිලි පද්ධතිය ආසිරි ගැන්වීම, සිහිවටන ඵලකය විවෘත කිරීම හා විද්‍යාලීය නව වෙබ්අඩවිය විවෘත කිරීම ද එදින සිදුවිය. මෙයට ප්‍රැන්සිස්කන් නිකායේ ප්‍රාදේශාධිපති අතිගරු මාර්ක් ප්‍රනාන්දු පියතුමා, විදුහල්පති ගරු නිශාන්ත කුරේ පියතුමා, මීගමුව දළුවකොටුව ලොයොලා විදුහලේ ආරම්භක විදුහල්පති තිලකසිරි ප්‍රනාන්දු සහෝදරතුමා හා ලොයොලා නියෝජ්‍ය විදුහල්පති ගරු චන්න නිලංග සහෝදර තුමා හා විද්‍යාලයීය භාණ්ඩාගාරික මාලක ලෙනාඩ් ගරු පියතුමා ද ඇතුළු ගරු පියවරුන් රාශියක් ද, දෙමාපියන් ද සහභාගි වූහ. **(සටහන - ජෝ. සංගපාලආරච්චි, සේයාරූ - විද්‍යාලීය මාධ්‍ය අංශය)**

## මංගල සීනු හැඬවේ



වෙන්නප්පුව මීසමේ සා. ජෝශප් දහම් පාසලේ වසර 10 ක කාලයක් දහම් ගුරුවරියක වශයෙන් කටයුතු කළ රංදි නිසංසලා මෙනෙවිය පසුගියදා යුගදිවියට පිවිසුණාය. ඇයගේ අතගත් මනාලයා වූයේ වෙන්නප්පුව මීසමේ ශමීර ප්‍රනාන්දු ය.

දෙව්පුද මෙහෙය වෙන්නප්පුව සා. ජෝශප් දෙව්මැඳුරේදී පියතුමන් රැසකගේ සහභාගිත්වයෙන් පැවැතිණි. රංදි සහ ශමීර නව යුවළට ප්‍රදීපය ආසිරි! **(කේ. එස්. ප්‍රනාන්දු)**

## ගුවන් විදුලියෙන් නත්තල් බැති ගී තරගයක්

මේ වසරේ ද සිරිත් පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් විවෘත නත්තල් බැති ගී තරගයක් සංවිධානය කරයි. ඔබ කණ්ඩායමත් ඊට සහභාගි වීමට කැමැති නම් ඔක්තෝබර් 19 වෙනිදාට පෙර අයදුම්පත් ලේකම්, කිතුනු උපදේශක සභාව, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව කොළඹ 07 ලිපිනයට එවන්න.

## දහම් සේවියා දිවියෙන් සමුගනී

බෝලවත්ත මීසමේ ජනවන්දනා කටයුතු, දිව්‍ය හෘදය සමිතිය, වින්සන් ද පාවුලා සමිතිය, පවුල් උපදේශන සේවාව ඇතුළු ගිහිදූත සේවා සමිති කිහිපයක සාමාජිකත්වය දරමින්, මීසමටත්, පොදුවේ පදවියටත් අමිල මෙහෙවරක් කළ දහම් සේවියකු වූ ඩබ්. පීටර් නොලස්කෝ ප්‍රනාන්දු මහතා නොබෝදා දිවියෙන් සදහටම සමුගත්තේ ය.

මිය යන විට 87 වැනි වියේ පසුවූ ඒ මහතා විශ්‍රාමලත් ගුරු මහතෙකි. බෝලවත්ත මහා විද්‍යාලයේ ප්‍රාථමික අධ්‍යාපනය ලබා මීගමුව මාරිස්ටෙලා විද්‍යාලයෙන් අධ්‍යාපනය නිමාකර 1944 වර්ෂයේ දී යාපනය සා. ජෝශප් ගුරු විද්‍යාලයට ඇතුළත් වී ආචාර්යවරයකුවශයෙන් සේවයට පිවිස බම්බලපිටිය ශු. පවුලේ බාලිකා විද්‍යාලය, මොරටුව සා. සෙබස්තියන් විද්‍යාලය සහ මීගමුවේ මාරිස්ටෙල්ලා විද්‍යාලයේ සේවය කර වසර 40 ක ගුරු සේවයක් සම්පූර්ණ කර ඇත.

1971 වර්ෂයේ පවුල් උපදේශක සේවයට පිවිස වසර ගණනාවක් එම සේවය ද කර ඇති අතර මරිය හමුදාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු වන මොහු හලාවත පදවිය තුළ මරිය හමුදා සමිති ගණනාවක් ආරම්භ කිරීමට දායක වී ඇත. පදවි ශාසන සේවක මණ්ඩලයේ ද, හිටපු උප සභාපතිවරයකු වන මොහු කතෝලික සංගමයේ සාමාජිකත්වය හා ධර්මදූත කොමිෂන් සභාවේ 1969 සිට බෝලවත්ත නියෝජිත ලෙසද සේවය කර ඇත. බෝලවත්ත වින්සන් ද පාවුලා සමිතියේ ආරම්භක සභාපති ලෙස හා බෝලවත්තේ ගායනා කණ්ඩායමේ ආරම්භක ප්‍රධාන ඕගන් වාදක ලෙසද සේවය කර ඇත. මේ අනුව සභාවට අමිල දායකත්වයක් දී ඇති ඩබ්. පීටර් නොලස්කෝ ප්‍රනාන්දු මහතාගේ ආත්මයට දෙවිඳුන් තුළ නිත්‍ය සැනසීම අත්වේවායි පතමු. **(කේ. නිහාල් ප්‍රනාන්දු)**

## යහපත් සමාජයකට ගුරු සිසු කැපවීම අවශ්‍යයි.

පාසල් දූ දරුවන්ගේ ජීවිතයට ආලෝකයක් ලබාදී, අනාගතයේදී ඔවුන් යහපත් පුරවැසියන් ලෙස සමාජයට බාරදීම, කිතුනු ගුරුවරුන් වශයෙන් ඔබට පැවරෙන භාරධූර කටයුත්තක් මෙන්ම වගකීමයි. සිසු දරුවන්ට ඔබ ලබා දෙන අධ්‍යාපනය යහපත් අතට පත් වුවහොත්, ඉදිරි සමාජයට දරුවා හොඳ විද්‍යාඥයෙක් විය හැකිය. එය අයහපත් අතට පත්වුව හොත්, ඔහු සමාජය විනාශ කරන පුද්ගලයෙක් බවට පත්වනු නිසැකය. කිතුනු ගුරුවරුන් වශයෙන් ඔබ වෙතින් ඉටුවන සේවය දෙවිපියාණන් වහන්සේට ප්‍රසන්න වනවිට, ඔබට දේව ශක්තිය නො-අඩුව ලැබෙනු නිසැකය. එමෙන්ම ආදර දරුවනී, පාසල් දරු දැරියන් ලෙස ඔබගේ වටිනා කාලය අධ්‍යාපනය සඳහා යොමු කරන්න. පාසල් කාලය තුලදී ඔබගේ ගුරුවර ගුරුවරියන් ඔබ වෙනුවෙන් කැපවීමෙන් ලබා දෙන සේවයේ නියම ප්‍රයෝජන ගැනීම ඔබ සතු වගකීමයි. ඒ නිසා ඔබේ අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන සමාජයේ යහපත් පුරවැසියෙක් වීමට සිතා ගන්න. ඔබ වෙනුවෙන් වෙහෙසෙන ඔබේ ගුරුවරුන්ට ගෞරවය, ආදරය දක්වන්න. ඔවුන්ගේ සේවය අගයන දරුවන් ලෙස සාරධර්ම පිරි සමාජයක් ගොඩනගන්නට ඔබත් උත්සහ දරන විට දෙවිඳු ආසිරි ඔබ හට බහුලව ලැබෙනු ඇතැයි ගරු තුසිත් ප්‍රදීප් ප්‍රනාන්දු පියතුමා පැවසීය.

එතුමා එසේ පැවසූවේ ගුරු දිනය නිමිත්තෙන් පසුගියදා දියලගොඩ සාන්ත සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව් මැඳුරේදී පැවැති දේව මෙහෙයේදීය. කිතුනු ගුරුවරුන් විසින් මෙම දේව මෙහෙය සංවිධානය කරන ලදී. **(ඩී. ඇන්සලම් ප්‍රනාන්දු)**

## සමාජ සේවා වැඩමුළුවකට එක්වේ



ආසියානුවන්ගේ සුභ සාධනය සහ අධ්‍යාපනය සඳහා වූ ජපාන පදනම මගින් සංවිධානය කළ ජාත්‍යන්තර සමාජ සේවා අධ්‍යයන වැඩමුළුව මෙවරද ජපානයේ ටෝකියෝ සහ කියෝතෝ නගර වලදී පැවැත්විණි. මේ වැඩමුළුවට ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ජා-ඇල බටගම පදිංචි බැතිමත් කතෝලිකයකු වන සුධීර පෙරමුණ මහතාද සහභාගි විය.